**<u>වර්ෂ 2026.01.02 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-</u>**

**<u>සභාපතිතුමා මුලසුන ගැනිම</u>** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාව පෙ.ව. 9.30 ට ආරම්භ කරන ලදී. මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමියන්ලා සහභාගි විය.

| අනු අංකය | තනතුර | පක්ෂය | නම |
|---|---|---|---|
| 1. | ගරු සභාපති | ජා.ජ.බ. | එම්. විකසිත පුෂ්පසූරිය මහතා |
| 2. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා |
| 3. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ඩී.කේ. පී. කුමාර ජයනෙත්ති මහතා |
| 4. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඩී.ජී. ජස්ටින් රණවීර මහතා |
| 5. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඒ. දමින්ද නලින් අදිකාරම් මහතා |
| 6. | ගරු ප්‍රා.ස.ම. | ප්‍රජා.වාමාංශික | එච්.එම්. සිසිර සේනාරත්න මහතා |
| 7. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | අජිත් නන්දසිරි මනම්පේරි මහතා |
| 8. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ | කේ.වී.ආර්.ධර්මසිරි මහතා |
| 9. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා |
| 10. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | කේ.කේ. දුමින්ද කසුන් අමරසිංහ මහතා |
| 11. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ජී. සිරිල් කරුණාරත්න මහතා |
| 12. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඩබ්.ජයරත්න මහතා |
| 13. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | එම්. ඩග්ලස් ප්‍රේමදාස මහතා |
| 14. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඩී. ආශා සමන්කුමාරි මිය |
| 15. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ටී.එම්. උමේෂා මල්කාන්ති මිය |
| 16. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා |
| 17. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා |
| 18. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.එම්. ජයසේකර මහතා |
| 19. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඩී.ඒ. මොහාන් චන්දික අමරසේන මහතා |
| 20. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඒ. ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා |
| 21. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ඩී. චූලා ශාන්ති මිය |
| 22. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ | ඉරෝෂා උදයංගනී විජේසිංහ |
| 23. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඒ. සෂිකලා මදුභාෂිනී මිය |
| 24. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -1 | අයි. මංගල කිත්සිරි ඩයස් මහතා |
| 25. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -1 | ඩී.එච්.හරිසිංහ මහතා |
| 26. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි මිය |
| 27. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ආර්.එල්. එන් මල්කාන්ති ලියනගේ |
| 28. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | බී.ඒ. එස්.පී. කැලුම් ශ්‍රී ධර්මදාස මහතා |
| 29. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්කේ.විජේසිරි මහතා. |
| 30. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | ජී.ඒ.ර්. රනිල් එදිරිසිංහ මහතා |
| 31. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | ඒ. නයනා ජීවනී අතුකෝරළ මිය |
| 32. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.පී. රොෂාන් මධුසංක දේශප්‍රිය මහතා |
| 33. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්.ජී. එම්.නිරෝෂණ නාපාවල මහතා |
| 34. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.මහින්ද ගුණසිංහ මහතා |
| 35. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඒ. දේවින්ද කුමාර් මහතා |
| 36. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | සතා සිවම් චන්ද්‍රකුමාර් මහතා |
| 37. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | අනිල් ජගත් කුමාර ලියනගේ මහතා |
| 38. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එච්. තනූජා දීපානි චන්ද්‍රකා මිය |
| 39. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | පී.වී. සුදර්ශන සම්පත් බොතේජු මහතා |
| 40. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එල්. සුධීරා සේමිනි ලියනගේ |
| 41. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්. ප්‍රේමරත්න මල්කැකුල මහතා |
| 42. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එච්.වී. මහින්ද මහතා |
| 43. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ටී. ඒ. රංගන විජේසුන්දර මහතා |
| 44. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයාවතී මිය |

**01.පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.**

1. 2025. 12.16 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා -

2025.12.16 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා:-

2025.12.16 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමේ යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසු 2025.12.16 වන දින මහ සභා වාර්තාව පහත සංශෝධනයන්ට යටත්ව ඒකමතිකව මහාසභා සම්මත විය.

සංශෝධන

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා:-

**අංක 19 පිටුවේ බටහිර දොඩම්පේ පුරන් උන කුඹුරු 78 ක් ලෙස සඳහන් විය යුතුයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා:-

**අංක 14 පිටුවේ මඩල හංදියේ ඔරු අගුල අළුත්වැඩියා කරමින් පවතිද්දී නෙවෙයි අළුත්වැඩියාව සඳහා පරීක්ෂා කළාටද පසුවයි ගංවතුර ආවේ. ලෙස සඳහන් විය යුතුයි.**

**එසේම ග්‍රාම සංවර්ධන නිලධාරී දැනුවත්කර කොට්ඨාශයේ ග්‍රාම සංවර්ධන සමිතියෙන් අළුත්වැඩියාවට ප්‍රතිපාදන ලබාගැනීමට අදහස්කර තිබුනේ. ලෙස සඳහන් විය යුතුයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා:-

**11 පිටුවේ නඩුකාරදෙනියේ විහාරස්ථානයේ පූජ්‍ය ලියන්වල විමලරතන හිමියෝ ගම්වැසියෝ හා ස්වේච්ඡා ආයතන එක්ව ආපදා සලාක ආධාර ගම්වැසියන්ට දුන්නා ලෙස සඳහන් විය යුතුයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා:-

**3 පිටුවේ සංදේශ පෙත්සම් යටතේ ජීවත්වීමට නිවසක් ඉල්ලා සිටීමේ ලිපිය ඉදිරිපත් කලේ ඒ. ලීලාවති මිය නොව ඒ. ලීලාමනි මිය ලෙස සඳහන් විය යුතුයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා-

**57 පිටුවේ කොස්ගල විද්‍යාලය අසල මාර්ගය සංවර්ධනය කළත් කලින් තිබුණ ගැප් දෙක අයින් කරලා. ඒ නිසා අනතුරුදායකයි. ඒවා නැවත යොදන්න ලෙස සඳහන් විය යුතුයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න මහතා:-

**30** පිටුවේ **2017** නාය ගිහින් අවතැන් අයට මාටුවාගලින් ඉඩම් දුන්නා. ඒ දිපු කොටසේ තව ඉතිරිව තියෙනවා. ඒ ඉඩම් මේ අවස්ථාවේ ආපදාවට පත්වුන අයට දෙන්න පුළුවන්. ලෙස සඳහන් විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා:-

අංක 22 පිටුවේ යෝජනා අංක 06-06 හි අදහස් දැක්වීමේදී වටප්පිටිය කඳුදෙක මැදින් ගලා එන වතුර පාර නොව පරකඩුව කනිෂ්ඨ විද්‍යාලයේ දෙස සිට ගලා එන වතුර පාර ලෙස සඳහන් විය යුතුයි.

**02.** ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කල නිවේදන -

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

1. ස්වාභාවික ව්‍යසන හමුවේ ජන ජීවිතය යථාවත් කිරීමට පියවර ගැනීම යටතේ පළාත් පාලන කොමසාරිස් විසින් යොමු කර ඇති ලිපිය අනුව අපි මේ බල ප්‍රදේශයේ ආපදා තත්වයට පත්වූ මාර්ග, පැති බැමි, බෝක්කු ප්‍රතිසංස්කරණයට අදාල බිල්පත් හා අනතුරු ගස් ඉවත් කිරීමට අදාල බිල්පත් ප්‍රතිපාදන ලබාගැනීමට යොමු කළා. ඒ පිළිබඳව විස්තර ඉදිරිපත් කර තියෙනවා. වැඩි විස්තර අවශය වෙනම් ලබාදෙන්න පුළුවන්. එසේම තව දුරටත් අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට මැදිහත් වෙනවා. අපි වෙනත් ප්‍රදේශ වල විපතට පත් උන සහෝදර ජනතාව වෙනුවෙන් උපකාර කිරීමට අපි ජනතාවත් සමග මන්ත්‍රීතුමන්ලා සමඟ ගියා. කෑගල්ල, මාවනැල්ල ප්‍රදේශ වල ගොවි ජනතාවට අහිමිඋන කැඩී බිඳී ගිය ඇළවේලි, ප්‍රතිසංස්කරණයට මාර්ග ප්‍රතිසංස්කරණයට පිරිස එක්ක ගියා. කුරුවිටින් අපි 70 ක් විතර ගියා. ඒ කටයුතු වලට අවශ්‍ය උපකරණත් අරන් අපි ඒ ජනතාවට අවශ්‍ය යම් යම් ද්‍රව්‍ය ආධාර ලෙස ලබාදීමට එකතු කරන් ගියා. අවතැන් කඳවුරු වල ඉන්න ජනතාවගේ මානසික තත්වය ඉහළ දැමීමට අපි සංස්කෘතික අංග සූදානම් කළා. ප්‍රවීන ගායක ගායිකාවන් සම්බන්ධ කරගෙන ඒ අයත් එක්ක කටයුතු කළා. ඒ කඳවුරුවල අයත් සක්‍රියව ඒ සඳහා කැමැත්තෙන් සහභාගී උනා. දින තුනක් පමණ අපි කඳවුරේ රැඳී සිටිමින් සේවයක් ලබා දුන්නා. බදුල්ලේ කන්දකැටිය සභාවේ ඉල්ලීම අනුව අපි එහි ගියා. එතන ඇළවේලි, පාසැල්, වියලුව මහා විද්‍යාලය ප්‍රතිසංස්කරණය කළා. කන්දකැටිය බෝගහකුඹුර හා අවට ඇළ වේලි ප්‍රතිසංස්කරණය කළා. දින දෙකක් ඒ කටයුත්තට දායක උනා.
2. ඉඩම් වෙන්දේසි හා පොදු ඉඩම් පිළිබඳව 2017 සිට තොරතුරු ඉදිරිපත්කරලා තියෙනවා. මේ පිළිබඳ වැඩිදුර විස්තර අවශ්‍ය අයට ලබාගන්න පුළුවන්. පසුගිය සභා වාරයක මේ විස්තර පිළිබඳව කතා උනා.

**03.** සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා විසින් මෙදින ගරු සභාවට රංගනාත් ගහබඩගේ මන්ත්‍රීතුමා අසනීප විම මත මහා සභාවට සහභාගීවිමට නොහැකිබව දන්වා ඇති අතර නිවාඩු ලබාදෙනලෙස යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් ස්ථිර කරන ලදී. එසේම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා විසින් මෙදින ගරු සභාවට මහින්ද ජයලාල් මන්ත්‍රීතුමා අසනීප විම මත මහා සභාවට සහභාගීවිමට නොහැකිබව දන්වා ඇති අතර නිවාඩු ලබාදෙනලෙස යෝජනා කල අතර ගරු

ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව මතය විමසීමෙන් අනතුරුව රංගනාත් ගහබඩගේ මන්ත්‍රීතුමා හට හා මහින්ද ජයලාල් මන්ත්‍රීතුමා හට නිවාඩු සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.

**04.** ප්‍රාදේශීය සභාව අමතා එවනලද සංදේශ ,පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරීම.

**1.** මෙම අවස්ථාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා විසින් මදුරුවන් ගොඩැල්ල වළඳුර පදිංචි ඩබ්.ඩී.කරුණාවති මිය විසින් මාර්ගයේ ජලය බැසයාමට බෝක්කු දෙකක් ඉල්ලාසිටීම පිලිබඳ ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී. මේ සම්බන්ධව තොරතුරු ගෙන අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා යොමුකරනලදී.

**2.** මෙම අවස්ථාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා විසින් ඉදිරිපත්කල **148** පොහොරබාව හැඩවකදෙනිය සම්බන්ධ කෙරෙන මාර්ගයපිලිසකර කරගැනිම පිලිබඳව ජනතාවගේ අත්සන් තිහක් සහිතව යොමු කර ඇති ලිපිය සභාගත කරන ලදි. මේ සම්බන්ධව තොරතුරු ගෙන අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා යොමුකරනලදී.

**3.** මෙම අවස්ථාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා විසින් ඉදිරිපත්කල ආපදා සහන යටතේ ලබාදුන් ආධාර මුදල් නොලැබුන හයදෙනෙකු පිලිබද විස්තරය සහිත ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදි. මේ සම්බන්ධව තොරතුරු ගෙන අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා යොමුකරනලදී.

**4.** මෙම අවස්ථාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් ඉදිරිපත්කල වරිපනම් බදු විරෝධතාවක් පිලිබද එම්.ඩී.නන්දකුමාර මහතා විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදි. මේ සම්බන්ධව තොරතුරු ගෙන අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා යොමුකරනලදී.

**05.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

**06.** යථා පරිදි කල් දී ඇති යෝජනා

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-01.** කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කුරුවිට නගරයේ සම්මන්ත්‍රණශාලාව, සභාවට ආදායම් ලැබෙන අයුරින්, සංවර්ධනයකර පවත්වාගෙන යාමට ආයෝජකයෙකු තෝරාගැනීම සඳහා සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස්කිරීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

මෙම අවස්ථාවේදී ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා විසින් මෙම යෝජනාවට සංශෝධනයක් සිදුකිරිමට සහා එකඟතාවය විමසූ අතර සභා එකඟතාවය අනුව ඉහත යෝජනාව, කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කුරුවිට නගරයේ සම්මන්ත්‍රණශාලාව සහ කිරිඇල්ල පොදු නව වෙළඳ සංකීර්ණයේ උඩු මහළ සභාවට ආදායම් ලැබෙන අයුරින්, සංවර්ධනයකර පවත්වාගෙන යාමට ආයෝජකයෙකු තෝරාගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස්කිරීමට යෝජනා කරමි, ලෙස සංශෝධනය කර ඉදිරිපත්කළ අතර එම සංශෝධිත යෝජනාව ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කුරුවිට නගරයේ සම්මන්ත්‍රණශාලාව සම්බන්ධව ආයෝජකයෙක් කතා කළා. සිනමා ශාලා කරන සිනෙවිල් පුද්ගලික ආයතනයෙන්. අපි කිව්වා මේ සම්බන්ධව සාකච්ජා කරගන්න දිනයක් දාගෙන එන්න කියලා. අපි කතාකරන්න යොදාගත්ත දිනයේ එතුමා අසනීප වෙලා රෝහල් ගත කරලා. නැවත දිනයක් දාගෙන කතා කරමු. ඒ ආයතනය විතරක් නෙවෙයි මේ කාරණය සම්බන්ධව තව දුරටත් ආයෝජනය කලහැකි අය ඉන්නවානම් සුදුසු කාර්ය මොකක්ද කියලා තෝරාගෙන ඉල්ලීම් ගමු. ඒ ගන්න සියළු යෝජනා අතරින් මේ ප්‍රදේශයට වඩා ගැලපෙන කාරණය මොකක්ද ? වැඩි ප්‍රතිලාභ ලැබෙන යෝජනාව මොකක්ද? ආදිය සලකලා බලලා මේ සම්මන්ත්‍රණ ශාලාව හා කිරිඇල්ල වෙළඳ සංකීර්ණයේ උඩු මහළ සභාවට ආදායම් ලැබෙන අයුරින් කටයුතු කරමු කියලා යෝජනා කරනවා ඒ සඳහා සුදුසු ක්‍රමයක් සකසා ගන්න. විවෘත ක්‍රමවේදයකට යෝජනා ගමු. අපේ ප්‍රෙද්ශයෙන් පිට ආයෝජකයන්ගෙනුත් ගමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා -</u>

රත්නපුර මහ නගර සභාවේ ඉහළ මහලේ උත්සව, විවිධ නාට්‍ය, ආදිය කටයුතු සඳහා ලබා දෙනවා. මේ ස්ථානයත් ඒ විධිහට ආයෝජකයින්ට දුන්නොත් සභාවට ආදායම් ගන්න පුළුවන්. ජනතාවගේ කටයුතු වලට උත්සවශාලා ආදිය ලබා ගැනීමේදි මිළ ගනන් ඉහළයි. අහිංසක දුප්පත් ජනතාවට විශාල සේවයක් වෙනවා සහනදායි මුදලකට මේ ශාලා ලබාදීම තුලින්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -</u>

2026 සියළු දෙනාට සුභ නව වසරක් වේවා කියලා පතනවා. සම්මන්ත්‍රණ ශාලාව ඔය තත්වයෙන් හෝ ඉදිකිරිමට හිටපු සභාපතිතුමා වෙහෙස ගත්තා. ආයෝජනය සඳහා ඉතිරි කල දෙයක්. අපිත් මේක මතුවට ඵලදායි ලෙස ගතහැකි ලෙස පවත්වාගමු. නමුත් මේ ශාලාව සිනමා ශාලාවකට දුන්නොත් ඒ අය ඵලයක් ගනියි. අපිට වත්කමක් නැතිව යනවා. පළාත් සභාවෙන් ප්‍රතිපාදන අරන් හරි සම්මන්ත්‍රණශාලාවක් ලෙස මේක පවත්වාගෙන ගියොත් ඒක අපිට ආපහු ලැබෙනවා. ඒක අපිට ඉදිරියට පිටුවහලක් වෙනවා. මම නම් හිතන්නේ ඒක සංවර්ධනය කරලා සම්මන්ත්‍රණශාලාවක් ලෙසම පවත්වාගෙන ගියොත් හොඳයි. නිතර අවශ්‍ය වෙන ස්ථානයක්. සමුපකාරයේත් තියෙන්නේ කුඩා එකක්. විශාල පිරිසකට මදි . අපි රැස්වීමක් තියන්නත් ප්‍රාදේශීය ලේකම් එකට යනවා. අපිට තැනක් තිබිය යුතුයි. නමුත්

නිශ්චිතව තැනක් තවම නෑ. සම්මන්ත්‍රණශාලාවක් ලෙස මේ ස්ථානය පවත්වාගෙන ගියොත් තව වසර පහක් යනකොට ඒක ප්‍රචලිත වෙනවා. පිරිස වැඩියෙන් රැස් වෙයි. පළාත් සභාවේ ආධාරයත් ඇතිව මේ ගොඩනැගිල්ල සම්මන්ත්‍රණශාලාවක් ලෙස වැඩිදියුණු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

ගරු සභාපතිතුමා අදහස් දැක්වූවා මේ ස්ථානය පිළිබඳව සිනමා ශාලා පවත්වන ආයතනයක් උනන්දු වෙන බවට. නමුත් මේ ස්ථානය කිසිම නිර්මාණාත්මක බවක් නෑ. රත්නපුර නගර සභාවේ ඒ ඉදිකිරීම යම් පෞඩත්වයක් තියෙනවා. මේක නිකම් නගරයේ අනිත් ගොඩනැගිල්ලේ දෙක වගෙයි. පෙට්ටි වගේ. පිටවෙන්න තැනක් නෑ. වැසිකිළි නෑ. ඒ වගේම පිපිරීම් තියෙනවා. නගරයට අවශ්‍ය නිර්මාණ ශීලී ඉදිකිරීම්. නිළධාරීන් තරහා වෙන්න එපා. ඒ අය එකතු වෙලා හදන්නේ පෙට්ටි ගෙවල්. කුරුවිටට අන්‍යතාවක් නෑ. අපි මේ ඉදිකිරීමට වියදම් කළ ප්‍රමාණයට සරිලන ඉදිකිරීමක් වෙලා නෑ. ඉංජිනේරු මහතාට දැනුම්දීලා මේ ගොඩනැගිල්ල පරික්ෂා කරවන්න. මට මතක ලෙස මේ ස්ලැබ් එක දැම්මේ වහලය ගහන්න මුදල් මදි උන නිසා. ඒ නිසා මේක සුදුසු තත්වයෙන් තියෙනවාද කියලා හොයලා බලලා ඇස්තමේන්තු පිඹුර සැළසුම් ආදිය බලලා කටයුතු කරන්න. නැත්නම් ගැටළු එයි. ශක්තිය මදි නම් කණු දාලා ක්‍රමවේදයක් අනුව කරවන්න. නිර්මාණ දන්න කෙනෙකුට කියලා අවම ඉදිරිපසවත් අපිට අන්‍යය ලෙස සකසන්න. විකසිත සභාපතිතුමාගේ කාලේ කළ හොඳ දෙයක් විධිහට මතක හිටියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -

මංගල මන්ත්‍රීතුමා කිව්වා වගේ මේ ශාලාව පෙනුම නම් අඩුයි. මාත් කියනවා මේ ගොඩනැගිල්ල ටිකිරි කොබ්බැකඩුව ආණ්ඩුකාරතුමාගේ කාලේ විවෘත කළා. ඒ හින්දා ආයේ මේක නැවත විවෘත කිරීම් නැතිව මේකේ කටයුතු නිම කරන්න. ඒ විවෘත කරන දවස වෙන කොට මේ ඉදිකිරීම භාගයක් වත් නිම කරලා තිබුනේ නෑ. බොරු වැඩක් කලේ. අඩුපාඩු බලලා මේ කටයුත්ත කරන්න. මේ ඉදිකිරීමේ තත්වය ශක්තිය පිටින් අය ගෙන්වලා හරි බලවන්න. මේක කටයුතු නිම කලොත් හොඳ ආයෝජනයක්. හදිසියකට තියෙන්නේ සමුපකාර ශාලාව විතරයි. මේ නගරය විවේකයේ නගරය. ලස්සන නගරයක් කරමු. නමුත් විවේකයක් නෑ. ගස් ටික තිබුණා. එතනත් වෙළෙන්දෝ . මූලික අරමුණ උනේ නගර සංවර්ධනයේ හැම පැත්තෙන්ම එන ජනතාවට විවේකයේ හොඳ නැවතුම්පලක්. තේඑකක් බොන්න. පළාත් සභා මුදල් හරි අරන් මේ කටයුත්ත නිම කරමු. නගරයේ මිරිස්මෝල තියෙන තැනටත් නඩුවක්. ඒකත් තාම විසඳලා නෑ. ඒ වගේම නගරයට වතුර නෑ. එකපැත්තකට නෑ. මෝටරයක් අළුතෙන් ගෙනත් හරි ඒ කටයුතු කරන්න. මේ වසර කුරුවිටට වැඩකරන වසරක් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

සියළු දෙනාට නව වසරට සුභ පතනවා. මේ යෝජනාව කුරුවිට නගරයේ සම්මන්ත්‍රණශාලාව ත් පිලිබඳව. පසුගිය වසරේ මේක අළුත්වැඩියා කරන්න තිබුණ මුදල් තමා ගිය වසරේ වැය

මාරුව කලේ. වැය මාරු කරනවා. ආයේ යෝජනාව දානවා. මහජනතාවට සේවය විය යුතු රාජ්‍ය ආයතනයක් ලෙස ජනතාවගේ සේවය සඳහා ඉදිකළ එකක්. ආයෝජකයින් එනවා නම් හොඳයි. නමුත් ඒ සඳහා අපේ පරමාර්ථ දැන සිටිය යුතුයි. මම නම් හිතන්නේ මේ ස්ථානය සිනමා ශාලාවක් කිරීම ජාතික අපරාධයක්. නගරයේ තිබුන එකත් අසාර්ථක උනා. සිනමාව මේ වන විට ලංකාවේත් අසාර්ථකයි. මේ කටයුත්ත පිටුපස තව අරක්කු තැබෑරුම් ඇති. ඒ හින්දා කුරුවිටට තවත් අරක්කු තැබෑරුම් නම් එපා. අපේ දරුවන්ට නැණ නුවන පාදන හොඳ ගුරුවරයෙක් හොයලා පුද්ගලික පන්තියකට දීම වැදගත්. ඒ ලෙස කලොත් සාපේක්ෂව ආදායම් අඩු වෙයි. ඒත් යහපත් සමාජයක් බිහිවෙයි. අපි කරන යෝජනා සාර්ථක විය යුතු නමුත් ඒ තුලින් ජනතාවට අපේක්ෂා කරන සේවය ලැබිය යුතුයි. මම පුන පුනා ඉල්ලන්නේ තවත් අරක්කු බාර් දමන්න නම් සිනමා ශාලා එපා. මේ ප්‍රෙද්ශය ප්‍රසිද්ධ මැණික් වලට. ස්වර්ණාභරණ අධිකාරිය සමඟ එකතු වෙලා අපිට පුළුවන් මැණික් ප්‍රදර්ශන ආදිය පවත්වන්න. සංචාරකයෝ තවත් ඇදිලා එයි. ඒ හින්දා මේ ස්ථානයට ආයෝජකයෙක් තෝරණ කොට අපේ අනන්‍යතාවය රකිමින් ආයෝජනයක් කරන්න ආයෝජකයෙක් තෝරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ඩබ්. ජයරත්න මහතා -</u>

සියළු දෙනාට සුභ නව වසරක් ප්‍රාර්තනා කරනවා. ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා මේ ඉදිකිරීමේ තාක්ෂණික අඩුපාඩු තියේද කියලා. ඒ පිලිබඳව සළකා බැලිය යුතුයි. පළාත් සභාවේ ඉංජිනේරු වරයා මගින් ඒ ඇස්තමේන්තු ප්ලෑන් ආදිය බලලා පරීක්ෂනයක් කරවමු. ඒ අනුව යම් අඩුපාඩු ඇත්නම් නිවැරදි කරගමු. ඒ කරුණ වැදගත්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා -</u>

සියළු දෙනාට සුභ නව වසරක් ප්‍රාර්තනා කරනවා. මේ ජනතාව වෙනුවෙන් කළ ඉල්ලීමක්. අද ඉදිරිපත් කිරිම ගැන ස්තුතියි. සම්මන්ත්‍රණ ශාලාව ගැන විවිධ මත තියෙනවා. එය සාදා නිම කිරිම පිලිබඳව මේ සභා වාරයේ පළමු යෝජනාව වැදගත්. මංගල මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා එම ඉදිකිරීමේ පෞරාණිකත්වය ආරක්ෂා උනාද? මාත් අනුමත කරනවා. බස්නැවතුමේ තියෙන බිල්ඩිමපිලිබඳව සමහරුන්ගේ මතය ඒක හිරගෙයක් වගේළු.සැළසුම් ආදිය . නගරයට ජනතාවට පෞරාණික අගය වැඩිවෙන ලෙස නිර්මාණය කරමු. මේ කටයුත්තය වත්මන් මුදල් තත්වය සමඟ යම් ගැටළුවක් තියෙනවා. ඒ නිසා මේ සම්බන්ධව කටයුතු කිරිමට ආයෝජකයෙක් අවශ්‍යයි. සම්මන්ත්‍රණ ශාලාව හොඳයි කියලා මාත් කියනවා. නමුත් සම්මන්ත්‍රණශාලාවකට විශාල පිරිසක් එකතු වෙනවා. අවශ්‍ය පහසුක්ම සැලසිය යුතුයි. අරක්කු නැතිව සිනමා ශාලාවක් කරන්න පුළුවන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>

කුරුවිටට බාර් ඇති.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ කටයුත්ත පිටුපස බාර් නෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා -</u>

ඒ ආයෝජකයින්ට කතා කරලා ආයෝජනය කරලා සිනමා ශාලාව අවශ්‍ය විටෙක සම්මන්ත්‍රණශාලාවක් ලෙස ගත හැකි ලෙස කරමු. දියුණු කල යුතුයි. විශේෂයෙන් කුරුවිට

නගරය දියුණු විය යුතුයි. මේ නගරයේ දියුණුව කුරුවිට ප්‍රාදේශීය සභාව පිලිබඳ මිණුම් දණ්ඩක්. වසර ගානක් වහලා නැතිව තිබුණ වලවල් කුරුවිට බස් නැවතුමේ. අපි මැදිහත් වෙලා මුදල් අරන් කොටසක් කාපට් යොදා සකස් කලා. වෙළඳ සංකීර්ණය වටේත් වලවල් කාපට් කරන්න යෝජනා කලා. අපි එකතු වෙලා අළුත් නගරයක් ලෙස නිර්මාණය කරමු. කුරුවිට නගරය දැක්කාම සභාව වැඩකරන බව ජේනවා. සහාය දෙන්න. ගිය සතියේ ලේකම් මහතාටත් මම මේ ගැන කිව්වා ලොරි රථ ගාලේ වෙළඳ පිරිස රත්නාලෝක මුදලාලිගේ කීප දෙනෙක් හා පෙරකදෝරුවෙක් ඇවිත් කිව්වාළු ඒ අයට ඒ ඉඩම අයිති උනා කියලා. මම විස්තර හෙව්වා. දැන් ජනතාව හිතනවා ඒක රත්නාලෝක මුදලාලිගේ කියලා. කොහොම උනත් එතන සංවර්ධනයක් කරනවා නම් නගරයට ආවේනික විධිහට කරන්න යොමු කරවමු. නිර්මාණශීලීව කරන්න කියමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

2026 වසර සියළු දෙනාට සුභ පනතවා. සම්මන්ත්‍රණශාලාවේ කටයුතු සඳහා මුදල් තිබුණා ගියවර අයවැයෙන් වෙන් කරලා. නමුත් ඒ මුදල් වැය මාරු කරලා. ඊට පස්සේ මේකට මුදල් නෑ කියනවා. කෝටි පහ මුදල් ස්ථිර තැම්පතු ගත්තාද? ගත්තේ නැත්නම් අපිට විශාල මුදලක් තියෙනවා. ඒ මුදල් වලින් යම් කොටසක් අරන් අපිට කුරුවිට නගරයට හොඳ සම්මන්ත්‍රණ ශාලාවක් හැදුවාම සංස්කෘතික කටයුතු හෝ ටියුෂන් හෝ අවශ්‍ය කටයුතු ට දෙන්න පුළුවන්. මේ ගොඩනැගිල්ලට අන්වර්ත නම් කියනවා. මල්කැකුළ සභාපතිවරයාගේ කාලේ කලේ. දැන් දොස් කියලා වැඩක් නෑ. එදා සහාය දුන්නා ගොඩක්. අද සංස්කෘතික වටිනාකම් හෝ පෞඩත්වය ගැන කියලා වැඩක් නෑ. එදා සහාය දුන්නානේ. සභාවේ සම්මත කලානේ. මේක පුපුරලා ස්ථාන කීපයකින්. වහලයට මුදල් මදි නිසා ස්ලැබ් එක දැම්මේ. මේ බිල්ඩිම ඉංජිනේරු පරික්ෂාවට ලක් කරන්න. රැඳවුම් මුදල් ගෙවද්දි ගිය වසරේ විරුද්ධ උනේ ඒකයි. කොන්ත්‍රාත්කරුගෙන් අයකරගන්න. මේ කටයුත්ත අත්‍යවශ්‍ය දෙයක්. කැළුම් මන්ත්‍රීතුමා කිව්වා වගේ තවත් සභාවකට ඉඩ නොතියා පළමු මාස හය තුළ මේ කටයුත්ත කරමු. පාරවල් බෝක්කු අත්‍යවශ්‍ය කටයුතු විතරක් කරලා ඉන්න 46 ම යම් කැපකිරිමක් කරලා මේ ඉදිකිරීමේ අඩුපාඩු හදලා කුරුවිටට හොඳ ආදායම් මාර්ගයක් හදමු. 2026 පළමු මාස හය තුළ අඛන්ඩව මේ කටයුත්ත කරමු.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

අද මංගල මන්ත්‍රීතුමාගේත් යෝජනාවක් තියෙනවා. සම්මන්ත්‍රන ශාලාවක් පිලිබඳව.මේ යෝජනාව කුරුවිට වෙළඳ සංකීර්ණය උඩ තියෙන ශාලාව හා කිරිඇල්ල බිල්ඩිමේ උඩ කොටස ඒ දෙකම සභාව මැදිහත්වෙලා ආදායම් උත්පාදක මාර්ගයක් ලෙස වැඩිදියුණු කිරිමට යෝජනාව. මල්කැකුළ සභාපතිතුමාගේ කාලේ මේ බිල්ඩිම විවෘත කළා. මාත් කතාවක් කලා. එදා මේ ගොඩනැගිල්ල සෞන්දර්යාත්මක වින්දනයක් ලැබෙන ස්ථානයක් ලෙස පවත්වාගෙන යමු කිව්වා. සමහරු හිතනවා මේක උපකාරක පන්ති වලට දුන්නාම හරි කියලා. නමුත් ඒ කටයුතු වලට තැන් තියෙනවා. ඕනි තරම් තියෙනවා. මේක සම්මන්ත්‍රණශාලාවක්. සෞන්දර්යාත්මක මධ්‍යස්ථානයක්. කිරිඇල්ලෙත් ජනතාවට රැස් වෙන්න තැනක් නෑ. තියෙන එකම තැන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උඩු මහළ. ඒ නිසා මේ කටයුත්ත අත්‍යාවශ්‍ය කටයුත්තක්. අයෝජකයින් යොදාගත්තාට ගැටළුවක් නෑ. නමුත් සම්මුතියක් ඕනි. සභාවේ අනන්‍යතාවක් ආරක්ෂා විය යුතුයි. සභාවට අවශ්‍ය දේ ඉටුවිය

යුතුයි. ආයෝජකයින් එන්නේ තමන්ට ප්‍රතිලාභ බලාපොරොත්තුවයි. අයවැය වෙන්කළ මුදලෙන් මේ කටයුත්ත නිසි ලෙස කරන්න බෑ. ලිෆ්ට් , වැසිකිළි, වායු සමීකරණ, පිවිසුම්, තව අත්‍යාවශ්‍ය දේ බොහොමයි. අපේ වර්ෂා කාලය ගෙවුනාම තද හිරු රැස් තියෙන කාලසීමාවක් තියෙනවා. මම එකතුකරනවා යෝජනාවට අදහසක් මේ තත්වය මත ප්‍රාදේශීය සභාවේ මැදිහත්වීමෙන් ගොඩනැගිල්ලේ සෝලා පද්ධතියක් වහලය මත සවි කිරීම ඉතාම වැදගත් කියලා. මේ පරිසරයේ තියෙන විශාලම උඩු මහළ මේක. මේක උපයෝගි කරගෙන විදුලිබළ මණ්ඩලය එක්ක එකතු වෙලා මේ ස්ථාන දෙකටම ස්ථාපිත කරමු. විදුලියත් අරන් විශාල ඉතිරියක් කළ හැකියි. අඩුම තරමේ කෝටි දෙක හමාරක් වත් වැය කරන්න වෙයි මේ ගොඩනැගිලි වල අඩුපාඩු හදන්න ගෘහභාණ්ඩ නැතිව. මෙය සම්මන්ත්‍රණ ශාලාවක සේවාව දිමට අමතරව පරිබාහිරව ආදායම් ඉහල දැම්මට ක්‍රමවේදයක්. ඒ සඳහා අනුමැතිය ලබා දෙනවා. මත්පැන් අලෙවිහලක් ගැන මේ න්‍යාය පත්‍රෙය් නෑ. මත්පැන් වලට අවසරයක් මේකේ නෑ කියලා කොන්දේසියක් ඇතුල් කරමු. මත්පැන් අලෙවිසැල් සඳහා බදුකරුට සභාවේ අනුමැතියක් ඕනි. ඒවා අනුමත කරන්නේ නෑ. කිරිඇල්ල උඩු මහළත් සංවර්ධනය කරමු. සැළැස්මක් හදලා ඒවා විවෘත ආයෝජනයට විවිධ පාර්ශව වලට යොමු කරමු. මේ ස්ථාන දෙකේ තියෙන අවකාශ භාවිතා කරලා සෝලා සිස්ටම් එකක් ස්ථාපිත කිරීම සුදුසුයි. මේ කටයුත්ත සාර්ථකව කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -

ඉතා හොඳ යෝජනාවක්. ප්‍රදේශයට ප්‍රයෝජනයක් ගත හැකි දෙයක් නිකරුනේ තියෙනවා කියලා මතයක් තියෙනවා. නගරය පිලිබඳව ගරු මංගල මන්ත්‍රීතුමා , කපිල මන්ත්‍රීතුමා, අදහස් දැක්වූවා. මංගල මන්ත්‍රීතුමා, මේ නගරයේ ගොඩනැගිලි අමනුස්ස වාසයන් නම් ඒවායේ වෙළඳාම් කරන්න බෑ. ඔබතුමාගේ මතය හරි නම් ඒවායේ මිනිස්සුන්ට ව්‍යාපාර කරන්න බෑ. ඒක හොඳ තැනක්. මේක අවිධිමත් නගරයක්ව තිබුණේ. එදා ඒ විධිහට යම් සංවර්ධන කටයුතු කළ අයට ස්තුති කළ යුතුයි. භෞතික සැළසුම් දෙපාර්තමේන්තුව, සැළසුම් හදලා මුදල් දුන්නා අමාත්‍යංශයට කතා කරලා රැස්වීම් තියලා මතක්කළ යුතුයි. හොඳ නගරයක් හැදුවා. ඒ නිසා සේරම කටයුතු උනාට පස්සේ නරකයි කියන්න බෑ. එදා ඒ රැස්විමට මංගල මන්ත්‍රීතුමා ආවේ නෑ. ඒතුමා ආවානම් ඒ කියන විධිහට දිව්‍ය විමානයක් හදන්න තිබුණා. අනිත් අය ආවා. කව්රුත් දන්නවා මේ නගරය තිබුණ විධිහ. භෞතික සැළසුම් දෙපාර්තමේන්තුව එදාට ගැලපෙන ලෙස කලේ. ජනතාවට කඩ කාමර දුන්නා. මේ ස්ථානයේ අඩුපාඩු හදමු. ඉහළ මහලේ අඩුපාඩු හදමු. උදව් කරමු ඒවාට. අර සම්මන්ත්‍රණ ශාලාවට ගුවන් පාලමක් යෝජනා කරලා තිබුණා. ඒ කටයුතුත් බලන්න. පහළ මහලේ සාර්ථකව කරන කඩ ගැන කව්රුත් කියන්නේ නෑ. සම්මන්ත්‍රණශාලාවේ වැඩ නිම කරගන්න බැරිව ආණ්ඩුකාරතුමාටත් කිව්වා. ඒ කාලේ. එතුමාගේ නම දාලා හරි මේ කටයුතු කරමු කිව්වා අවංකව. නමුත් එතුමාව මුරුංගා අත්තේ තියන්න එපා කිව්වා. ඒ හින්දා මෙවර මේ වැඩ නිම කරමු. ජනතාවට මේ දේ සාර්ථකව ඉතිරි කරමු. අරක්කු තැබෑරුම් ගැන කියනවා. බිල්ලන් මවන්න එපා. ඒ දේ හොඳ නැත්නම් ඒවාට කව්රුත් යන්නේ නැතිව ඉන්න පුළුවන්. කුඩු හෙරොයින් මේ රටේ වැපිරිලා. ජනාධිපතිතුමා උත්සාහා කරනවා මේවා නවත්තන්න. ඒත් ඒවා නවත්තන්න බැරි තත්වෙට ගිහින්. පුස්සැල්ල පාරේ හැමතැනම රෑ දවල් වෙනසක්

නැතිව නගරේ වගේ මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිස්. මටනම් පුද්ගලිකව මත්පැන් ශාලාවක් දැමීම ප්‍රශ්නයක් නෑ. ගැලපෙන දෙයක් කරන්න. වෙනස් කරලා හරි ඵලදායී දෙයක් කරන්න. සිනමා ශාලාවක් විතරක් නෙමෙයි වෙන ආයෝජන අවස්තාත් සළකලා බලන්න. පන්ති දාලා අපිට ආදාම් ලැබෙනවා නම් හොඳයි. සහාය දෙනවා. නව වසරේ මේ කටයුත්ත බලාපොරොත්තු වෙන විධිහට ඉටුකරගන්න ලැබේවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා –</u>

මෙම යෝජනාව ස්ථිර කරමි. කුරුවිටට මේ ගොඩනැගිල්ල රංගශාලාවක් කරනවද? සිනමා ශාලාවක් කරනවද? උත්සව ශාලාවක් කරනවද? නැත්නම් ටියුෂන් පන්ති කරනවද කියන එක තීරණය කරන්න පෙර අපි කළ යුතු ප්‍රධාන දේවල් හඳුනා ගත යුතුව තියෙනවා. මීට පෙර අවස්ථා කීපයකදි කතා බහට ලක් උන කරුණක් මෙය. මේ වෙනුවෙන් මුදලුත් වෙන් උනා කිව්වා. නමුත් තවමත් කතාකර කර කාලය ශ්‍රමය වැය කරනවා විතරයි. මේ මාතෘකාවම කතාකර කර තවත් ඉදිරියට යාමෙන් සිදු වන්නේ ගරු සභාව කථා මණ්ඩපයක් වීම විතරයි. ගොඩනැගිල්ලක බාහිර පෙනුම වැදගත් වෙන්නේ ඇයි? මීට ඉහතදි ශ්‍රී ලංකාව කිව්වාම අපිට මුලින්ම මතක් වෙන්නේ සිගිරිය වගේ. නමුත් දැන් අයිකන් එකක් වගේ තියෙන්නේ නෙළුම් කුළුණ. එහි හැඩය පෙනුම නිසා එය ඉදිරියට ඇවිත් තියෙනවා. හොරු කියලා පන්නපු ආණ්ඩුව පාලකයෝ සිදුකළ වැඩ වල ප්‍රතිඵල ලෙස අද මේ ව්‍යාපෘති වලින් වාර්තාගත ආදායම් ලබනවා. ඒ ඉදිකිරීම්වල හැඩය හා නිමාව අනුව එසේ වෙලා. අපේ අරමුණක් ආයෝජකයෙකු හොයාගෙන මේ ගොඩනැගිල්ලේ වැඩ අවසන් කරලා ඔවුන්ට ලාභ උපයන්න ලබාදීම. ආයෝජකයෙක් හැම විටම බලන්නේ තමන්ගේ ලාභය මිසක් අපේ පැත්තෙන් නෙමේ. අපිට හොඳ ගොඩනැගිල්ලක් දිම ඔවුන්ගේ අරමුණු තුළ නෑ. ඔහුගේ අරමුණ ලාභය ඉපැයීම. ඒ සඳහා ඔවුන් මේ ගොඩනැගිල්ලෙන් බලාපොරොත්තු වෙන දේවලුත් ඇති. යටිතල පහසුකම්. ප්‍රේවිශ මාර්ග, පාර්කින්, ඒසී, සනීපාරක්ෂාව, ආදිය . එවිට මේ ආයෝජකයින් මේ ගොඩනැගිල්ල පිලිබඳව සළකා බලයි. අපි මෙහි 2000 කට 3000 කට ආසන පහසුකම් දෙනවා නම් වාහන පාර්කිං වෙන්කරදීම ඉතා වැදගත් වෙනවා. උප සභාපතිතුමා කිව්වා සූර්ය පැනල් ගැසීමක් සුදුසුයි කියලා රූප් ටොප් එකේ. මේ වන විට සූර්ය විදුලි උත්පාදනය වෙනුවෙන් ගෙවන මුදල අඩු කරලා. ඒ නිසා අපිට නියත ලාභයක් ගැන කිව නොහැකියි. මුලින් මේ සඳහා යුනිට් එකකට රු. 40 ක් වගේ මුදලක් ගෙවීම් කලත් මේ වන විට ඒක රු. 19 ක් 20 ක් වගේ අඩු කරලා. මට මතක විධිහට. ආරම්භක ප්‍රාග්ධනය වැඩි නිසා ඒකත් එක්ක අපිට ලාභයක් ලැබිය හැකිද කියලා ප්‍රශ්නයක්. නමුත් දිගුකාලීනව සැළැස්මක ආදායම් මාර්ගයකට මෙය හොඳයි. අදාල ආයතනය සමඟ එක්ව ලංකා විදුලිබල මණ්ඩලයෙන් මේ සම්බන්ධව වෙලා කටයුතු කළ යුතුයි. එසේම මේ ගොඩනැගිල්ලේ තාක්ෂනික දෝෂ තියෙන බව ඉරිතැලීම් තියෙන බව නිතර මේ සභාවේ කියැවුනා.මුලින්ම කළයුත්තේ මේ දෝෂ අදාල ආයතනමගින් හෝ නිවැරදි කර ගැනීමයි. නැත්නම් මේ කතා කිරීම නිෂ්පල දෙයක් විතරක් වෙනවා. මේ වන විට රජයෙන් කැළණිවැලි දුම්රිය මාර්ගය ඉදිකරන බවට ප්‍රකාශ කරනවා. නමුත් ඒවා වෙනවාද නොවෙනවාද දන්නේ නෑ. වෙනවා නම් අපි කැමතියි. කෙසේ උනත් ඒ මාර්ග හැදෙනවානම් මේ ගොඩනැගිල්ලට වන බලපෑම පිලිබඳ සිතිය යුතුයි. තාක්ෂණික දෝෂ නිවැරදි කරලා, ප්‍රවේශ මාර්ග, පාකිං වගේම දුම්රිය

ගමනාගමනයේදි වන දෙදරීමට මේ ගොඩනැගිල්ල ඔරොත්තු දෙයිද? සියල්ල විසඳාගත යුතුයි. යම් සංවර්ධන යෝජනාවකට අකුල් හෙලනවා නෙමෙයි. කතා මණ්ඩපයක්ම විතරක් නොවී සාර්ථක ව්‍යාපාරයක් බවට පත්කිරීමට කටයුතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -</u>

මේ ගොඩනැගිල්ල හදලා තියෙන්නේ දුම්රිය පාරට ඉඩ තියලා. ගැටළුවක් නෑ. ඒ සඳහා අවශ්‍ය ඉඩපහසුකම් වෙන් කරලා තියෙන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

දුම්රිය ආවොත් පිපිරීම් නම් ප්‍රශ්නයක් වෙනවා. ඒවා තවත් වැඩිවෙයි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අදහස් විශාල ප්‍රමාණයක් දැක්වුණා. සළකා බළලා සුදුසු දේ කරමු. අඩුපාඩු හදාගෙන අවශ්‍ය වෙනස් කිරීම් කළ හැකියි. සිනමාශාලාවෙක් හෝ වෙන ඕනෑම කටයුත්තක් කළත් ගිවිසුම් සහිතවයි ඒවා කෙරෙන්නේ. සිනමාශාලාවක් කියන්නේත් ජනතාවට වින්දනයක් ලැබෙන ස්ථානයක්. ඒ වගෙම චිත්‍රපට කියන්නේ තිබිය යුතු දෙයක්. දරදඬු වෙලා තියෙන හිත් වලට යම් තෙතමනයක්, සංවේදනයක්, කලාවක් ඇති කරවන්න සිනමාවට හැකියි. මොන කටයුත්තක් මේ ස්ථානයේ කළත් මේ ඉදිකිරීම සම්බන්ධව ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයේ වාර්ත, ඉංජිනේරු වාර්තා අරගෙනයි කරන්නේ. යම් වැරදි වෙලා නම් ඒවා නිවැරදි කරගමු. හිටපු මල්කැකුළ සභාපතිතුමාගේ කාලේ කළ එකක් මේ ඉදිකිරීම. ඵලදායීව මේ වසර තුළදී කරමු. සුදුසු පරිදි සාකච්ඡා කරලා ආයෝජකයින් ගෙන්වාගෙන සුදුසුම දේ කරමු. දුම්රිය මාර්ගයට ඉඩතියෙනවා. නමුත් නගරේ ඉඩ සීමිතයි. ඒ ඉඩ කළමණාකරණය කරගත යුතුයි. දුම්රිය මාර්ගයේ කටයුතු නිශ්චිතවම මේ වසරේ ආරම්භ කරනවා. ඒ මාර්ගයේ පදිංචි වෙලා ඉන්න අයට ගෙවල් දෙනවාද? වන්දි මුදලක් දෙනවාද? සාකච්ජා කරනවා. කුරුවිටට ලොකු ගැටළුවක් වෙන්නේ නෑ. මේ ඉදිකිරිමට ගැටළුවක් නෑ. නමුත් අනවසර ඉදිකිරිම් වලට ගැටළු වෙයි. අදහස් දැක්වූවාට ස්තුතියි. වඩා සුදුසු දේ කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කුරුවිට නගරයේ සම්මන්ත්‍රණශාලාව හා කිරිඇල්ල පොදු නව වෙළඳ සංකීර්ණයේ උඩුමහළ , සභාවට ආදායම් ලැබෙන අයුරින්, සංවර්ධනයකර පවත්වාගෙන යාමට ආයෝජකයෙකු තෝරාගැනීම සඳහා සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස්කිරීමට මහාසභා අනුමැතිය ලබාදීම ට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් කරනු ලබන යෝජනා -
ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

06-02. පහලගම ඇහැලගහවත්ත ජලයෝජනාක්‍රමය සඳහා ජලනල ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා ගේ යෝජනාව අනුව පහලගම ඇහැලගහවත්ත ජලයෝජනාක්‍රමය සඳහා ජලනල ලබාදීම සඳහා මහාසභා අනුමැතිය ලබාදීම ට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -**

**06-03. 2026 වර්ෂයේ කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විවිධ නිෂ්පාදනයන් කරනු ලබන අය හට තම නිෂ්පාදන වැඩිදියුණුකරගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදිමට සුදුසු වැඩපිලිවෙලක් සැකසීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී. ආර්. ධර්මසිරි මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -**

**අපේ බල ප්‍රදේශයේ විවිධ ස්වයං රැකියා කරන අය ඉන්නවා. කුඩා මධ්‍යම ආදි වශයෙන් විවිධ නිෂ්පාදන කටයුතු කරනවා. එරත්නේ තේ අගය එක්කල නිෂ්පාදනයක් ලෙස කරනවා. තේ ආශ්‍රිතව වයින්නුත් හදනවා. කිතුල් නිෂ්පාදන වගේම යම් යම් භෝග විජලනය කරපු ග්‍රාමීය නිෂ්පාදන තියෙනවා. ඒවා සාර්ථකව කරගෙන යනවා. ඔබතුමන්ලාගේ ප්‍රෙද්ශ වලත් එවැනි නිෂ්පාදන ඇති. ඒවා වැඩිදියුණු කරන්න අපිට කළ හැකි දේ කිරිම දිරිගැන්වීම සභාවක් ලෙස අපේ වගකීම. ඒ ප්‍රජාව දිරිමත් කිරීමෙන් අපේ ජනතාවගේ ආයෝජනය වැඩි වෙනවා. මේ නිෂ්පාදන සඳහා දිරි දෙන විවිධ රාජ්‍ය ආයතන තියෙනවා. බැංකු තියෙනවා. 2026 වසරේදි කුරුවිට ප්‍රාදේශිය සභාව , වගේම කුරුවිට, කිරිඇල්ලත් ලේකම් කාර්යාල එක්ක එකතු වෙලා මේ නිෂ්පාදනවලට නිර්මාණයන්ට වෙළඳපළ අලෙවි කිරිමට සුදුසු අවකාශක් ලබාදෙන ලෙස සබරගමුව පළාත් සභාවෙන් ඉල්ලීමක් කරන්න. එසේම 2025 අවසානයේ 2026 ආරම්භයේ ගංවතුරෙන් ආපදාවට ලක්උන ව්‍යාපාර ඇති. අතහිත දියයුතු ව්‍යාපාර. ඒ නිසා ඒවාට සහායක් විය හැකි ආයතන දැනුවත් කළ යුතුයි. සභාවක් ලෙස මේ ක්‍රියාදාමයට සහාය විය යුතුයි. වෙළඳපළ අවස්ථා ලබාගැනිමට මඟ පෙන්විය යුතුයි. බෝපත්ඇල්ල මෙවැනි කටයුතුවලට සුදුසු තැනක්. කණ්ඩායමකට ඉඩදෙමු. අදහස් දෙන්න. සියළු ස්වයං රැකියා කරන ව්‍යවසායකයින්ගේ වෙළඳපල අවශ්‍යතා මල්ඵල ගන්වන්න මේ යෝජනාව පාදක කරගමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

මේ යෝජනාව ස්ථාර කරනවා. අද වන විට නිෂ්පාදන කරුවන් වැටිලා. අතින් තේ හදන කර්මාන්ත දිද්දෙනිය ජනතාව ත් සිදුකරනවා. අපේ පැත්තේ සෞභාග්‍යා බිම්මල් ගම්මානය හට් හදලා යටිතල පහසුකම් ගත්තත් වැසි ජලයට යට උනා. තව ප්‍රෙද්ශත් වැසිජලයට යට උනා. වැසි සමයේදි ඒ වතුරෙන් දිලීර රෝග හටගන්නවා. ගිණිදමන පත්බේරිය හතු හදන ගමක්. ඒ ගම නැවත අපි ස්ථාපිත කරමු. රසකැවිළි අපේ ගම්වල ජනතාව හදනවා ස්වයං රැකියාවක් ලෙස. කිතුල් හකුරු ආදි නිෂ්පාදන හදනවා. ඒවාට ප්‍රාෙද්ශිය ලේකම් කාර්යාලයෙන් ලියාපදිංචිය ගත යුතුයි. සභාවෙන් වෙළඳ බලපත්‍ර ආදිය ගත යුතුයි. එවැනි කටයුතු වලදී සහාය ලබාදෙන්න. සිද්ධස්ථාන වල ඉස්සර යම් වෙළඳාම් කළත් දැන් ජනතාව යන්නේ නෑ. මිනිස්සු ළඟ මුදල් නෑ. මේ බිම්මල් වගාවට යටිතල පහසුකම් දෙන්න මැදිහත් උනොත් ඉහළ ඵලදාවක් ගන්න පුළුවන්. කෝටි පහක් විතර රාජ්‍ය මුදල් වැය කරලා තිබුනත් දැන් ඒ ව්‍යාපාර නතර වෙලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -

අපේ ප්‍රදේශයේ කතුන් ස්වයං රැකියා කරනවා. ඒත් ඒ නිෂ්පාදන අලෙවි කරගන්න තැන් නෑ. පුහුණුව විතරයි තියෙන්නේ. ඒ නිසා ඒ අය අසරණ වෙලා. පුහුණු වැඩ සටහන් වලට යොමු කළත් ණය අරගෙන ව්‍යාපාරය ආරම්භ කළත් අලෙවි කරගන්න තැනක් නෑ. එරත්න බිම්මල් වගා කරුවෙක් ඉන්නවා. ප්‍රියන්ත කියලා මහත්මයෙක්. එතුමා ජනාධිපති ලේකම් කාර්යාලය සමග සම්බන්ධ වෙලා බිම්මල් ව්‍යාපෘතියක් කලා. ඒ හරහා බිම්මල් වගාකරුවන්ගේ බිම්මල් නිෂ්පාදන අලෙවි කිරිමට අවස්ථාව සැළසුනා. අපි ප්‍රෙද්ශයේ බිම්මල් වගාකරුවන් ඒ සඳහා යොමු කලා. ඒ වගේ ක්‍රමවේද තිබිය යුතුයි. ක්‍රමයෙන් නැතිවෙලා යන තවත් ව්‍යාපෘතියක් පන් මළු. පරිසර හිතකර බෑග්, පැදුරු පන් ආශ්‍රිත නව නිෂ්පාදන රැසක් මේ විධිහට ඇත්වෙලා යනවා. හැන්ඩ්ලූම් සාරිය, බතික් වගේ විදේශීන් පවා මේ දේවල් අගය කරනවා. අපේ රටේ බතික් වලට ඒ අය කැමතියි. නමුත් අපේ රටෙන් ඒ නිෂ්පාදන ක්‍රමයෙන් තුරන් වේගෙන යනවා. අලෙවිකරන්න තැනක් නෑ. විසිතුරු මල් වගාව ගෙදර නිකං ඉන්න කාන්තාවට පහසුවෙන් කළ හැකි ස්වයං රැකියාවක්. නමුත් ඒවාත් අලෙවියට තැන් නෑ. මාත් කළා ඕකිඩ් වර්ග වගාව කතුන් 20 ක් එක්ක. නිෂ්පාදනය කළත් අලෙවියට තැනක් නෑ. හෙළ බොජුන් හළ ගැන කතා කළත් ඒක කරන්න බැරි උනා. මේ වසර පහ තුළවත් කුරුවිට හෙළ බොජුන් හළනැතත් නිෂ්පාදන අලෙවිකළහැකි තැනක් දෙන්න. ඒකෙන් සභාවට ආදායමක් එයි. කාන්තාවන්ට අතමිට සරු කරගන්න අවස්ථාවක් දෙන්න. පුහුණු වැඩමුළු විතරක් දුන්නට වැඩක් නෑ. ඒ නිෂ්පාදන හැමදාම ගෙවල්වල. මහත්තයාගේ සාක්කුවෙන් ජීවත්වෙන්නේ. පොල්කටු වලින් නිෂ්පාදන වගේම පාවහන් නිෂ්පාදන තමන්ගේ දේවල් කරගන්නවා ඇතැම් කාන්තාවන්. අලෙවියට තැනක් නැති නිසා තමන්ගේ දේ කරගන්නවා. ඒ හින්දා මේ යෝජනාවත් තවත් එක යෝජනාවක් නොවී මේ වසර තුළවත් තැනක් හදන්න. රත්නපුරයට අත්කම් මැදුර තියෙනවා. කුරුවිටට තැනක් නෑ. නැතිවෙලා යන හැන්ඩ්ලූම් පන්මළු නිෂ්පාදන සඳහා නැවත පුහුණු කරවීම් කරවලා ඒ දේවල් නිෂ්පාදනය ඉහළ නංවන්න. ඒ නිෂ්පාදන වලට ඉහල ඉල්ලුමක් තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

උප සභාපතිතුමාගේ යෝජනාව ගැන මම දරන්නේ වෙනත් මතයක්. මේ යෝජනාව ග්‍රාමීය නිෂ්පාදන ඉහළ නංවලා අලෙවිකරගන්න තැනක් නෑ. ඒවාට තැන් දෙන්න කියලා. නමුත් අලෙවිසැල් දාලා බලන්න. කියක් විකිනෙයිද කියලා. අද තියෙන තාක්ෂනය එක්ක තරඟකාරී වෙළඳපළක් තියෙන්නේ. ඒ හින්දා බිම්මල් හැදුවත් ඒක මේ තරඟකාරී රටාවට ගැලපෙන ලෙස නිෂ්පාදනය වෙන්න ඕනි. ඒතකොට මිනිස්සු ගනියි. අපි කළයුත්තේ කීයක් හරි ගන්න පුළුවන් විධිහට විකුණ ගන්න තැනක් හදන එක නොවෙයි. තාක්ෂනය සමඟ එක් කරලා නිෂ්පාදනය වැඩි දියුණු කරලා වෙළඳපළට දැම්මයි. හීන් බෝවිටියා නවීන තාක්ෂනය සමඟ වැඩිදියුණු කරලා පැකට් කරලා වෙළඳපළට දමලා. අන්තර්ජාලය හරහා විශාල අලෙවියක් වෙනවා. ඒ නිසා තාක්ෂනයෙන් ඉහළ නිෂ්පාදන බිහිකළ යුතුයි. මල් පැළයක් උනත් දැක්කාම ගෙනියන්න හිතෙන ලෙස ඇසුරුම් කරළා ඉදිරිපත් කරන්න ඕනි. මල්කැකුළ මන්ත්‍රීතුමා කිව්වා එදාට ගැලපෙන ලෙස අර බිල්ඩිම හැදුවා කියලා. එහෙම බෑ. අනාගතයට ගැලපෙන ලෙසයි හැදිය යුත්තේ. නගරේ කාපට් දැම්මට ප්‍රමිතියක් නෑ. පස්ටික දාලා රෑ තලලා කාපට් තලනකොට රස්නෙට තලන්න ඕනි. ඒ රෝල බර මදි. රැළි නැතිව තියෙන්න ඕනි. නගරේ අය නමකුත් කියනවා මේවාට.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. වී. මහින්ද මහතා -</u>

සියළු දෙනාට සුභ නව වසරක් වේවා. මේ යෝජනාව ඉතාම කාලෝචිතයි. ස්වයං රැකියා ලෙස පවත්වාගෙන යන පිරිසට ගැටළු රැසක් තියෙනවා. මේ නිෂ්පාදන වලට මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමේදී ඉල්ලීම් කිරීමේදි විශාල ගැටළු ඇති වෙනවා. උදා හරණයක් ලෙස කිරිඇල්ලේ ඉන්නවා දක්ෂ පොල්කටු නිර්මාණ හදන ශිල්පියෙක්. තරඟකාරී වෙළඳපළට ඉදිරිපත් කළහැකි ලෙස ඔහු හදනවා. ඔහු ණයක් ඉල්ලලා. ඒකට ප්‍රාේදශීය ලේකම් කාර්යාලයෙන් පරික්ෂාවට ආපු වෙලාවේ ඔහුගේ වැඩිමහල් දියණිය දරු ප්‍රසූතියට ගෙදර ඇවිත් ඉඳලා එයා නර්ස් කෙනෙක්. ඒ හින්දා ණය අනුමත කරලා නෑ. මූල්‍ය ප්‍රතිපාදනය ලැබිලා නෑ. ඒ හින්දා මෙවැනි දේ පිලිබඳව ප්‍රාදේශීය ලේකම්ව පළාත් සභාව විෂය නිලධාරීන්ව දැනුවත් කරන්න. ඒ නිමැයුම් කරුවා ඒ කටයුත්ත හිතින් අයින් කරගෙන. මේ ශිල්පීන් දක්ෂ මානව සම්පතක් උනත් නවීණ තාක්ෂනය ලබාගන්න අපහසුයි. අමුද්‍රව්‍ය ගැටළු තියෙනවා. මේවාට මැදිහත් වෙන්න. බතික් නිෂ්පාදන කරන කිරිඇල්ලේ කතුන් 12 ක් විතර හිටියා. නමුත් තරඟකාරීත්වයක් නෑ. නිපැයුම් උසස් තත්වයේ නෑ. ඒ හින්දා ඒක සාර්ථක උනේ නෑ. ඒවගේ අයව හඳුනාගෙන නිසි පුහුණුවක් දීලා මූල්‍ය ප්‍රතිපාදන ගන්න උදව් කලොත් ඒ කටයුතු වලට මැදිහත් උනොත් ඒක වැදගත් වෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>

හොඳ යෝජනාවක්. එරත්න මේ වෙනකොට සුළු හා මධ්‍යම පරිමාන ස්වයං රැකියා පවතිනවා. අරුණ මහත්තයාගේ මූලිකත්වයෙන් අභිමාණී නිෂ්පාදන වෙළඳ පළට නිකුත් වෙනවා. හීන් බෝවිටියා, තෙබු, කොස්, ආත්තා, කොළ ආදිය විජලනය කරලා කුඩු පැකට් හදලා වෙළඳ පළට නිකුත් වෙනවා. තෙබුකොළ පැකට් එකක් රු. 80.00 වගේ ගියා. එයාත් එක්ක තව පිරිසක් මේ කටයුත්තට පුහුණු කරලා. ඒ අය ඒ දේට දක්ෂයි. මාත් මේ කටයුත්ත ආරම්භ කලා. නමුත් ලොකු අපහසුතා පවතිනවා.

විදුලි බිල සම්බන්ධව. ඒ බිල අධිකයි. කර්මාන්තයක් විධිහට ලියාපදිංචි කලොත් බිල අඩු වෙනවා. නමුත් මේ කර්මාන්ත සනයට යන්නේ ගාමන්න්ට් පැක්ටරි වගේ ඒවාළු. මේ ප්‍රශ්නය ප්‍රාෙද්ශිය ලේකම් කාර්යාලයෙන් කියන්නේ කර්මාන්තයක් කියලා පෙන්නන්නළු. ලියාපදිංචියේදි මේවාට කර්මාන්ත කියලා දෙන්නේ නෑ. තාම බැරිඋනා ඒක කරන්න. මේවාට තමා විසඳුම් දිය යුත්තේ. බිම්මල් කරා. එරත්නේ විශාල පිරිසක් ඒක කරා. ඒ හින්දා අමුද්‍රව්‍ය සපයා ගැනීම ප්‍රශ්නයක් උනා. දහයියා ලීකුඩු මිළදි ගන්න උනා විශාල මුදලකට. තරඟකාරිත්වය තුළ ඉල්ලුම අධික නිසා මිළ ඉහළ ගියා. අමුද්‍රව්‍යත් හිඟ උනා. දැනටත් ගෙවල් දෙක තුනක් මේවා කරනවා. ඒ කටයුත්ත ඉතාමත් පරික්ෂා කාරීව කළ යුත්තක්. ප්‍රායෝගිකව අමාරුයි. කෝඳුරුවෙකුටවත් ඒ කාමරයට යන්න බෑ. අපිත් ඇඳුම් මාරු කරලා පිරිසිදුව යා යුතුයි. සුදුළුනු , කරපිංචා දුම් ආදිය අල්ලලා පරිස්සමෙන් කළ යුතුයි. නැත්නම් පවත්වාගෙන යන්න බෑ. එරත්න තේ ඒක වෙනම ලොකුම ආයෝජනයක්. ඒවා පිටරට අරිනවා. මේවා ප්‍රචලිත කරන්න ඕනි. සුදාගල ලී කැටයම් කරන ගොඩක් අය ඉන්නවා. මේවට හැකි සහායක් දෙන්න. මෙතනට විතරක් මේවා සීමා කරන්න එපා. මේ අයව දිරි ගන්නන්න. කිතුල් කර්මාන්තය තියෙනවා. කිතුල් නිෂ්පාදන. ඒවාට අගයක් දීලා දිරි ගන්නලා වෙළඳපළට දාන්න උදව් කරමු. යම් පුහුණුවක් විධිමත්ව ඒ අයට ඕනි. එරත්නේ හැදුවා ග්‍රීන් හවුස්. හෝ මිරිස් කිලෝ එකක් රු. **20000.00** ක් විතර උනා. අන්තිමට සේරම මේ වැඩේ පටන් අරන්. නයි මිරිස් හදලා දෙන්න තැනක් නැතිව ගියා. එකම කාලෙක පටන් ගත්තාම ගාන අඩු උනා. ටැනල් එකේ ගානවත් නෑ. ටැනල් එකටත් පිට අයට යන්න බෑ. කෘමීන් එන්න බෑ. අන්තිමට අස්වැන්න දෙන්න තැක් නැතිව ආනන්ද එකට රු. හත්සියට වගේ දුන්නේ. හදන්න පටන්ගත්තා වගේම වෙළඳපළ ඕනි. බිම්මල් දෙන්න තැන් හදන්න ඕනි. ඒ හින්දා මේ වසර ගනන් තියෙන කුඩා ව්‍යාපාර වලට සභාපතිතුමා මූලිකත්වය අරන් අත්වැලක් වෙන්න. තෝරා ගත්ත කාණ්ඩ අරන් නායකයින් පත්කරලා කටයුතු සාර්ථකව කරන්න. අරුණ මහත්තයා සාර්ථකව කරනවා. මේ ව්‍යාපාර වල තියෙන ගැටළු මොනවාද බලලා හොයලා මැදිහත් වෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් මහතා -</u>

ස්වයං රැකියා වලට සහායක් වීම. හොඳයි. අපිට මූල්‍ය ණය වගේ කටයුතු කරන්න බෑ. නමුත් මේ සහාය දිම කාලෝචිතයි. කතුන් තමා කරන්නේ වැඩිපුරම. බිම්මල් වැඩිපුර කරන කටයුත්තක්. කිරිඇල්ලේ ඉන්නවා දක්ෂ පොල්කටු නිර්මාණ කරුවෙක්. නමුත් ඔහු ණයක් ගන්න ගියාම ගැටළු නිසා ඒ කර්මාන්තය අඩපණ උනා. මගේ බිරිඳත් ස්වයං රැකියාවක් කරනවා. යෝගට් වටලප්පන් හදනවා. මූල්‍ය පහසුකම් ගන්න ගියාම ගැටළු තියෙනවා. ණයක් ඉල්ලුවොත් ප්‍රාෙද්ශිය ලේකම් එකෙන් ඒක අමාත්‍යාංශයට ඇරලා අනුමත වෙලා එනකන් මාස ගානක් බලා ඉන්න වෙනවා. මේ පිරිස් එකතු කරලා තාක්ෂණ උපදෙස් දෙන්න හැකිනම් වැදගත්. වටිනා දෙයක්. මූල්‍ය පහසුකම් සියයට නවය ඉඳන් ශුද්‍ර මූල්‍ය ණය දෙනවා නමුත් ඇප විධිහට රාජ්‍ය නිලධාරීන්ගේ අත්සන් ඕනි. අපේ අයගේ වැඩ නිසාම කව්රුත් අත්සන් කරන්න බයයි. කුකුළු බිත්තර ගන්න හට් හදලා ණය අයදුම් කළා. නමුත් රජයේ නිලධාරින් ඇප දෙන්නේ නෑ. ඒ හින්දා ඒ කටයුත්ත අසාර්ථක වෙනවා. දුප්පත් අයට පොඩි ව්‍යාපාර වලට උදව් කළ යුතුයි. අපි

උනත් අපේ ව්‍යාපාරය කරන්නේ ත්‍රී රෝද රථයෙන්. රත්නපුර කුරුවිට කිරිඇල්ල කළාට ෆ්‍රිජ් ලොරි නෑ. හඳුන්කුරු, බිම්මල්, බතික් ආරම්භ කළාට ඒවා නතර වෙලා. මූල්‍ය ණයක් ගන්න ගියාම අන්තිමට මාස ගනන් ඉඳලා ප්‍රාදේශීය ලේකම් එකට ගිහින් හිතත් නරක් කරගෙන අවසන් වෙන්නේ. මේ ණය දෙන්න වෙනත් ක්‍රමයක් හදලා තාක්ෂණය අමුද්‍රව්‍ය දීලා වගේ පුහුණුවක් දීලා හෝ ඇප නැති ක්‍රමයක් හදලා කලොත් සාර්ථක වෙයි. ක්‍රමයක් හදන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

මේ යෝජනාව මේ සභාවේ කතා කරලා තියෙනවා. අපිට කළ හැකි දෙයක්ද? මුලින්ම කුරුවිට නගරයේ හෙළ බොජුන් හළක් හදන්න කතා උනා. මල්කැකුළ සභාපතිවරයාගේ කාලේ ඉඳන් කතා වෙනවා. ස්ථාන දෙනවා කියනවා. අවුරුදු හතක් විතර යනවා. අදහස් පළ කරලා. වාර්තාවේ පිටු පුරෝනවා. මේකම ආයෙත් සභාවට එයි. පළාත් සභාවේ මේවාට වැඩමුළු තියෙනවා. කරන්නේ කාටද? එකම කණ්ඩායම තමා යන්නේ. පළාත් සභාවෙන් නම්කරලාම කට්ටියක් ඉන්නවා. කතුන් පහක් විතර ඉන්නවා. ලිඛිතවම දන්වනවා. ලැස්ති පිට ඉන්නවා ඒවාට යන්න. පිරිස රැස්කරගෙන කැඳවීමට යනවා. දීමනාවක් දෙනවා. රුපියල් 1500 ක් විතර. කෑම බීම දෙනවා. කුරුවිට රත්නපුර එකම පිරිසකට පුහුණුව දෙනවා. මාපියාවක් වෙලා. කාන්තා වැඩසටහන් කියලා මුදල් වෙන් කරලා අවභාවිතාවක් වෙන්නේ. අපේ අයත් ඉන්නවා. බතික්, හතු කියලා පටන් අරන්. ඒවා අවංකව කරන්න. පතල් කර්මාන්තය දුක් විඳලා කරන්නේ. ගැරුම් වට්ටිය රු. 3200.00 යි. හැම පතලෙටම මේ වට්ටි ඕනි. ඒ අයට මේ නිෂ්පාදන වලට සහාය වෙන්නේ කව්ද? ඒ නිෂ්පාදනයට සභාවෙන් දිය හැකි සහාය මොකක්ද? බට කැපීම තහනම්. වේවැල් කැපීම තහනම්. මේ නිෂ්පාදනය ට වේවැල් බට ඕනි. ඒවා නැතිව හදන්නේ කොහොමද? මෙවැනි ගැටළු රැසක් තියෙනවා. මේවා පණිවිඩය ගෙනියන්න පුළුවන් තැන. සම්බන්ධීකරණ රැස්වීම. අපිට ඒවාට යන්න බෑ. අද වෙනතුරු ආරාධනා නෑ. ඇයි අපිට බැරි යන්න. මෙතනින් එහාට යන්න තැනක් නෑ. අවස්ථාව දෙන්න සම්බන්ධීකරණයට යන්න. මීට පෙර අපි ඒවාට සහභාගී උනා. ගැටළු කිව්වා. අද වන විට එරත්නේ හතු වගාව වැටිලා. ඒවා කතා කළ හැකියි. යම් වැඩසටහන් තිබුනාට ඒවාට එන්නේ සීමිත පිරිසක් විතරයි. පොදු ජනතාව වෙනුවෙන් නෙවෙයි. ආණ්ඩු පක්ෂයට දෙනවා. කට්ටිය ගෙන්නලා කරන වැඩසටහන මොකක්ද බලන්න. වැඩිපුර මුදල් දෙනවා කට්ටිය සහභාගීකරනවන අයට. කනවා බොනවා එනවා. නියම ව්‍යවසායකයින් කොහොම ගොඩදාන්නද? හතු කර්මාන්තය කරන්නේ ඉතා දුෂ්කරව. ගබඩා ඕනි. ආධාර දෙන්න පුළුවන්ද? අපිට. බෑ. ඒහින්දා මේවා සම්බන්ධීකරනයේදි කතා කරන්න අවස්ථා සලසන්න. පළාත් සභාවේ ගැටළු කියන්නෑ. අකැමැතිද? විපක්ෂයේ කට වහලද? මේ යෝජනා තව වසර පහක් කතා කරන්න පුළුවන්. හෙළ බොජුන් හළ වගේ. එකම යෝජනාව විතරයි. පුහුණු වලට යන්නෙත් එකම අය විතරයි. හිටපු අයයි ඉන්න අයයි යනවා ඒකට. මැතක තිබුනා. ඒකටත් ගියා. කෑම බීම අරන් එච්චරයි. ව්‍යවසායකයෝ ඒවායේ නෑ. සුදුස්සා එතන නෑ. රට හැමදාම මෙතනම තමයි. එකම තැන. සුදුස්සාට දැනුවත් කිරිමක් වෙන්නේ නෑ. යම් අතහිතක් දෙනවානම් කුරුවිටට ගම්වල දුප්පත් ජනතාවට

දෙන්න. ඒ කර්මාන්ත වලට ලැදි අයට දෙන්න. ජනතාව නගා සිටුවන්න. සිස්ටම් චේන්ජ් කරන්න. රජයේ අනුග්‍රහය තිබිය යුත්තේ පොදු ජනතාවට සුදුස්සාට. ව්‍යවසායකයාට. ප්‍රතිපාදන දිය යුත්තේ ව්‍යවසායකයාට. අපිට සම්බන්ධීකරණය කියන්න. දෙන්නෙක් නම් කරලා තියෙනවා කිව්වා. අවස්ථා ලැබුනේ නෑ. ප්‍රාෙදේශීය ලේකම් එකෙන් ඇහුවා. විපක්ෂය දැනුවත් කරලා නෑ. ප්‍රාදේශීය ලේකම්ව දැනුවත් කරලා සියළු මන්ත්‍රින්ට අවස්ථාව දෙන්න. සභාවක් තුලින් කළ හැකි යෝජනා සම්බන්ධීකරනයට ඉදිරිපත් කිරිමට අවස්ථාව දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -

කාලෝචිතයි. සිදුවිය යුතු දෙයක්. අපිට කළහැක්කේ සම්බන්ධීකරනය කිරිම . අවශ්‍ය සියළු සම්පත් සාධක බල ප්‍රදේශය තුළම තියෙනවා. ගොම වේලලාත් විකුනනවා. ඒකට තැනක් ස්ථානයක් නෑ. වෙබ් අඩවියේ අවකාශය තියෙනවා. නමුත් ඇතිවන ගැටළු වලට සහනදායි තත්ව උදා කිරිම ජනතාවට කරන සේවයක්. උණ ලීයෙන් වැඩදාපු පිරිස වැටිලා. නීතිරිති අනුව උණ ලී කැපීම තහනම්. අපිට තියෙනවා සභාවක් ලෙසට ප්‍රධාන ආයම් ඉපැයීමට අලෙවිකටයුතු වලට යොදාගත හැකි ස්ථාන තුනක්. සංචාරක ආකර්ශනය දිනා ඇති බෝපත් ඇල්ල. විදේශ විනිමය ලැබෙන තැනක්. වෙළඳකුටි ඒ අනුව නිර්මාණය කළ යුතුයි. ශ්‍රිපාදස්ථානයේ ආසන්නයේ පාර්කිං හදලා අපේ වෙළඳ කුටි හැදිය හැකියි. සභාවක් ලෙස මේ ප්‍රෙද්ශයේ කර්මාන්ත වල නිෂ්පාදන අලෙවි කළ හැකියි. අලෙවි නොවන නිෂ්පාදන තාක්ෂනය හරහා වෙබ් සයිඩ් එකකින් අලෙවියට යොමුකළ හැකියි. තැඹිලි වතුර පවා මේ වෙනකොට අලෙවිකරනවා. අලෙවියට තැන් නෑ කිය කියා ඉන්නවාට වඩා වැදගත් දේශීය නිෂ්පාදන සඳහා හැකි ආකාරයෙන් අලෙවියට අවස්ථා සැළසීම. හෙළ බොජුන් හල් කතා කලාට තාම වෙලා නෑ. කතා මණ්ඩප පමනක් නොවී ක්‍රියාත්මක කරන්න. ගජ්පි හදලා විකුනනවා. ඒ තුලින් විශාල ආදායමක් ලබනවා. ඒත් මේ අමාරුවෙන් හොයන රුපියලටත් රජය මගින් ඉතුරුම්මත බදුමුදල් ගහනවා. රජයක් ලෙස කුඩා කර්මාන්ත කරුවන් රැකිය යුතුයි. විදුලි බිල අඩු කරන්නබෑ. නමුත් මේ ගැටළු සම්බන්ධීකරනයට දාලා හරි කර්මාන්තකරුවන් ආරක්ෂා කරන්න වැඩපිලිවෙලක් කළ යුතුයි. රජයක් ලෙස ඒ දේ කළ යුතුයි. මේවාට කමිටු පත් කරලා හරි කමක් නෑ ක්‍රියාවට නංවන්න. මමත් අවශ්‍ය ආයතන සම්බන්ධීකරනය කරන්න සහාය වෙන්නම්. ක්‍රියාත්මක කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතා -

මේ යෝජනා පොඩි උනාට මේවා තුළ අභ්‍යන්තරයේ ඉතා වැදගත් කටයුත්තක්. ඒ ඒ කණ්ඩායම් එකතු කරලා හරි මේ කටයුත්ත සාර්ථකව කරන්න.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

සභාවේ මැදිහත්වීමෙන් මේවා කළ හැකිද? බැරිද? මම හැදුවා සෞභාග්‍යා ගම්මානය. ඒක මැණික් ගමක්. පහළගම බොරළු ගොඩ. මැණික් ඔපදාන එක කරන්නේ. ටැබ්දුන්නා. බර්න් යන්ත්‍ර දුන්නා. සමහර ඒවා බැංකොක් වෙළඳපළට යවනවා. මේ යෝජනා ගේන්නේ චූන් වෙන්න නෙමේ. මිනිස්සුන්ගේ අවශ්‍යතා. ඉල්ලීම්. තම ගමේ ව්‍යාපාරයක් කරන එක අභියෝගයක්. කැපවෙන්න ඕනි. ඒ අය එකතු කරලා යම් දැනුවත් කිරිම් කළ හැකියි. විවිධ අයුරින් සහාය විය හැකියි. අපිට ඉන්නවා අර හොඳ

ව්‍යවසායකයෙක්. දිද්දෙනියට සහාය දිය හැකි අනුග්‍රාහක ආයතන තියෙනකවා. වෙළඳපළ හදමු. බට ලී කැපීම තහනම් නමුත් මේ කර්මාන්තය වෙනුවෙන් වන සංරක්ෂනයේ හා ප්‍රාදේශීය ලේකම් ගේ නිර්දේශ අරන් දෙන්න උත්සාහා කරමු. කැළුම් මන්ත්‍රීතුමා කිව්වා ව්‍යාපාර ලියාපදිංචියේ ගැටළු. කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් ලියාපදිංචි කරනවා. පසුගියදා වැඩමුළුවක් තිබුණා. මේ සම්බන්ධව. එදා ඒකට අරුණ මයාව ගෙන්නුවා. තමාට ආපු අභියෝග කිව්වා. වැදගත්. මේ ජනතාවට වෙළඳපළ අවකාශය ඕනි. මේ යෝජනාව ක්‍රියාත්මක කරමු. ලියවිල්ලක් නොකර කරමු. අවකාශය ප්‍රවේශයක් හදමු. ගැමිදිරිය පටන්ගත්තේ අපි. එල්ලාවල සණස ඉතාමත් ශක්තිමත්. අත්වැලක්. මේ ජනතාවට ණය දෙනවා. ගැමිදිරියේ මුදල් විශාල ප්‍රමාණයක් තිබුනා. පසුවිපරම් කළ යුතුයි. බිම්මල් සුදුසු ව්‍යාපාරයක් උනත් අභියෝග වලට මුහුණ දෙන්න බැරි උනා. ඒකකාර උනා. බංකොලොත් උනා. එරත්නේ තේකොළ වලට විශාල ඉල්ලුමක් තියෙනවා. ගෘහස්තව හදන හීන්බෝවිටියා වලට ලෝක වෙලදපල ඉල්ලුමක් ඇවිත්. තාක්ෂනය දෙන්න ආයතන තියෙනවා. අපි ඒකාබද්ධ වෙලා මේවාට මැදිහත් වෙමු. උනන්දුවෙන අය හොයාගෙන ඒ අයට සහාය වෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -</u>

ඇල්ලකන්ද පාරේ සුරතල් මසුන් අපනයනය කරනවා. ඒ සම්බන්ද කුඩා කණ්ඩායම් තියෙනවා. සහාය වෙන්න. පන්මළු ආදි නිෂ්පාදන අලෙවිය සඳහා වෙළඳ මධ්‍යස්ථානයක් හදන්න. බෝපත් ඇල්ලේ ඒ කටයුතු කළ හැකියි. කැප වෙන්න.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

සෘජුවම මේ කටයුත්ත අපිට ක්‍රියාත්මක කල නොහැකි උනත් යම් යම් කටයුතු වලට අපිට සම්බන්ධ විය හැකියි. ඒ ආයතන එක්ක යම් සම්බන්ධීකරණයක් කරලා මැදිහත්වෙන්න පුළුවන්. මේ කරුණු යොමු කරලා අවශ්‍ය ආයතන දැනුවත් කරලා කටයුතු කරමු. මේ යෝජනාවෙදි කාරණා කීපයක් මතු උනා. කර්මාන්තවල මූල්‍ය තත්වය. බදු පැනවිමක් ගැන කිව්වා. මෙවර අයවැයේ අළුතෙන් බදු පනවා නෑ. ඒ තිබුනේ පැවති බදු. මේ යෝජනාවට අදාළව විවිධ නිෂ්පාදන වල නියැලෙන ජනතාව ඉන්නවා. පළාත් සභාවේ කර්මාන්ත අමාත්‍යාංශය, රේඛීය අමාත්‍යාංශය, සමූපකාර දෙපාර්තමේන්තුව ආදි ආයතනවල සහාය මේ නිෂ්පාදන වෙනුවෙන් ගත හැකියි. පසුගියදා කර්මාන්ත අමාත්‍යාංශයේ ස්වයංරැකියා සහනාධාර උපකරණ දීමේ වැඩසටහනක් තිබුණා. එය ඵලදායිව කළා. පුද්ගලිකව උපකරණ දීම වෙනුවට සමිතිවලට ලබාදුන්නේ. ඒ හරහා අවශ්‍ය සේවය ගන්න පුළුවන්. පසුගියදා ජීවනෝපාය සංවර්ධනය අරමුදලේ විමධ්‍යගත ප්‍රතිපාදන වලින් පාරවල් හැදුවා. අපි මැදිහත් උනා. කාන්තා සමිතිවලට අවස්ථාවක් දුන්නා. ඊයේ මැණික් කර්මාන්තය ආශ්‍රිතව කඳංගොඩ සමිතියට මැණික් කැපුම් යන්ත්‍ර දුන්නා. අවශ්‍ය අයට ජනතාවට මේ කාන්තා සමිති වලින් පුහුණුවිම් වගේම ඒ උපකරණ භාවිතයට ගන්න පුළුවන්. විජලන යන්ත්‍ර ආහාර නිෂ්පාදන ක්ෂේත්‍ර වලට දුන්නා. වැකුම් පැකිං යන්ත්‍ර සමිතිවලට දුන්නා. මේ නිෂ්පාදන සමුපකාරවලට දෙන්න කතා කරලා ඒ නිෂ්පාදන කරන ගොවින් සමුපකාර නිලධාරින් ප්‍රාදේශීය ලේකම් එකතු වෙලා මේ සම්බන්ධව කතා කළා. තනිව නෙමෙයි මේ ක්ෂේත්‍රෙය් පිරිස එකතු කරලා දිරිගැන්වීම වැදගත්.

මේ සම්බන්ධව කටයුතු කිරිමට බලාපොරොත්තුවෙනවා .සම්බන්ධීකරණ කමිටුවට පක්ෂ නියෝජිතයින් සම්බන්ධ වෙන්න චක්‍රෙල්ඛයක් තියෙනවා. නිශ්චිතව නම්කරගෙන යන්න පුළුවන්. මම නම් අදහස්කලේ හැමෝටම අවස්ථාව දෙමු. ප්‍රාදේශිය ලේකම් දැනුවත් කරන්නේ. ආපදා නිසා කමිටුව කල් දැම්මා. හදිසියේ ආයෙත් කැදෙව්වා. ඒ නිසා ඉදිරියේ නම් කරලා යමු. නම් සඳහන් කරලා දෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා ගේ යෝජනාව අනුව 2026 වර්ෂයේ කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විවිධ නිෂ්පාදනයන් කරනු ලබන අය හට තම නිෂ්පාදන වැඩිදියුණුකරගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදිමට සුදුසු වැඩපිලිවෙලක් සැකසීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

**06-04.** එරත්න වර්ණගල ඇතුළු සංචාරක ආකර්ශණීය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා විධිමත් සැළැස්මක් සකස්කර සංචාරක අමාත්‍යංශයට ඉදිරිපත්කිරිම ට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

මේක 2026 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරිම සඳහා පරිසර කමිටුව මගින් සැළසුම් කර සබරගමුව පළාත් සභාවේ සංචාරක අමාත්‍යංශයට යොමුකරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා ගේ යෝජනාව අනුව එරත්න වර්ණගල ඇතුළු සංචාරක ආකර්ශණීය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා පරිසර කමිටුව මගින් විධිමත් සැළැස්මක් සකස්කර සංචාරක අමාත්‍යංශයට ඉදිරිපත්කිරිම ට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>

**06-05.** වළදූර, නඩුකාරදෙනිය වසම් වල ඇති, සභාවට පවරා ගතහැකි සුදුසු පොදු ස්ථාන නීත්‍යානුකූලව සභාවට පවරාගෙන සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -

පරගලතැන්න, වලදූර, යහලකොට්ටුන්න, නඩුකාරදෙනිය වගේ පොදු සුසානභූමි පවරාගෙන ඒවා සංවර්ධනය කළ හැකියි. ඒවා පවරාගැනීමට ගැටළුවක් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -

වළදූර පමනක් නොවේ. කුරුවිට බල ප්‍රෙද්ශයටම අදාල ලෙස මේ කටයුත්ත කරමු. සුසානභූමිවල තොරතුරු ලබාගෙන මායිම් වල කම්බිකණු දමා නිරවුල් කිරීම කළ හැකියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

නඩුකාරදෙනියේ පොදු බිම සභාවට නිවාස අධිකාරියෙන් භාරගන්න කිව්වා. නිවාස අධිකාරියෙන් සභාවට දීලා. සභාව භාර ගතිමි කියන ලිපිය යවන්න තිබුනේ. ඔප්පුව හදන්න තියෙන්නේ. පරගලතැන්න මංගල ඩයස් ක්‍රීඩාංගනය හදලා විදුලිය ගත්තා. සභාව ට පවරා ගන්න වටත් මැන්නා. නමුත් එවේලේ අයිතිය පිලිබඳ ප්‍රශ්නයක් කියලා විදුලි බිල ගෙවලා නෑ. ඒ නිසා විදුලිබලමණ්ඩලයෙන් පද්ධතියම ගලවාගෙන ගිහින්.

බිම්සවිය ඔප්පුවත් තියෙනවා. සභාවට පවරාගන්න මුදලුත් වියදම් කලා. අක්කර පහක් තිබුණා එතන. ඒ බිම් ගම පුළුල් කරන්න ගත්ත ඉඩම්. නාය යන අයටයි දුන්නට ඒ ඉඩම් තුට්ටු දෙකට විකුනලා ඒ අය ගියා. ඒ වසර දෙකේ බිම් සවියෙන් මැන්නා. සුළු දෙයයි කරන්න තියෙන්නේ. මේ පිලිබඳ සොයාබලා කටයුතු කරන්න. නඩුකාරදෙනිය පොදු ඉඩම ගන්න ලොකු සටනක් දුන්නා. ඉදිරි කටයුතු වලට සභාව මැදිහත් වෙන්න. සෞඛ්‍ය අමාත්‍යංශයේ මම සම්බන්ධීකරන කටයුතු කරන කාලේ බෙහෙත් ශාලාවට වෙන් කරලා පළාත් සභාවේ එකඟතාවය දීලා මුදල් වෙන් කලා. අරගලය නිසා ඒ කටයුතු ඇණ හිටියා. වැඩේ නැවතුණා. දෙව්පහල එක වැඩ අවසන් කළා. මම මුදල් හොයලා දුන්නේ. නඩුකාරදෙනිය බෙහෙත් ශාලාවට පළාත් සභා මුදල් වෙන් කළා. හැමෝම මැදිහත් වෙලා මේකේ වාර්තා අරන් ඒ ඉඩම් සභාවට පවරා ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

කුරුවිට සභා බලප්‍රෙද්ශයේම සභාවට ගත හැකි පොදු ඉඩම් මේ ලෙස පවරා ගැනීම සුදුසුයි. පියසිරි විජේරත්න කියලා මහත්තයෙක් ලිපියක් යොමු කරලා ඇති සභාවට. ළිඳකට වෙන් කළ ඉඩමක් ගැන. වෙන අය පරිහරණය කරනවළු. හුණුගල්කොටුව ඉඩම් නඩුව. බෙදලා වෙන්කල එකක්. පත්බේරිය උණගහවත්ත ළිඳ. පරිහරණයක් නෑ. ඒක තියෙන ඉඩම වෙන පොදු කටයුතුවලට ගන්න පුළුවන්. පරකඩුව බෝධිය අසල ළිං දෙකක් තියෙනවා. භාවිතයට ගන්නේ නැතත් හොඳ වෙළඳ ස්ථානයකට ගන්න පුළුවන්. ළිඳ පරිහරණය කරන ගමන් උඩුමහලක් ඉදිකර කඩ හදන්න පුළුවන්. පරකඩුව විශ්ව හාඩ්වෙයාර් පිටුපස ගැමිදිරිය ප්‍රජාශාලාවත් පාළුවට ගිහින්. සභාව මැදිහත්වෙන්න. ගැමිදිරිය මිල්ලවිටිය කොක්ඹිවිට ප්‍රජා ශාලාවත් අත්හැරලා. මේ ස්ථාන සභාව සතු කරගෙන ආදායම් එන ලෙස වැඩිදියුණු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා

සුසානභූමි ගැන කාලයක් මේ සභාවේ කතා කළා. අපි යටතේ වගේම ප්‍රාදේශීය ලේකම් යටතේත් සුසානභූමි තියෙනවා. එරත්න සුසානභූමිය කොටස් මිනිස්සු අල්ලාගෙන. සූදාගල මිනිස්සු අල්ලාගෙන ප්‍රාදේශීය ලේකම් සතුයි කියලා ඒ අය කියනවා. එරත්නේ ක්‍රිඩා පිටිය සභාව සතු දේපලක්. ඒකට තිබුණ නඩුවේ අවසානය මොකක්ද? විශාල ක්‍රිඩා පිටියක්. හෝදාපාළුවට ලක් වෙලා. සභාව සතු කරගෙන ආදායමක් එන ලෙස කටයුතු කරමු. පුළුල්කරලා බැම්ම ගහලා ලෙවල් කරලා. මේ කටයුත්ත සම්බන්ධව අවධානය දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා</u>

අදහස් දැක්වීම වෙනුවෙන් ස්තුතියි. බල ප්‍රෙද්ශයේ හැමතැනම මේ ගැටළුව තියෙනවා. ඒ සියළු පොදු ස්ථාන පිලිබඳව ක්‍රියාත්මක වෙමු. ඉදිරි කටයුතු කරන්න.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ ගැටළුව අනෙකුත් ප්‍රෙද්ශ වලටත් පොදුයි. මිට පෙර අපි දැනුම්දුන්නා තමන්ගේ කොට්ඨාශ වලතියෙන සභාව සතු දේපළ පිලිබඳව හෝ යම් තොරතුරක් තියේනම් ඒ බව සභාවට දැනුම්දෙන්න කියලා. සීමිත තොරතුරු ටිකක් ලැබිලා තියෙනවා. ගෞරවයෙන් ඉල්ලනවා තමන්ගේ වසම්වල තියෙන සභාව සතු දේපල විස්තර ලබාදෙන්න කියලා. ලිඛිතව දෙන්න. අත්හැරලා ගිය තැන් ඇති. වෙන අය භුක්ති විඳින ඒවා ඇති. ඒ දේපළ පැහැදිලිකරගන්න නිරික්ෂනය කළ යුතුයි. ලබන සතියේ දිනයක් දාගෙන කරමු. එක දිනයක් මදි වෙයි. සමහර ඒවාට නඩු තියෙනවා. දැනට ඒවායේ තත්වය පැහැදිලි නැ. අදාළ නීතිඥයන් හමු වෙලා ඉදිරි පියවර ගමු. කිරිඇල්ල ක්‍රිඩා පිටිය මැණලා අවසන්. පවරාගැනීම කරලා තියෙනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතාගේ යෝජනාව අනුව වළඳූර, නඩුකාරදෙනිය වසම් වල ඇති, සභාවට පවරා ගතහැකි සුදුසු පොදු ස්ථාන නීත්‍යානුකූලව සභාවට පවරාගෙන සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>

**06-06.** සභා බලප්‍රදේශයේ ඇති වගාවට සුදුසු, එහෙත් වගානොකර ඇති බිම් හා පුරන් කුඹුරු වගා කිරීමට කැමති වගාකරුවන්ට අදාළ ආයතනය හරහා ලබාදීමට මැදිහත්වීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ සම්බන්ධව මීට ඉහතදීත් කතා කළා. අපි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා මේ කටයුතු සිදුවෙමින් පවතිනවා. තව දුරටත් සභාවක්ලෙස මේ තොරතුරු දැනුම්දීලා මැදිහත්වීම් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතාගේ යෝජනාව අනුව සභා බලප්‍රදේශයේ ඇති වගාවට සුදුසු, එහෙත් වගානොකර ඇති බිම් හා පුරන් කුඹුරු වගා කිරීමට කැමති වගාකරුවන්ට අදාළ ආයතනය හරහා ලබාදීමට මැදිහත්වීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>

**06-07.** නඩුකාරදෙනිය ක්‍රීඩාපිටියේ පැතිබැම්ම හා කාණුව සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

සභාව මගින් මේ පැතිබැම් කාණු සංවර්ධනය කළ හැකිද? එසේම මේ සභාවේ කොන්ත්‍රාත් කරන කොන්ත්‍රාත්කරුවෙක් ඉන්නවා. සභාවේ හැසිරෙන්නේ ලේකම් සභාපති වගේ. ලේකම් සභාපති ආයතනයේ හිටියේ නැත්නම් ඒකත් ප්‍රශ්න කරනවා. අපකීර්තියක්.

මේ බලය දෙන විධිහ ගැන සභාපනතේ 217, 218, 219 වගන්ති වල තියෙනවා. එසේම කියවෙනවා සභිකවරුන්ට කොන්ත්‍රාත් සම්බන්ධව ගිවිසුම් ආදිය සම්බන්ධව මූල්‍ය සම්බන්ධයක් සෘජුවම හෝ අන්‍ය ආකාරයකින් තියෙන්න බෑ. නමුත් මන්ත්‍රීවරු මේ කොන්ත්‍රාත්කරුවන් ආරක්ෂා කරන්න හදනවා. මේ සම්බන්ධව දැනුවත්ද?

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ යෝජනාවට අදාළ නෑ. කව්රුන් හෝ සභාවේ වැඩ වලට බාධා කරනවා නම් ගත යුතු ක්‍රියාමාර්ගයක් තියෙනවා. නමුත් එලෙස බාධාවක් තියේ නම් නිශ්චිතවම ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්නවා. බාධා කිරිමට ඉඩ දෙන්නේ නෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

ඒ කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් මන්ත්‍රීවරුන්ට පෙනී ඉන්න පුළුවන්ද?

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

තම යෝජනාවක් ක්‍රියාත්මක වෙද්දි අදාල සමිතිය හෝ කොන්ත්‍රාත්කරු සමග ඒ වැඩ වෙනුවෙන් කතා කරන්න සොයාබලන්න පුළුවන්. මට නම් මේ සම්බන්ධව පැමිනිලි හෝ දැනුවත්කිරිමක් කව්රුත් කරලා නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා -

එහෙම නැතිව පිලිගන්නේ කොහොමද? එවැනි දෙයක් සිදුවෙන කෙනා පැමිණිලි කළ යුතුයි. එහෙම නැතිව මේ මාසික සභාවේ පැමිණිලි හෝ චෝදනා කරන්න බෑ. අහවල් නිලධාරියා කිව්වේ කියලාවත් නම් කළ යුතුයි. මන්ත්‍රීවරයෙක් එසේ කරනවා නම් නම් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

මේ සභාවේ සිසිටීවී කැමරා නෑනේ. මේ තත්වය මේ ආයතනයේ නිතර සිදුවෙන දෙයක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා -

ආයතන ප්‍රධානියාට හෝ ලේකම්වරයාව දැනුවත් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා -

එවැනි අපහසුතා ඇත්නම් ඒ පිලිබඳව පැමිණිලි කළ හැකියි. සාපරාධී බලහත්කාරකම් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කළ හැකියි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මේ යෝජනාවට අදාළත්වයක් නෑ. කිසිදු නිලධාරියෙකුට ආයතනයේ කටයුතු කිරිමට බාධා තියේනම් ඒ පිලිබඳව මට හෝ ලේකම්ට හෝ දැනුම් දෙන්න. අදාල ක්‍රියාමාර්ග ගන්නවා. පිටතින් හෝ ලිඛිතව එවැනි තත්වයක් පිලිබඳව දැනුම් දුන්නොත් නිත්‍යානුකූලව අදාල පියවර ගන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

මේ පැහැදිලි කිරිම විශ්වාස කරනවා. ලිඛිතව කරන තැනට මාත් මන්ත්‍රීතුමන්ලාත් පෙළඹෙයි ආයෙත් මෙවැනි දේ උනොත්. වෙන ආකාරවලිනුත් විසඳන්න වෙයි. හැමෝම සභාපතිතුමාට කියන්නේ නෑ. මා හරහා කියන්න උත්සාහා කරනවා.

උප සභාපති අනිල් ලියනගේ මහතා -

ඒ කියන නිලධාරීන් කව්ද කියන්න. අපිටත් දැනගත යුතුයි. ආයතනයේ පරිපාටිය නොදැනයි ඒ කියන්නේ. සභාපති ලේකම් ට කියලා ඉන්න ඕනි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

නිලධාරින්ගේ ප්‍රශ්න වලට සෘජුවම මැදිහත් වෙනවා. නමුත් නිශ්චිතව දැණුම් නොදි අවශ්‍ය මැදිහත්වීම කරන්න බෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

මම මේ කතාව නිම කරන්නම්. ඒ දේවල් කියන නිලධාරින්ව නම් කරන්න බෑ. මේ කියන කොන්ත්‍රාත්කරු ඔබේ පාක්ෂිකයෙක්. මින් ඉදිරියට අනවශ්‍ය දේවල් ආයතනය තුළ සිදු නොවුනොත් ඇති.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතාගේ යෝජනාව අනුව නඩුකාරදෙනිය ක්‍රීඩාපිටියේ පැතිබැම්ම හා කාණුව සංවර්ධනය කිරීමට නීත්‍යානුකූලව කටයුතු කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා -</u>

**06-08.** තෙප්පනාව ඉහලගම පොල්ගහවෙල හන්දියේ ත්‍රිරෝද රථගාල අසල මාර්ගයේ පැතිබැම්ම සකස්කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා ගේ යෝජනාව අනුව_තෙප්පනාව ඉහලගම පොල්ගහවෙල හන්දියේ ත්‍රිරෝද රථගාල අසල මාර්ගයේ පැතිබැම්ම සකස්කිරීමට නීත්‍යානුකූලව කටයුතු කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා -</u>

**06-09.** තෙප්පනාව මැදගම වසමේ ආරාමය කොබෝමැල්ල මාර්ගයේ කොටසක් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා ගේ යෝජනාව අනුව තෙප්පනාව මැදගම වසමේ ආරාමය කොබෝමැල්ල මාර්ගයේ කොටසක් සංවර්ධනය කිරීමට නීත්‍යානුකූලව කටයුතු කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි මිය විසින් කරනු ලබන යෝජනා</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි මිය -</u>

**06-10.** හාන්දුකන්ද කටු කැලේ මාර්ගයේ මෙතෙක් සංවර්ධනය කර නොමැති අබලන් ස්ථාන සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි මියගේ යෝජනාව අනුව හාන්දුකන්ද කටු කැලේ මාර්ගයේ මෙතෙක් සංවර්ධනය කර නොමැති අබලන් ස්ථාන සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි මිය -

**06-11.** හාන්දුකන්ද මිල්ලමණ්ඩිය මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා-

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි මියගේ යෝජනාව අනුව හාන්දුකන්ද මිල්ලමණ්ඩිය මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය විසින් කරනු ලබන යෝජනා -
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය -

**_06- 12.** තෙප්පනාව පහලගම මිනුවන්දෙනිය ප්‍රියන්ත මහතාගේ නිවස අසල අතුරු මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා-

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මියගේ යෝජනාව අනුව තෙප්පනාව පහලගම මිනුවන්දෙනිය ප්‍රියන්ත මහතාගේ නිවස අසල අතුරු මාර්ගය සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය -

**06- 13.** කුරුවිට මහදෙනිය සභාව සතු ඉඩමේ ප්‍රජාශාලාවක් ඉදිකිරිම සඳහා අවසරය ලබාගැනීමට හා 2026 වර්ෂයේ ඒසඳහා ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය -

මේ ඉඩමේ ළිඳක් තිබිලා. වත්තට අයත්ව තිබිලා පසුව ප්‍රාදේශීය ලේකම් හරහා සභාවට පවරා දුන්නේ. පොඩි ඉඩමක්.ඒ ඉඩමේ ප්‍රජා ශාලාව හදලා දෙන්න කියලා ගමේ ඉල්ලීමක්.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කරලා ක්‍රියාත්මක කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මියගේ යෝජනාව අනුව කුරුවිට මහදෙනිය සභාව සතු ඉඩමේ ප්‍රජාශාලාවක් ඉදිකිරිම සඳහා අවසරය ලබාගැනීමට හා 2026 වර්ෂයේ ඒසඳහා ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය -

06- 14. මලව උක්වත්ත පාර ඉතිරි කොටස දෙවන අධියර සඳහා ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා

සභා පාරක්ද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය -

වළඳුර හන්දියේ ප්‍රධාන පාරෙන් මේ මාර්ගය ආරම්භ වෙන්නේ. දොඩංගොඩ ටයර් හවුස් , ලීමෝළ ලඟින් තමා නැවත ප්‍රධාන පාරට වැටෙන්නේ. මේ පාරේ ගෙවල් 30 කට වැඩියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

මලව උක්වත්ත පාර කොන්ක්‍රිට් කරලා ඉවරයි. මගේ ඉඩමට මායිම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය -

ඒ පාර කොන්ක්‍රිට් කරලා ඉවර නෑ. පරණ පාර. මේ පාර ඔබතුමාගේ ගමේ තියෙන්නේ. ගිය පාර සල්ලි ගන්න නොදුන්න පාර.

මේ අවස්ථාවේ සභාවේ ඝෝෂාව පැවතිණි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මේ සියළු කටයුතු කරන්නේ කාර්මික නිලධාරින් මගින් සාධ්‍යතා වාර්තා අරන් නීත්‍යානුකූලව. වාර්තා අරන් ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මියගේ යෝජනාව අනුව මලව උක්වත්ත පාර ඉතිරි කොටස දෙවන අධියර සඳහා ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. රොෂාන් දේශප්‍රිය මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. රොෂාන් දේශප්‍රිය මහතා -

**06- 15 . 127/සී** මෙනේරිපිටිය මැල්වත්ත පොදු ළිඳ අසලින් මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. රොෂාන් දේශප්‍රිය මහතා -

අවධානමට පෙර සූදානම වැදගත්. ගියවර සාකච්ඡා උනා මේ සභාවේ. මැල්වත්ත පොදු ළිඳ අසලින් මාර්ගයේ පැතිබැම්ම මේ වෙන විට ඛාදනයට ලක් වෙලා මේ ජනතාවගේ ඉල්ලීමක්. ප්‍රතිපාදන ලබාදෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. රොෂාන් දේශප්‍රිය මහතාගේ යෝජනාව අනුව127/සී මෙනේරිපිටිය මැල්වත්ත පොදු ළිඳ අසලින් මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. රොෂාන් දේශප්‍රිය මහතා -

**06- 16. 127/සී** මෙනේරිපිටිය මැල්වත්ත මාර්ගයේ නීල් මහතාගේ නිවස අසල සිට මනුක මහතාගේ නිවසදෙසට ඇති මාර්ගය මීටර් දෙසීයක් සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. රොෂාන් දේශප්‍රිය මහතා -

මාත් පාසැල් ගිය මාර්ගයක්. වර්ෂා දිනට යන්න බැ. පාසැල් දරුවෝ යනවා. හිටපු සභාපතිතුමා මේ මාර්ගය සංවර්ධනය කළා. පොඩි කොටසක් ඉතිරි වෙලා තියෙන්නේ. ප්‍රතිපාදන දෙන්න.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. රොෂාන් දේශප්‍රිය මහතාගේ යෝජනාව අනුව 127/සී මෙනේරිපිටිය මැල්වත්ත මාර්ගයේ නීල් මහතාගේ නිවස අසල සිට මනුක මහතාගේ නිවසදෙසට ඇති මාර්ගය මීටර් දෙසීයක් සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා -

**06- 17.** කුරුවිට නගරයේ ඇති වෙළඳ නාම පුවරු නියාමනය කර නගරයට අලංකාරයක් එන ලෙස ස්ථාපිත කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා -

කුරුවිට ප්‍රධාන මාර්ගයෙන් එරත්නට හැරෙන පාරේ වංගුවේ ඇති නාම පුවරු සියල්ල හෝටල්වල නම්, ආයතනවල නාම පුවරු ආදියයි. එතනින් පාරේ වාහන එනවාද පේන්නෙත් නෑ. අනතුරු විය හැකියි. ඒවැනි ස්ථානයක කිසිදු අලංකාරයක්, පෞඩත්වයක් නෑ. ඒ නාම පුවරු ආදිය කිසියම් සුදුසු නිශ්චිත ස්ථානයකයි තිබිය යුත්තේ. ශ්‍රීපා පුදබිමට යන මාර්ගයේ ආරම්භය. යම් අභිමානයක් ඉස්මතු වන ලෙස තිබිය යුතුයි. වෙළඳ ව්‍යාපිරික සභායත් ලබාගෙන මේ කටයුත්ත සාර්ථකව කරන්න පුළුවන්. කුරුවිට නගරයේ පටන් ගත්ත තැන ඉඳලා අවසානය දක්වාම බැළු බැළු අත නාම පුවරු. නගරයේ අලංකාරය වැහිලා. ප්‍රධාන පාලමේ විතරයි පුවරු ගහලා නැත්තේ. ඇසක් පිනවන දර්ශනයක් නගරේ නෑ. මේ සියළු නාමපුවරු විධිමත්ව යම් නිශ්චිත ස්ථාන වලට විතරක් අරන් ක්‍රමවේදයක් අනුව ක්‍රමවත්ව ස්ථාපිත කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි මහතා -

සිරිපා පිවිසුම් ස්ථානය අලංකාරව සැකසිය හැකියි. වෙළඳ ප්‍රජාවගේ සහාය අරන් අපේ අනන්‍යතාවය පෞඩත්වය පිළිඹිබු කෙරෙන ආකාරයෙන් තොරණක් වගේ හදලා මේ කටයුත්ත කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා -

කුරුවිට නගරයේ වෙළඳ නාම පුවරු නියාමනය කරලා නගරයට ක්‍රමවත් බවක් අලංකාරයක් ගෙන දෙන්න කටයුතු කිරීම පිලිබඳ යෝජනා කිරීම පිලිබඳ ස්තූතිය පලකරනවා. කුරුවිට නගරයට අදාලව අපි බොහෝ කරුණු සාකච්ජා කළා. වෙළඳ නාමපුවරු ප්‍රමාණය, ස්ථාන, නගරේ පුවරු පිරිලා. පසුගියදා අර පීපල්ස් කේක් කඩේ ලඟ ඇහැළ ගහ කපලා. එතන නාමපුවරුවක් ගහලා තියෙනවා. ඒකේ තිබුණ දුරකථන අංකයට කතා කළා. ඒතකොට කියනවා අපි මුදල් ගෙවලා තියෙන්නේ කියලා. ලොකු මුදලක් ගෙවනවළු. පුද්ගලික පන්තියක්. පස්සේ අපි කරුණු කිව්වා. ගහ කැපීම ගැන. පස්සේ

පුවරුව අයින් කරලා. මුදල් ඉපයීමේ මාර්ගයක් තමයි. නමුත් එය විධිමත්ව නගරයට ක්‍රමවත් හා  අලංකාරයක් එන ලෙස තිබිය යුතුයි.

ගරු උප සභාපති  අනිල් ලියනගේ මහතා -

පළාත් පාලන ආයතනයක් ලෙස මේ නාමපුවරු සඳහා නිර්ණායක තියෙනවා. වර්ග අඩියකට අයවිය යුතු මුදලක් තියෙනවා. වසරක් පාසා අළුත්කරනවා. නමුත් මේ නාම පුවරු කිසිදු නිර්ණායකයක් නැතිව සවි කරලා. රථවාහන ගමනාගමනයටත් බාධා. ඒ නිසා මේක ක්‍රියාවට නැංවීම සඳහා ආදායම් පරිපාලක නිර්දේශ ගන්න. විධිමත්ව නැති ඒවා අයින් කරන්න. තව සමහර දැන්වීම් පුවරු වල වෙනත්අයගේ දැන්වීම් ද ඇතුලත්. උදාහරණයක් සමන්ත ස්ට්‍රෝර්ස් එකේ නාම පුවරුවේ ලියෝබ්‍රදර්ස් පිලිබඳව තියෙනවා වගේ. ඒවාටත් අපිට අයකරන්න පුළුවන්. හෝටල් වල නාම පුවරු වල නෙස්ටොමෝල්ට් දැන්විම් තියෙනවා.  ඒ වගේමයි පාරේ ගස් කපන්න බෑ. ස්ථානයක් පුවරුවකට දීමේදි  සුදුසු  ස්ථානයක් අදාල නිලධාරියා  මගින් පෙන්වා දිය යුතුයි. ඒ කටයුත්ත ක්‍රමවත්ව කල යුතුයි. මේ නගරයේ විශාල නාමපුවරු හැම තැනම. අළුත් ලොරිපාක්එකෙත් හැමතැනම පුවරු. ඒවා වාර්තාවකට ගන්න. අතුරුව්‍යස්ථා තියෙනවා. ඒවා අනුව කටයුතු කරන්න. ආදායම් උත්පාදන මාර්ගයක්. නමුත් විධිමත්ව ක්‍රමවත්ව විය යුතුයි.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී මංගල ඩයස්  මහතා -

ඉස්සර නගරයේ වෙනම තැනක් තිබුණා දැන්වීම් ප්‍රර්ශනයට. පාලම ලඟ. ඒතැන හැර වෙන තැන්වල ඉඩ දුන්නේ නෑ දැන්වීම් දාන්න. ලොකු ආදායමකුත් ගත්තා. දැන් හැමතැනම පුවරු. මේ ආදායම් ගැසට් කල ඒවා. නමුත් ඒවා නිසි ලෙස වෙන්නේ නෑ. නාමපුවරු සිටුවීමත් පිලිවෙලක් නෑ. කව්රුත් හිටුවනවා. එක ගුරුවරයෙක් අනිත් ගුරුවරුන්ට ගහන්න දුන්නේ නෑ. සමහරු ඒ අය මුදල් ගෙවලා අනිත් අයට අතුරු බඳු දෙනවා. ගෙව්වා වගේ කීපගුනයක් හම්බුකරනවා. නගරේ හැමතැනම  බෝඩ්. හැමතැනම බඩු දාලා. ලොරි හැමවෙලේම  ගහලා. ඒවා අයින් කරන්නේ නෑ. ඒ තැන්වලම තියෙනවා. වෙන වාහනයක් හදිසියට දාන්න විධිහක් නෑ. දැන්විම් ඒවාත් ඒ විධිහමයි. පාර පේන්නේ නෑ. මේ සභාවේ අවසරනැතිව ඒවා කරන්න බෑ. දැණුවත් කරන්න.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී එච්.වී. මහින්ද  මහතා -

මාර්ගයේ සංඥා සළකුණු දාලා තියෙන්නේ මගින්ගේ ආරක්ෂාවට. ඒ ස්ථාන දර්ශනය නොවන ලෙසත් පුවරු ගහලා. අනතුරු වෙනවා. සංඥා තියෙනවා දිශාව සහිතව ස්ථාන දක්වලා මාර්ගයේ ගෙන ගියහැකි ටොන් ප්‍රමාණ නීත්‍යානුකූලදේ. නමුත් විශාල අනතුරු වෙලා තියෙනවා. ඒ දේවල් නිසිලෙස ප්‍රදර්ශනය නොවීම නිසා. සමහර පුවරු දිරලා. නිසි ප්‍රමිතියට හදලා නැතිවත් ලොකු හානි වෙනවා. ඒවා ස්ථානගත කරිම් වගේම නුසුදුසු කොන්ත්‍රාත්කරුවන් නිසා බාල ලෙස ප්‍රමිතියක් නැතිව හදලා ජීවිත විනාශ වෙනවා. ඒ පැත්තත් බලන්න. මුදල් වගේම මේ සවිකරන පුවරුවල ප්‍රමිතියත් බලන්න. පොල වගේ හැමතැනම පුවරු සවි කරන්න දෙන්න එපා. විධිමත්ව කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා -

නගරේ අලංකාරය, විධිමත්බව ආරක්ෂිත බව ආදිය අරමුණුකරගෙන මේ යෝජනාව ඉදිරිපත්කිරිම වැදගත්. කුරුවිට නගරයේත් අවිධිමත් පුවරු රැසක්. මේ පුවරු සවිකිරීමේදි නවීන තාක්ෂනය යොදාගන්න පුළුවන්. ඒක් ස්ථානයක් වෙන් කරලා ඩිජිටෙල් තිරයක ඒවා ප්‍රදර්ශනයට අවස්ථාව දෙන්න පුළුවන්. සභාව මගින් නඩත්තු කළහැකියි. සැළසුම් ශිල්පි සහාය අරන් නගරේ සැළසුම්කරලා සියළු සහාය අරන් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයනෙත්ති මහතා -

අදහස් දැක්විම පිලිබඳව ස්තුතියි. මේ කටයුත්ත සාර්ථකව කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයනෙත්ති මහතාගේ යෝජනාව අනුව කුරුවිට නගරයේ ඇති වෙළඳ නාම පුවරු නියාමනය කර නගරයට අලංකාරයක් එන ලෙස ස්ථාපිත කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයනෙත්ති මහතා -

**06- 18.** සුදාගල පන්සල මාර්ගයේ ඇති පොදු නාන ස්ථානයේ සංවර්ධනය සඳහා රු. **200000.00** ක සහා ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයනෙත්ති මහතාගේ යෝජනාව අනුව සුදාගල පන්සල මාර්ගයේ ඇති පොදු නාන ස්ථානයේ සංවර්ධනය සඳහා රු. **200000.00** ක සහා ප්‍රතිපාදන ලබාදිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයනෙත්ති මහතා -

**06- 19.** සුදාගල පැරණි ජලයෝජනා ක්‍රමයේ යොදා ඇති බට දිරාපත්වී ඇති බැවින් අළුතෙන් බටයොදා ජලනල පද්ධතිය අළුත්වැඩියා කරගැනීමට රු. **500000.00** ක සහා ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයනෙත්ති මහතා -

පැරණිම ජලයෝජනා ක්‍රමයක්. හිටපු මල්කැකුළ සභාපතිතුමා ලක්ෂ පහක් දීලා මේකට නව ටැංකිටක් දැම්මා. ස්තුතියි. මෙවන විට බට දිරාපත්වී ඇති බැවින් අළුතෙන් බටයොදා ජලනල පද්ධතිය අළුත්වැඩියා කරගැනීම සිදුකළ යුතුයි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයනෙත්ති මහතාගේ යෝජනාව අනුව සූදාගල පැරණි ජලයෝජනා ක්‍රමයේ යොදා ඇති බට දිරාපත්වී ඇති බැවින් අළුතෙන් බටයොදා ජලනල පද්ධතිය අළුත්වැඩියා කරගැනීමට රු. 500000.00 ක සභා ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

**06- 20.** වලදූර පරගලතැන්න මාර්ගය කොටසක් කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතාගේ යෝජනාව අනුව වලදූර පරගලතැන්න මාර්ගය කොටසක් කොන්ක්‍රීට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

**06- 21.** ප්‍රාදේශීය සභා භූමියේ සුදුසු ශ්‍රවනාගාරයක් ඉදිකිරිම ට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

පසුගියදා අපි ගියා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තිබුණ අපේ වැඩසටහනකට. පුස්තකාල කමිටුව සංවිධනය කළ සාහිත්‍ය උත්සවය හා තැගි ලබාදීම. ඒ උත්සවය පොඩි අත්සවයක් උනත් නිර්මාණාත්මකව තිබුණා. ස්තූතිවන්ත වෙනවා පුස්තකාල කමිටුවට ඒ කටයුත්ත සාර්ථකව සිදු කිරීම පිලිබඳව. ආරාධනය පිළිඅරන් ගියාට දුකකුත් ඇතිඋනා. ඒ උත්සවය තිබ්බෙ අපේ තැනක නෙමේ. අපිට ශ්‍රවනාගාරයක් නෑ.

කලින් අපිට එකක් තිබුණා. ඒක සංස්කෘතික මධ්‍යස්ථානය දාගන්න දීලා. මුලින් එතන බිලූ ස්ටාර් පෙර පාසැළ දාගන්න දීලා ඒ අය ඉවත් උනාට පස්සේ තාවකාලිකව දුන්නා සංස්කෘතික කටයුතුවලට. ගිවිසුමක් කොන්දේසිත් තිබුනා. එතන බෙර ගහන්න බෑ. ආදී ලෙස. අපේ පුස්තකාලය එතන නිසා. පස්සේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පිටු පස්සේ සංස්කෘතික මධ්‍යස්ථානය හදන්න හැදුවා. සභාවයි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයයි අතර නඩුකටයුත්තක් ආර්භ උනා මේ හේතුව මත. දැන් ඒ නඩුව උසාවියෙන් දෙපාර්ශවය සාකච්චජා කරලා විසඳා ගන්න කියලා බහා තියලා. සාකච්ජාකරලා විසඳා ගන්න. පස්සේ සංස්කෘතික මධ්‍යස්ථානයක් හදන්න පැරඩයිස් ඉඩමක් වෙන්කලා. නමුත් මිනිස්සු පෙත්සමක් අත්සන් කරලා දුර වැඩියි කියලා. පැරඩයිස් එකේ අයත් අත්සන් කරලා. පස්සේ ඒකත් නැති උනා. මේ භූමිය සභාවේ සතුව තිබුනේ. ප්‍රාදේශිය ලේකම් මේ සභාවේ ලේකම් වෙලා හිටියා. සභාව ස්ථාපිත කරපු කාලේ ඉඳන් තිබුණ ඒ භූමිභාගය දීලා නෑ සභාවට. අන්සතු කරගෙන. පරික්ෂා කළ යුතුයි. හිටපු ප්‍රාදේශිය ලේකම් කෙනෙක් සංස්කෘතික දෙපාර්තුමේන්තුවට ඒවා අරන් සභාවේ කිසිදු අවසරයක් නැතිව. මුලින් ඒ අය එකඟ වෙලා හිටියා යන්න. ලක්ෂ 10 ක් සභාව මගින් දෙන්නත් එකඟ උනා. නමුත් පස්සේ ගියේ නෑ. මේ පිලිබඳව හොයලා මේ ඉඩම අරන් හතන හදන්න රැස්වීම් ශාලාවක් අපිට. දැන් මේ සභා ශාලාවේ වෙනත් රැස්වීම් තියන්න බෑ. පහළ තියෙන එක ප්‍රමාණවත් නෑ . ඒ නිසා අපි සභා භූමිය තුළ අපිටම එකක් හදමු. ශ්‍රවණාගාරයක්. ඒ වගේමයි මන්ත්‍රිලා ආවාම තැන තැන ඉන්න වෙලා. නිලධාරීන්ගේ පුටුවල වාඩිවෙලා ඉන්න එකත් සුදුසු නෑ. වාඩිවෙන්න එපා කියලා බෝඩුත් ගහලා. අර එහා පැත්තේ ගබඩා කාමරය හරි හදලා දෙන්න. ජල සම්පාදනය කරන අය ඒ අයගේ තැනකට යවලා හරි මේ ස්ථානයක් හදලා දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

විපක්ෂයේ 19 ක් ඉන්නවා. යම් කටයුත්තකට සභාවට ආවා. මේ රැස්වීම් ශලාවේ තියන්නේ සභා රැස්වීම්. උපසභාපතිතුමාගේ කාමරයේ කීපදෙනෙක් නිතරම ඉන්නවා. මම ලියුම් කීපයක් ලිව්වා ඇත්තටම තැනක් නෑ ඒවා කරන්න. ඔබතුමාත් විපක්ෂයේ හිටියා. මේ කටයුත් කරන්න තැනක් දෙන්න. ලේකම්තුමාටත් කිව්වා. අපි කැමති නෑ නිලධාරින්ගේ ෂීට් වල වාඩිවෙන්න. විපක්ෂයේ 19 ටත් ස්ථානයක් දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

ශ්‍රවනාගාරයක් හදමු යෝජනාව. කව්රු පාලනය කළත් සභාවට සංස්කෘතික කටයුතු වැඩසටහන් කරන්න තැනක් ඕනි. දැනට සභාවට අත්පත්කරගෙන තියෙන ඉඩම් බලමු. බණ්ඩාරවත්ත මොන්ටිසෝරිය හදලා තියෙන්නේ අපේ ඉඩමක. අපේ ගොඩනැගිල්ලේ කැල්ලක. එළිමහන් රංගපීඨයක්, සීමිත කාණ්ඩයකට සුහද හමුවක් වගේ දෙයක් කරන්න සුදුසු පරිසරයක්. ඒ වගේ සුදුසු තැනක මේක හදමු. නගරයට ආසන්නයේ නම් වඩා සුදුසුයි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මේ සම්බන්ධයෙන් අපි සාකච්ඡා කළා. පුස්තකාලය තියෙන තැන සංවර්ධනය කරනවා. ජල ගොඩනැගිල්ල තියෙන තැන ප්‍රතිපාදන තියෙනවානම් තව එකක් හදන්න පුළුවන්. උපසභාපතිතුමා අදහස්දැක්වූවා බණ්ඩාරවත්ත ඉඩමේ එළිමහන් රංගපීඨයක් හදන්න. යම් බාහිර පාර්ශවයක් සම්බන්ධකරගෙන යම් අදහසක් හදාගෙන නිශ්චිතව යෝජනා අරගෙන සභාවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතාගේ යෝජනාව අනුව ප්‍රාදේශීය සභා භූමියේ සුදුසු ශ්‍රවනාගාරයක් ඉදිකිරිම ට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

**06- 22.** කුරුවිට ගල්ගොඩැල්ල පාර කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතාගේ යෝජනාව අනුව කුරුවිට ගල්ගොඩැල්ල පාර කොන්ක්‍රීට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා -

**06- 23.** කුරුවිට ප්‍රාදේශීය සභාවේ කිරිඇල්ල පෙර පාසැලේ **2022** වර්ෂයේ සිට කිසිදු දිමනාවක් රහිතව සේවය කරන නිම්නා අංජානි කල්දේරා ගුරුවරියට මාසික වැටුපක් හෝ දිමනාවක් ලබාදිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා -

මේ යෝජනාව පිලිබඳව ගැටළු තියෙනවා. මේ යෝජනාව දැනට පෙරපාසැලේ ඉන්න පෙර පාසැල් පාලිකාවගේ දියණිය ගැනයි. **2022** ඉඳන් ඉන්න. නමුත් මේ පෙර පාසැලේ ඉන්නවා වසර **13** ක් සේවය කරන දැනට ප්‍රසූත නිවාඩු අරන් ඉන්න දීපිකා කෝනාර කියලා ගුරුතුමියක්. සබරගමු විශ්වවිද්‍යාලයෙන් අදාල සුදුසුකම් ලබා තියෙනවා ඇය. අවුරුදු **13** ක් ඇය සේවය කරලා වැටුපක් නැතිව. ගිය වසරේ සිට ඇයට රු.

**15000.00** ක දීමනාවක් අනුමත කරලා . මේ වන විට ඇය නිවාඩු නිසා දීමනාව නෑ. එතුමිය ප්‍රසූත නිවාඩු ඉවර වෙලා ආයේ එනවා. ඇයගේ සේවය ස්ථිර කරන්න ක්‍රමවේදය හදන්න. නිත්‍යානුකූලව. මේ පෙරපාසැලේත් විවිධ අක්‍රමිකතා වෙනවා. විදුලි බිළ , ළමයි බඳවාගැනීමේ පටිපාටිය දෙමාපියන් පැමිණිලිකරනවා. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයට ළමයි **45** ක් විතරක් ගන්න කියලා තිබුණත් **60** ක් අරන්. ඇතුලත් වීමේ ගාස්තු , මාසික දීමනා, ළමයින්ට තෑගි දෙන්න මුදල් මුදල් එකතු කරලා. තීන්ත ආලේපකරන්න රු. **500** ගානේ එකතු කරලා. නමුත් මේ සභාවෙන් තෑගි දෙන්න තීන්ත ගාන්න ආදියට වෙනම මුදල් දුන්නා. ඒ වගෙම මේ පාලිකාව පුද්ගලිකව ඉංග්‍රිසි පන්ති දාලා. මුදල් අයකරලා. ඒක ළමයින්ට අනිවාර්ය කරලා. නිදහස් අධ්‍යාපනයක් නෑ. මේ පාලිකාව තමන්ගේ දුවව ස්ථිර කරන්න ඉල්ලීම් කරලා. නමුත් වසර **13** ක් සේවය කළ කෙනාව ස්ථිර කරන්න ඉල්ලලා නෑ.මේ කටයුත් සාධාරණ කරන්න. රු. **2500.00**ක් එකතු කරලා නැටුම් ඇඳුම්වලට කියලා. තීන්ත ගාන්න රු. **500** ගානේ හැටක් රු. **30000** ක්. මේවා වෙන්න තියන්න එපා. සභාවෙන් නිදහස් පෙරපාසැලක් පවත්වාගෙන යනවා කිව්වට අරමුණ සිද්ධ වෙන්නේ නෑ. සේවාවක් ලෙස පවතින්නේ නෑ. මේ පිලිබඳව විශේෂ අවධානය යොමු කරන්න.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

මාස කීපයකට පෙර මම යෝජනා කළා එල්ලාවල නිදහස් පෙර පාසැලක් හදන්න. ඒ යෝජනාව සම්බන්ධව මොකද උනේ. සිහිකැඳවීමක් කරන්න. මහාභාරකාරතැනගේ ලිපිනය දෙන්නම්. පූර්ව ළමා විය සංවර්ධනයට අදාළවයි ඒ යෝජනාව කළේ. මේ පෙර පාසැල් ප්‍රමිතිකරණය විය යුතුයි. **2026** අපේ සභාවේ පෙර පාසැලත් ප්‍රමිතිකරණය කරමු. ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම් පෙර පාසැල් ප්‍රඥප්තියේ හා සබරගමු පළාත් සභාවේ පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ නිළධාරින් ලබාදෙනවා. සභාවක් විධිහට අපි මේ පෙර පාසැළට විවිධ උපකරණ දුන්නා. වසර **13** ක් නොමිළේ උගන්වපු ගුරුතුමිය උපාධික් හා වෙනත් අවශ්‍යතා සම්පූර්ණ කළ අයෙක්. ප්‍රමුඛතාවය දෙන්න. කාටර් එකට ඇතුළත් කරන්න බලන්න. පෙර පාසැලේ මුදල් එකතු කරන්න බෑ. තෙප්පනාවේ තිබුණා එහෙම පෙර පාසැලක්. අවසානයේ උන දේ දන්නවා. මුදල් එකතු කරලා දෙමාපියන්ට වැයබරක් දෙන්න එපා. ටියුෂන් ක්ලාස් බෑ. ඒවට එන්න කියලා ළමයින්ට පෙළඹවීම් කරන්න බෑ. අපිත් මොන්ටිසෝරි ගියා. ගල්ලැල්ලේ රූප ඇන්දා. නමුත් මේ විධිහට ටියුෂන් බෑ. මේ සියල්ල සළකා බළලා වසර **13** ක් සේවය කළ ගුරුවරිය ඒ සුදුසුකම් සනාථකරගෙන ස්ථිර කරන්න. මේ යෝජනාව ආණ්ඩුකාරතුමියට යොමු කරලා හෝ ඉදිරි කටයුතු කරන්න. විධිමත් ලෙස මේ පෙර පාසැල නියාමනය කරන්න. අපිටත් එල්ලාවලට පෙර පාසැලක් ඕනි. ඒ ඉදිරි කටයුතු කරන්න. කුඩා මල්කැකුළු වලට නිදහසේ අධ්‍යාපනය ලබන්න හැකි ලෙස මේ පෙර පාසැළ සංවර්ධනය කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -</u>

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක අකුරු උගන්වන්න බෑ. අවසර නෑ. එතන වෙන තැනක ඉංග්‍රිසි උගන්නනවා. **2025. 10. 15** ප්‍රසූත නිවාඩු ලබලා ඉන්න දීපිකා කෝනාරමිය ගේ නිවාඩු කාලය අවසන් වෙලා නෑ. ලේකම්තුමා ලිපියකුත් ඇයට

යොමු කරලා. නැවත එන දිනය අහලා. ගිවිසුම අළුත් කරන්න. මටත් ඒ පිටපතක් ලැබුණා. මුලින් මේ කෝනාර මියට අවරුදු 13 ක් නොමිලේ වැඩ කළ නිසා අසාධාරණයක් නොවන ලෙස කටයුතු කරන්න. එතුමිය සේවයට ගන්න. අසාධාරනයක් කරන්න එපා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා -</u>

පැහැදිලි කිරිමක් කරන්න අවශ්‍යයි. මට ඉල්ලීමක් කළ නිසායි මේ යෝජනාව ඉදිරිපත් කලේ. සියළු කරුණු සලකලා බලලා තියෙන ප්‍රතිපාදන අනුව සාධාරනයක් වෙන ලෙස කටයුතු කරන්න.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-</u>

සභාවේ පෙර පාසැලේ මේ වන විට අනුමතව ඇත්තේ එක් ගුරු තනතුරක් විතරයි. ආණ්ඩුකාර අනුමැතියෙන් සේවා ගිවිසුම් මත බඳවා ගත්ත ගුරුතුමිය ප්‍රසූත නිවාඩු ගිහින්. අපි ඉල්ලා තියෙනවා මේ පෙර පාසැලට ගුරු තනතුරු දෙකක්. ආණ්ඩුකාර අනුමැතිය ලැබුනොත් ස්ථිරව ගන්නවා. ආණ්ඩුකාර අනුමැතියත් එක්ක අපි බලාපොරොත්තු වෙනවා ඒ කටයුතු කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතාගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ කිරිඇල්ල පෙර පාසැලේ 2022 වර්ෂයේ සිට කිසිදු දිමනාවක් රහිතව සේවය කරන නිම්නා අංජානි කල්දේරා ගුරුවරියට මාසික වැටුපක් හෝ දිමනාවක් ලබාදිම සම්බන්ධව දැනට පෙරපාසැල් ගුරුසංඛ්‍යාවක් අනුමත කරදෙන ලෙස ඉල්ලා ඇති අතර පෙරපාසැල් ගුරු අනුමත සංඛ්‍යාව ප්‍රමාණවත් පරිදි වැඩිවී ලැබෙන තෙක් දැනට ස්වේච්ඡාවෙන් වැඩි කාලයක් සේවය කර ඇති පෙරපාසැල් ගුරුවරියන් අතරින් දීපිකා කෝනාර මිය හට ප්‍රසූත නිවාඩු අවසන්ව සේවයට පැමිනෙන දින සිට ගිවිසුම් ගතව දීමනාවක් සහිතව සේවය කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දිමටත් අනුමත තනතුරු සංඛ්‍යාව වැඩිකරගත් පසු අනෙක් පාලිකාව සඳහාද දිමනාවක් සහිතව බඳවාගැනිමට කටයුතු කිරිමටද ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා -</u>

**06- 24.** කිරිඇල්ල ඉඩංගොඩ පොදු වෙළඳ ගොඩනැගිල්ලේ ඉදිකරන ලද වැසිකිලි දෙකෙන් එකක් නගරයට පැමිනෙන අය සඳහා භාවිතා කිරිමට තාවකාලිකව නව වැසිකිලි සංකීර්ණය ඉදිකරනතුරු ටෙන්ඩර් ක්‍රමවේදයට හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයකට කටයුතු කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා -

පොදු වෙළඳ ගොඩනැගිල්ලේ වෙළෙඳුන් දැනුවත් කරලා මේ කටයුත්ත කරමු. විශාල ජනතාවක් මේ අවශ්‍යතාවය නොමැතිකමින් ගැටළුවට පත් වෙලා. 2025.11.21 තිබුණ කඩ කමිටුවේ මේගැන සාකච්ඡා කළා. වාර්තාවේ අංක 12 යටතේ දක්වා තියෙනවා කමිටුවක් පත්කරලා කඩ හිමියන්ගේද අදහස් විමසලා කරමු කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

මේ ටොයිලට් ගැන කතා කලේ. මේ අවස්ථාවේත් සභාවේත් කාර්යාලයේත් වතුර නෑ. මේක අපහසුතාවක්. අවධානය දෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතාගේ යෝජනාව අනුව කිරිඇල්ල ඉඩංගොඩ පොදු වෙළඳ ගොඩනැගිල්ලේ ඉදිකරන ලද වැසිකිලි දෙකෙන් එකක් නගරයට පැමිනෙන අය සඳහා භාවිතා කිරිමට තාවකාලිකව නව වැසිකිලි සංකීර්ණය ඉදිකරනතුරු ටෙන්ඩර් ක්‍රමවේදයට හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයකට කටයුතු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා විසින් කරනු ලබන යෝජනා -

**06-25.** කිරිඇල්ල රජයේ රෝහලෙන් විශේෂඥ වෛද්‍ය සේවාවන් ලබාදීම සඳහා සභා යෝජනාව සම්මතකර අදාළ අංශ දැනුවත් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -

කිරිඇල්ල රෝහළ අපේ සභා බල ප්‍රදේශයේ ප්‍රධාන සෞඛ්‍ය මධ්‍යස්ථානය. යෝජනාව ක්‍රියාත්මක කිරිමට හැකියාවක් හා අවශ්‍යතාවයක් ඇතැයි මා විශ්වාස කරනවා. මේ යෝජනාව ඉදිරිපත් කලේ ඒ නිසා. මෙය විශාල ජනතාවකගේ අවශ්‍යතාවක්. සෞඛ්‍ය සේවා ලබා දීමේදී කිරිඇල්ල රෝහළ විශාල ප්‍රදේශයක් ආවරණය කරනවා. කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 17 ක් . අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය බොහෝම දුෂ්කර ප්‍රදේශයක්. ඇහැලියගොඩ ප්‍රාෙද්ශිය ලේකම් කොට්ඨාශයේ කරදන ආශ්‍රිත ප්‍රදේශය. ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එගොඩ කහවත්ත, කඩුගම්මුල්ල වගේ ප්‍රදේශ. මේ ප්‍රදේශවල බොහෝ ජනතාවට රත්නපුර, අවිස්සාවේල්ල, හොරණ වගේ නගරවලට ගිහින් විශේෂඥ වෛද්‍ය සේවා ලබාගැනීමට තරම් ශක්තියක් දැනුවත් බවක් ඒ නිසාම උවමනාක් නෑ. මේ නිසා ජීවිත අවධානමක් ඇති රෝගී තත්වයක් පවා බොහෝවිට හඳුනාගැනෙන්නේ පමාවෙලා. ඒ නිසා ගොඩක් අවාසනාවන්ත තත්වයක් උදාවෙන්නත් ඇති. අපේ සභා බල ප්‍රෙද්ශයේ නොවුනත් මෙය ඇහැලියගොඩ

රෝහළටත් පොදු තත්වයක්. කිරිඇල්ල ඉතා පැරණි රෝහලක්. පසුගිය වසර කීපයේ දානපතියන්ගේද ආධාර ඇතිව යම් යම් සංවර්ධන කටයුතු සිදුවී තියෙනවා. අපි හැමදාමත් කිරිඇල්ල සංවර්ධනය විය යුතුයයි කියලා කතා කරනවා. මෙතනදි හයිලයිට් විය යුතු ආයතනයක් කිරිඇල්ල රෝහල. පසුගිය වසර 20-30 ඇතුළත මහා විද්‍යාලය මධ්‍ය මහා විද්‍යාලයක් බනට පත් උනා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් ස්ථාපිත වෙලා අංග සම්පූර්ණ කාර්යාලයක් ලැබී තියෙනවා. නිවසක කුලී පදනම මත පවත්වාගෙන ගිය පොලිස් ස්ථානය වෙනුවට අංග සම්පූර්ණ කාර්යාලයක් ලැබී තියෙනවා. ප්‍රධාන මාර්ගය ඇතුළුව මාර්ග පද්ධතිය සංවර්ධනය වෙලා. දැන් අපි රෝහල සම්බන්ධව වැඩි අවධානයක් යොමු කළ යුතුයි. ඒක අපේ වගකීම. සභාවෙන් කළ හැකි දේ කරමු. අදාළ අංශ දැනුවත් කරලා ඉල්ලීම කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා -

කිරිඇල්ල පර්යන්ත රෝහල එක පැත්තකින් දියුණු වෙලා. ඒ රෝහලේ අපිත් උපත ලැබුවා. ප්‍රසූතිකාගාරය අද නෑ. ගිය අවුරුදු කීපයේදිම සංවර්ධනයක් වෙලා නෑ. මෝචරිය කඩා වැටිලා. හදිසි මරණ පරික්ෂන කරන්නේ රත්නපුරයට ගෙනිහින්. එතන ඕපීඩී එකේ තියාගෙන. රෝහල නමට වැඩක් නෑ. දැන් ඉන්න ඩීඑම්ඕ හොඳ අත්දැකීම් බහුල කෙනෙක්. බාහිර ප්‍රතිකාර අංශයේ බෙහෙත් දීම හොඳට කරනවා. කාර්යමණ්ඩලයට උපදෙස් දීලා හොඳට සේවාවන් පවත්වාගෙන යනවා. ඒ රෝහලටයි විශේෂඥ සේවාව ඉල්ලන්නේ. මෝචරියකුත් ඉල්ලනවා. මඩබද්දර, කැටේපොල වගේ පිරිස් රත්නපුර රෝහලට යන්න ඕනි දරු ප්‍රසූතියක් සඳහා. ඒනිසා ජනතාවගේ ඉල්ලීමක් තියෙනවා සූතිකාගාරයක් සඳහා. ඉඩකඩත් තියෙනවා. විශාල පිරිසකට සේවය සළසන්න පුළුවන්. විශේෂඥ වෛද්‍ය වරුන්ගේ සේවය ලබාදුනහොත් ආර්ථික දුෂ්කරතා ඇති බොහෝ පිරිසකට පහසුවක් වෙනවා. රබර්කැල්ලේ තේ කැල්ලේ සේවය කරන මිනිස්සුන්ට ඇත්තටම විශාල ආර්ථික සහායක් වෙනවා. කාලය, ශ්‍රමය, මුදල් සියල්ල පිරිවැය අවම වෙනවා. මූලික ලෙස රෝග හඳුනාගෙන රුධිර පරික්ෂණ වගේ දේට වැඩිදුර ප්‍රතිකාර වලට යොමු කරනවා. ග්‍රාමීය රෝහල්වල එසේ ප්‍රතිකාර කිරීමෙන් මහරෝහලට විශාල මුදලක් ඉතිරි වෙනවා. ආහාර, ඉන්ධන පිරිවැය අවම වෙනවා. ග්‍රාමීය රෝහලට විශේෂඥ වෛද්‍ය සේවාව ලබාදීම සම්පතක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වි.මහින්ද මහතා -

කිරිඇල්ලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මහතා සහ මහජන සෞඛ්‍ය පරික්ෂක ජනතාව සමග සුහදව කටයුතු කරනවා. දැනට අයාලේ යන සුනඛයින් ගහනය වැඩිවෙලා. අවුරුද්දට 300 ක් විතර ජලභීතිකා රෝගය හැදිලා. ඉස්සර වන්ද්‍යාකරණය කලත් ලගදි ඉල්ලීම් කළාට ආවේ නෑ. සුනඛ ගහනය වැඩිවීම නිසා අවධානමක් එනවා. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල කුරුවිට, කිරිඇල්ල දැනුවත් කරන්න. ඒ සම්බන්ධව අවධානය දීලා කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්සිරි දෙල්ගොල්ල මහතා -

ඇල්ලගාව ආදී ප්‍රෙද්ශ වලත් සුනඛ ගහනය අධිකයි. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ඉස්සර ඒ කටයුතු කළා. අවශ්‍ය පියවර ගත්තා. සභාවේ වගකීමක් මේ සම්බන්ධව කටයුතු කිරිම.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

ජලභිතිකා රෝගය මැඩලීමට සුනඛ සැත්කම් ආදිය පිලිබදව අදාල අංශ දැනුවත් කරනවා. දිනයක් යොදාගෙන කටයුතු කරමු. කිරිඇල්ල කුරුවිට ඒ කටයුතු කරන කාලයක් තියෙනවා. නිශ්චිතව ඒ කටයුත්ත කරමු. විශේෂඥ වෛද්‍ය සේවාවන් සමබන්ධව අදාල අංශ දැනුවත් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්සිරි දෙල්ගොල්ල මහතාගේ යෝජනාව අනුව කිරිඇල්ල රජයේ රෝහලෙන් විශේෂඥ වෛද්‍ය සේවාවන් ලබාදෙන ලෙස අදාළ අංශ දැනුවත් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්සිරි දෙල්ගොල්ල මහතා -

06-26. මඩලවත්ත නිවාස යෝජනා ක්‍රමය මැද පාර ඉතිරි කොටසේ කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

ප්‍රතිපාදන ලැබෙන අයුරින් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්සිරි දෙල්ගොල්ල මහතාගේ යෝජනාව අනුව මඩලවත්ත නිවාස යෝජනා ක්‍රමය මැද පාර ඉතිරි කොටසේ කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්සිරි දෙල්ගොල්ල මහතා -

06- 27. යටිපච්ච පැලවත්ත අන්නාසිවත්ත මාර්ගයේ කැකුණදොළ දක්වා කොන්ක්‍රිට් නොදැමූ අඩි 48 ක කොටස කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවාරච්චි මිය -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

ප්‍රතිපාදන ලැබෙන අයුරින් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්සිරි දෙල්ගොල්ල මහතාගේ යෝජනාව අනුව යටිපච්ච පැලවත්ත අන්නාසිවත්ත මාර්ගයේ කැකුණදොළ දක්වා කොන්ක්‍රිට් නොදැමූ අඩි 48 ක කොටස කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා -

**06- 28.** දෙල්ගමුව ගැමුණු මාවත සෙනුර මහතාගේ නිවස අසල මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.කේ.වී.ධර්මසිරි මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

ප්‍රතිපාදන ලැබෙන අයුරින් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතාගේ යෝජනාව අනුව දෙල්ගමුව ගැමුණු මාවත සෙනුර මහතාගේ නිවස අසල මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා -

**06- 29.** දෙල්ගමුව දළදා මාවත අතුරු මාර්ගයක් වන ආර්.ආර්.සී.පි. රණසිංහ මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී චූලා ශාන්ති මිය -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

ප්‍රතිපාදන ලැබෙන අයුරින් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතාගේ යෝජනාව අනුව දෙල්ගමුව දළදා මාවත අතුරු මාර්ගයක් වන ආර්.ආර්.සී.පී. රණසිංහ මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා -

**06-30.** දෙල්ගමුව සමගි මාවත මාර්ගයේ අබලන්ව ඇති කොටස කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

ප්‍රතිපාදන ලැබෙන අයුරින් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතාගේ යෝජනාව අනුව දෙල්ගමුව සමගි මාවත මාර්ගයේ අබලන්ව ඇති කොටස කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -

**06-31.** වලදූර යහලකොටුන්න බෝධිය අසලින් බෝගොඩැල්ල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි. (රු.ලක්ෂ 10 )

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -

මේ මාර්ගය ඉතා අබලන්. ගෙවල් රැසක් තියෙනවා. පවුල් 1000 ක් පමන පදිංචියි. සමෘර්ධි නිලධාරී නිවසට එහා.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

ප්‍රතිපාදන ලැබෙන අයුරින් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මියගේ යෝජනාව අනුව වලදූර යහලකොටුන්න බෝධිය අසලින් බෝගොඩැල්ල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිමට ( රු. ලක්ෂ 10 ක ) ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>

**06-32.** වලදූර යහලකොටුන්න බෝධිය අසලින් කළුදියවල දෙසට මාර්ගය අනතුරුදායක කොටස ( වංගු) ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි. (රු. ලක්ෂ 5)

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි. ගැටළුවක් තියෙනවා. පරගලතැන්න පාර පුළුල්කිරීමේ කටයුතු අවසන්ද? පාර දෙපැත්ත හාරලා. කාර්මික නිලධාරී ඇස්තමේන්තු ප්‍රමාණයට එහා ගිහින්. අනතුරුදායකයි. ඒපාරේ කටයුතු විධිමත්ව ඉවර කරන්න. ජනතාව පිඩාවට පත් වෙනවා. වැලිගොඩැල්ල ඉඳන් පන්සලටපැත්තට යන පාර. ඒකත් ගැටළුසහගතයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>

ඉහල කොටසේ ස්ථානයක මාර්ගය කැඩිලා. ඒක වහලා දාන්න දැනුම්දීලා තියෙන්නේ.

වැලිගොඩැල්ල මාර්ගයේ වලවල්වහන්න ප්‍රතිපාදන වෙන්වෙලා තිබුනේ. නමුත් ඊට එහා වැඩකොටසක් සිදුකළා. කාණු පද්ධතියත් සුද්දකළා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

කළුදියවල ලඟ වංගුව කෙළින් කල හැකිනම් හොඳයි. අමාරුවෙන් ඒ පාර හැදුවේ. දෙපස ඉඩම් ඉල්ලගෙන පාර පුළුල්කිරිමත් හොඳයි. නමුත් ක්‍රමවේදය හරි මදි. ගල්දාන්න ඕනි තැන්වලට පස් දාලා. මට යන්න බැරිඋනා බලන්න. තාර දාපු එක සම්බන්ධව . හොඳ කොන්ත්‍රාත්කරුවෙක් හොයාගන්න. වැලිගොඩැල්ල ආයෙත් වලවල්. ගෙවීම් අවසන් කරන්න පෙර ඒ පාර සම්බන්ධව බලන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>

බන්ධනාගාරෙනුත් ශ්‍රමදානයක් දාලා වැඩ කළා. කාණු පැදුවා. ස්වේඡාවෙන් වැඩ කලා. ආයෙත් බන්ධනාගාරෙන් දින තුනක් විතර වැඩ කරලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>

රැඳවියන් කාණු සුද්ද කලා. පූර්ණ ලෙස වැහිලා තිබුනේ. දින දෙකක් වැඩකලා අටදෙනෙක්. ඒ පාරේ වලවල් වැහුවා විතරයි බස්එක ගිහින්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

තාර දැම්මාම විනාඩි 15 න් විතර පාර අරින්න පුළුවන්. දින ගනන් වහලා තියන්නේ නෑ. එහෙනම් ප්‍රමිතියක් නැතිව ඇති.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මේ ගෙවීම් කටයුතු කරන්නේ කාර්මික නිලධාරීගේ වාර්තා ලබාගැනීමෙන් පසුවයි. ඊට අදාල පියවර ගන්නවා. ගැටළුවක් වන්නේ නෑ.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මියගේ යෝජනාව අනුව වලදූර යහලකොටුන්න බෝධිය අසලින් කළුදියවල දෙසට මාර්ගය අනතුරුදායක කොටස ( වංගු) ප්‍රතිසංස්කරණය කිරිමට (රු. ලක්ෂ 5) ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන්කුමාරි මිය විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන්කුමාරි මිය -

06-33. අත්වැල්පිටිය මාර්ගයේ කොච්චිමුල්ල වත්ත අතුරු මාර්ගය මිටර් 200 පමන කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන් කුමාරි මියගේ යෝජනාව අනුව අත්වැල්පිටිය මාර්ගයේ කොච්චිමුල්ල වත්ත අතුරු මාර්ගය මිටර් 200 පමන කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන්කුමාරි මිය -

06-34. අත්වැල්පිටිය ඉබ්බන්වෙල සමාධි අසපුව ඉදිරිපිට මාර්ගයේ සමන් මහතාගේ නිවසේ සිට සෝමපාල මහතාගේ නිවස දක්වා කොටස පැතිබැම්මක් දමා කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන් කුමාරි මියගේ යෝජනාව අනුව අත්වැල්පිටිය ඉබ්බන්වෙල සමාධි අසපුව ඉදිරිපිට මාර්ගයේ සමන් මහතාගේ නිවසේ සිට සෝමපාල මහතාගේ නිවස දක්වා කොටස පැතිබැම්මක් දමා කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්. ධර්මසිරි මහතා විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්. ධර්මසිරි මහතා -

**06-35.** ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත්කිරීමේ අරමුනෙන් යුතුව ගම්වාසීන්ගේ කෘෂි නිෂ්පාදන අලෙවිසැලක් ස්ථාපිත කිරිමට සුදුසු ස්ථානයක් කුරුවිට නගරය තුලින් වෙන්කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්. ධර්මසිරි මහතා -

මේ පිලිබඳව සාකච්ඡා කරලා එකඟතා අරන් මැදිහත්වෙමු. ගොවිජනසේවා මධ්‍යස්ථානය මගින් ගම්වාසීන්ගේ කෘෂි නිෂ්පාදන අලෙවිසැලක් ස්ථාපිත කිරිමට සුදුසු ස්ථානයක් විතරයි ඉල්ලන්නේ. ඒ අය සියළු වියදම් දරනවා ඉදිකර ගන්න. ගොවිජනතාවට අවශ්‍ය කෘෂී උපකරණ, පොහොර ආදිය අඩු මිළට ගොවියාට ලබාදෙන්නත් ඒ අය සූදානම්. ඒ සම්බන්ධයෙන් ගොවි සමිති හරහා දැනුවත් කරනවා. සියයට පනහක පමන වට්ටම් ලබාදෙනවා කෘෂී උපකරන ලබා දීමේදි ගොවි සමිති සාමාජිකයින්ට. වෙළඳපළ මිලට වඩා අඩුවෙන් දෙනවා. කොකෝවා, ගම්මිරිස්, කුරුඳු වගේ කුළුබඩු නිසි මිලට අලෙවි කරගන්න අවස්ථාව සැලසීමට බලාපොරොත්තු වෙනවා. සියළු මන්ත්‍රිතුමන්ලාගේ එකඟතාවය දෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්. ධර්මසිරි මහතාගේ_යෝජනාව අනුව ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත්කිරීමේ අරමුනෙන් යුතුව ගම්වාසීන්ගේ කෘෂි නිෂ්පාදන අලෙවිසැලක් ස්ථාපිත කිරිමට සුදුසු ස්ථානයක් කුරුවිට නගරය තුලින් වෙන්කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්. ධර්මසිරි මහතා -

**06-36.** පසුගිය ගංවතුර හේතුවෙන් පැරඩයිස් ප්‍රෙද්ශයේ ජලය බැසයාමට ඇති දැනට අවහිර වී ඇති කාණු පද්ධති ප්‍රතිසංස්කරණය කිරිමට රු. 450000.00 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්. ධර්මසිරි මහතා -

පැරඩයිස් ප්‍රෙද්ශයේ ජලය බැසයාමට ඇති කාණු පද්ධතිය මේ වන විට වැලි පිරිලා වැහිලා. පසුගිය ගංවතුරත් එක්ක මේ වනවිට මිනිස්සුන්ට ළමයින්ට පාරේ යන්න බෑ. බැකෝ එකක් දාලා කාණු ගොඩදාන්න වෙන්නේ.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  දේවින්ද කුමාර මහතා  -

පැරඩයිස්  පොඩිවැව පාර යටපැත්ත. බැකෝදාලා පතල් කපනවා. සභාව දැනුවත් කලාද?

ගරු සභාපති එම්.  විකසිත පුෂ්පසූරිය මහතා -

සභාවෙන් අවසර අරන් නෑ.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  දේවින්ද කුමාර මහතා  -

මගේ ඉඩම එක්කම තියෙන කාණුව වහලා. ප්‍රධාන ඇලවේල්ල. එතනින්  එහාට යන්න බෑ. වේල්ලට අඩි 20ක් 30ක් අයින් කල යුතුයි. නමුත් එසේ කරලා නෑ. සාමාන්‍ය වැස්සටත් වතුර පිරිලා.

ඒ  අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය  ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්. ධර්මසිරි මහතාගේ_යෝජනාව අනුව පසුගිය ගංවතුර හේතුවෙන් පැරඩයිස් ප්‍රෙද්ශයේ ජලය බැසයාමට ඇති දැනට අවහිර වී ඇති කාණු පද්ධති ප්‍රතිසංස්කරණය කිරිමට රු. 450000.00 ක ප්‍රතිපාදන ලබාදිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  කේ.වී.ආර්. ධර්මසිරි මහතා  -

**06- 37.** කොස්ගොඩ ජගත් මහතාගේ නිවස අසල සිට කපිල මහතාගේ නිවස දෙසට කාණු පද්ධතිය පද්ධතිය සංවර්ධනය කිරිමට රු. 50000.00 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්.  විකසිත පුෂ්පසූරිය මහතා -

ප්‍රතිපාදන ලැබෙන අයුරින් කරමු.

ඒ  අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය  ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්. ධර්මසිරි මහතාගේ_යෝජනාව අනුව කොස්ගොඩ ජගත් මහතාගේ නිවස අසල සිට කපිල මහතාගේ නිවස දෙසට කාණු පද්ධතිය පද්ධතිය සංවර්ධනය කිරිමට රු. 50000.00 ක ප්‍රතිපාදන ලබාදිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා  විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා  -

**06- 38.** පොත්දෙනිය විද්‍යාලය භූමිය රජයසතු භූමියක් වන බැවින් ඒ භූමියේ පිහිටි වටිනා දැව ගස් හා ඒ දැව ආරක්ෂා කිරීමේ වැඩ සටහනක් සැකසිමට හා එම භූමියේ කොස්වගා කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

පසුගිය කාලේ මේ පාසැල හොඳ ප්‍රසිද්ධ පාසැලක්. මේ පාසැලින් නීතිඥයෝ පවා බිහි වෙලා තියෙනවා. මේ වන විට ඒ පාසැල වැහිලා. බඩු භාණ්ඩ අස්ථානගත වෙලා. අක්කර පහක ගස් කපලා ඒවා ගෙනිහින්. කොස්ගස් ටිකක් විතරයි තියෙන්නේ. ප්‍රාදේශීය ලේකම් සතු වගකීමක් රජය සතු ඉඩමේ ගස් දැව බිම හෙලනවා. ජනතාව බලාපොරොත්තු වෙනවා මේ ඉඩම ආරක්ෂා කරයි කියලා. මේ පිලිබඳව සොයා බලලා රජයේ සංවර්ධන ක්‍රියාවලියට යොදාගන්න. ගමේ අයට ඕනි විධිහට කරන්න දෙන්න එපා. ඒ නිසා අවධානය දෙන්න. ඉතුරු ගස් හෝ රැකගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා -

පොද්දෙනිය ඒ පාසැල් භූමියේ වටිනා ගස් වගාකිරීම වැදගත්. බල ප්‍රදේශයේම මෙවැනි ගස් වගා කිරිම වැදගත්. ජනතාව අනවසරයෙන් ගස් කපා දමනවා. ඒවිට සිදුවෙන්නේ මේ ප්‍රෙද්ශයේ සම්පත් වැනසිලා විතරක් නෙමෙයි හුස්ම ගන්න තියෙන ඔක්සිජන් ටිකත් නැතිව යන එක. සෑම හැකි තැනකම ශාක වගා කලොත් අපිට ඔක්සිජන් ඉහල දැමිය හැකියි. ඒ නිසා පරිසරය පිලිබඳව හැඟීම ඇති අය එක්ව ගං රක්ෂිත, ඇළ රක්ෂිත වල ගස් හිටවමු. ඒ ගස් හිටවලා රැකගැනීම දරුවන් මගින් සිදුකරවන්න. මී ගස් රක්ෂිතවල සිටුවීමට සුදුසුයි. මම ආර්ඩීබී එක්ක එකතු වෙලා ශාක බෙදා දුන්නා. ඉදිරියේදි පාසැල් සිසුන් ටත් මේ ශාක බෙදාදීමේ වැඩසටහනක් කරනවා. මීගස් කුඹුක්ගස් සිටුවා ආරක්ෂා කිරිමට ගුරුවරුන් මගින් සිසුන්ට පවරා ශිෂ්‍යත්ව ලබාදී ඔවුන්ව දිරිගැන්වීමත් සුදුසුයි. කොස්ගස් විශාල ලෙස කපනවා. කොස් වගාව ප්‍රචලිත කිරිමත් වැදගත්. මේ අහාරයට ඉතාමත්ම වැදගත් කොස් ගස් මේ පළාතෙන් තුරන් වෙන්නත් පුළුවන්. ඒ තරම් කොස්ගස් කපනවා. වගා කිරීම ඉතා වැදගත්. මේ මී ගස් කුඹුක්ගස් ගංඉවුරුවල සිටුවීමට දායක වෙන්න කියලා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා -

මගේ කොට්ඨාශෙ මේ පාසැල පොද්දෙනිය පරගහවත්ත විද්‍යාලය. ඒ පාසැල මේ වන විට අතහැරලා දමලා. පාසැල පැවැත්වෙන්නේ නෑ. එතන වටිනා ගොඩනැගිල්ලක් හා හොඳ ඉඩකඩක් තියෙනවා. ආරක්ෂා කොට යම් කටයුත්තකට යොදාගැනීම වැදගත්. ඒ ඉඩමේ වටිනා ශාක ආරක්ෂා කිරිම කළ යුතුයි. වන වගාවක් සිදු කිරීම කාලෝචිතයි. ඉදිරියේ සංවර්ධන කටයුත්තකට යොදාගමු.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

පොත්දෙනිය වසර 25 ක් විතර වෙනවා වහලා. නාමල්දෙනිය ගොවිජන සේවා එක, සබරගමු පළාත් සභාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, එකතු වෙලා විධිමත් සැළසුමක් ඇතුව ගිය වසරේ මේ භූමිය සම්බන්ධව කටයුතු ආරම්භ කළා. ගොවිපළක් හැදුවා. කොස්

ගස් හිටවන එක හොඳයි. අක්කර 4 ½ ක්. මේ ඉඩම අධ්‍යාපන අමාත්‍යංශය සතු එකක්. ප්‍රාදේශීය ලේකම්ටත් පුළුවන් මැදිහත් වෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

මේ ඉඩමේ තිබුණ ගස් කපා ඉවත් කිරීම පිලිබඳව චෝදනා තිබේද .

මේ අවස්ථාවේදී සභාවේ ගෝෂා පැවතිණි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>

අදහස් දැක්වූ සැමට ස්තුතියි. මී ගස් හිටුවීම පිලිබඳව අදහස් දැක්වූවා. ඒකත් වැදගත් ව්‍යාපෘතියක්. මී පැල අපිටත් දෙන්න. ඒ වගා කටයුතු අපිත් කරනවා.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ යෝජනාවේ අදහස් එකතුකරගෙන පොත්දෙනිය විද්‍යාලය භූමිය සම්බන්ධව අදාළ අංශ, ආයතන දැනුවත් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාව අනුව පොත්දෙනිය විද්‍යාලය භූමිය රජයසතු භූමියක් වන බැවින් ඒ භූමියේ පිහිටි වටිනා දැව ගස් හා ඒ දැව ආරක්ෂා කිරීමේ වැඩ සටහනක් සැකසීමට හා එම භූමියේ කොස්වගා කිරීමට මැදිහත්වීමට හා අදාළ අංශ දැනුවත් කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>

**06-39.** කුරුවිට ප්‍රාදේශීය සභාව සතු වටප්පිටිය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ සායනයේ රූපවාහිනිය අළුත්වැඩියා කිරීමට රු. 40000.00ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>

මේ සෞඛ්‍ය මධ්‍යස්ථානය සභාව සතු එකක්. මම මැදිහත් වෙලා හිතවත් අයෙක්ගෙන් මේ ඉඩම සභාවට ගත්තේ. නාමල් රාජපක්ෂ මහත්තයා. විවෘත කලේ 4 සැසි වාරේ. මේ මාතෘ සායනය වැදගත් ප්‍රෙද්ශයට. ඒකේ රූපවාහිනිය අකුණකට පිච්චිලා. පවුල් සෞඛ්‍ය නිලධාරිය මිළ ගනන් තුනක් අරන් ඒක හදන්න. ඩික්ස් ප්ලේ දාන්න වෙලා. රු. 40000.00 ට දාන්න පුළුවන්ලු. ප්‍රසම්පාදනය බලලා හදලා දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා -</u>

තිවංක ඉලෙක්ට්‍රිකල් එකෙන් රු. 35000.00 ට හදලා දෙනවා කියලා. නමුත් සෞඛ්‍ය නිලධාරියා කතා කරලා රාජපක්ෂ හදලා දෙනවා කියලා. ඒ තීරණය මත මෙතනට ආවරෙ. 40000.00 ට කරන්න. ලිපිලේඛණ වියදම එක්ක. රු. 40000.00 ක් කියලා.

ඒතන සෞඛ්‍ය මධ්‍යස්ථානයේත් ප්‍රශ්න. පැති බැම්ම නෑ. ඒ ගොඩනැගිල්ලේ බිත්ති පුපුරලා. ගැටළු තියෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>

මේ රූපවාහිනියේ ඩිස්ප්ලේ පිච්චිලා. තිවංක එකෙන් තව මිළ ගනන් වැඩි ඒවා ඉදිරිපත්කරලා තියෙන්න්. කොහොම නමුත් ප්‍රසම්පාදන ක්‍රමයක් නැවත කරලා හරි මේ රූපවාහිනිය හදලා දෙන්න.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

රූපවාහිනිය පිලිබඳව ලිඛිතව විස්තර යොමු කරන්න. නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාව සතු වටප්පිටිය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ සායනයේ රූපවාහිනිය අළුත්වැඩියා කිරිමට රු. 40000.00ක ප්‍රතිපාදන ලබාදිමට නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>

**06-40.** වටප්පිටිය අරුනළු ක්‍රිඩා පිටියේ ඉදිකර ඇති දුරකථන තරංග කුළුනේ ආරක්ෂිත කැමරා පද්ධතියක් සවිකර එම දත්ත කුරුවිට ප්‍රාදේශිය සභාව දැනුවත් කර ඇහැලියගොඩ පොලිසියට ලබාගැනීමට මැදිහත්විමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>

මේ කුළුණ ඩයලොග් සමාගමට අයත්. සෑම මසකම රු. 8000.00 ක් අරුනළු ක්‍රිඩා සමාජයට ගෙවනවා. ඒකේ. විදුලි බිල ගෙවිමට. එතන තියෙන දුරකථන තරංග කුළුනේ ආරක්ෂිත කැමරා පද්ධතියක් සවිකරන්න. අදාල අංශ දැනුවත් කරන්න. එසේ කලොත් සභාවේ අනුදැනුම මත වටප්පිටිය නගරයේ මත්ද්‍රව්‍ය වෙළදාම ආදිය පිලිබඳව තොරතුරු පොලිසියට දෙන්න පුළුවන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා -</u>

වටප්පිටිය මංසන්ධි පාරවල් හතරක් එකතු වෙන තැනක්. සීසීටීවී දර්ශන වැදගත්. අපරාධ මංකොල්ලකෑම් මත්ද්‍රව්‍ය ආදිය සම්බන්ධව නතරකරන්න මැදිහත්වීම් ලබාදෙන්න පුළුවන්.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

වටප්පිටිය ක්‍රිඩා සමාජය පැරණි එකක්. ඒ කුළුනේ මුදල් ක්‍රිඩා සමාජය පරිහරනය කරනවා කිව්වා. සභාවේ අවසරය අරන් මේ කුළුන සවිකරලා. ක්‍රිඩා පිටියේ විදුලි බිල. මේ බිල ගෙවනවා ඇති. ඒ බිල බලන්න.වටප්පිටිය හන්දියේ වැසිකිලියක් හදලා තිබුනා . ඒක

දින කීපයයි තිබුනේ. වැසිකිලි හදනවානම් වතුර දෙන්න. වැසිකිලි හැදුවට වැඩක් නෑ වතුර නැත්නම්. කුරුවිට නගරයේ දියුණුව වගේම වටප්පිටිය වගේ උප නගරවලත් දියුණුව අවශ්‍යයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා -

වටප්පිටිය සීඝ්‍රයෙන් දියුණුවෙන නගරයක්. කලින් ස්ටේෂන් එක තිබුණා. නැවත කෝච්චිය ආවොත් හොඳයි. සීසිටීවී හයි කරන්න මුදල් දෙන්න පුළුවන්ද? ඒවාට ප්‍රතිපාදන දිය හැකිද? ක්‍රමවේදයක් බලන්න. කුළුනේ මාසික ගාස්තුව විදුලිබිල ගෙවනවානම් ඒ පිලිබඳව බලන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

ඒ විදුලි බිල ගෙවන්නේ සභා තීරණයකින්. ඒක අනුව බලන්න. රාත්‍රී එලිවෙනතුරු ආලෝකය තියෙනවා. ආරක්ෂිත කැමරාපද්ධතිය පිලිබදවත් ඒ ආයතනයටම කියන්න. ඩයලොග් එකටම. ඉල්ලීම කරන්න. නැත්නම් අරුනළු ගිණුමේ මුදල් ප්‍රමාණයත් බලන්න පුළුවන්.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාව අනුව වටප්පිටිය අරුනළු ක්‍රිඩා පිටියේ ඉදිකර ඇති දුරකථන තරංග කුළුනේ ආරක්ෂිත කැමරා පද්ධතියක් සවිකර එම දත්ත කුරුවිට ප්‍රාදේශිය සභාව දැනුවත් කර ඇහැලියගොඩ පොලිසියට ලබාගැනීමට මැදිහත්විමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

**06- 41.** තිප්පලහේන වතුර ටැංකිය මාර්ගයේ අතුරු මාර්ගය නිලන්ති මියගේ නිවස දක්වා බැකෝ යන්ත්‍රයක් මගින් සකස් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

මුලින් මැනුම්කටයුතු කරලා. ඉඩම් තියෙනවා පාරට දීලා. මෙක දුෂ්කර මාර්ගයක්. සංවර්ධනයක් කරලා නෑ. බැකෝ යන්ත්‍රයක් මගින් සකස් කරලා දෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී_එම්.කේ.විජේසිරි මහතාගේ යෝජනාව අනුව තිප්පලහේන වතුර ටැංකිය මාර්ගයේ අතුරු මාර්ගය නිලන්ති මියගේ නිවස දක්වා බැකෝ යන්ත්‍රයක් මගින් සකස් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

**06- 42.** ඉහල පොහොරබාව කුරුම්බා කඩේ අසල සිට දිසානායක නිවස හරහා මාර්ගය පස් දමා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

වෙලමැද මේ මාර්ගයේ ගෙවල් කීපයක්ම තියෙන මාර්ගයක්. මාර්ගය මේ වනවිට තියෙන තත්වය දුෂ්කරයි. ලොරියකුත් පෙරලිලා. මාර්ගය පස් දමා සංවර්ධනය කරලා දෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතාගේ යෝජනාව අනුව ඉහල පොහොරබාව කුරුම්බා කඩේ අසල සිට දිසානායක නිවස හරහා මාර්ගය පස් දමා සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

**06- 43.** ඉහල පොහොරබාව ඇස්හළ විජේරත්න මහතාගේ නිවස හරහා මාර්ගය කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

දුෂ්කර මාර්ගයක්. සෝදාපාළුවට ලක්වෙලා. අත්‍යාවශ්‍ය මාර්ගයක් කොන්ක්‍රිට් කර සංවර්ධනය කර දෙන්න.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

ප්‍රතිපාදන ලැබෙන ලෙස කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතාගේ යෝජනාව අනුව ඉහල පොහොරබාව ඇස්හළ විජේරත්න මහතාගේ නිවස හරහා මාර්ගය කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා -

**06- 44.** කුරුවිට නගරයේ අයගම කඩය අසල බොක්කුවේ සිට වතුර බැසයාම සඳහා කොන්ක්‍රීට් කාණුවක් සකස් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා -

මෙතන ජලය බැසයාම විධිමත්ව කෙරෙන්නේ නෑ. කොන්ක්‍රීට් කාණුවක් සකස් කිරිමට අවශ්‍යයි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

ප්‍රතිපාදන ලැබෙන ලෙස කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතාගේ යෝජනාව අනුව කුරුවිට නගරයේ අයගම කඩය අසල බොක්කුවේ සිට වතුර බැසයාම සඳහා කොන්ක්‍රීට් කාණුවක් සකස් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා -

**06- 45.** තැඹිලියන දකුණ කොටසේ ගංවතුරින් හානිවී ඇති මාර්ගයේ අතුල මහතාගේ නිවස සිට ඉදිරියට ඇති කොටස කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

ප්‍රතිපාදන ලැබෙන ලෙස කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතාගේ යෝජනාව අනුව තැඹිලියන දකුණ කොටසේ ගංවතුරින් හානිවී ඇති මාර්ගයේ අතුල මහතාගේ නිවස සිට ඉදිරියට ඇති කොටස කොන්ක්‍රීට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා -

**06- 46.** මහදෙනිය ටී.කේ.කුලරත්න මහතාගේ නිවස අසල සිට ඉදිරියට මීටර් **500** ක් කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

ප්‍රතිපාදන ලැබෙන ලෙස කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතාගේ යෝජනාව අනුව මහදෙනිය ටී.කේ.කුලරත්න මහතාගේ නිවස අසල සිට ඉදිරියට මීටර් 500 ක් කොන්ක්‍රීට් කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා -

06- 47. හල්පේ පුංචි තැපැල්ගම ක්‍රීඩා පිටියේ පස් පුරවා සංවර්ධනය කිරීමට රු. 200000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

ප්‍රතිපාදන ලැබෙන ලෙස කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතාගේ යෝජනාව අනුව හල්පේ පුංචි තැපැල්ගම ක්‍රීඩා පිටියේ පස් පුරවා සංවර්ධනය කිරීමට රු. 200000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා -

06-48. හල්පේ සමගි මාවත කාණුපද්ධතිය කොන්ක්‍රීට් ලැලි යොදා ආවරණය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද මහතා -

හල්පෙ සමගි මාවතේ කාණුව. ඒ ස්ථානයේ පාර පටු වෙලා. ගල් ලයිසන් කරපු බැම්මක් තියෙනවා. මීට පෙර විසල් වතුර ගන්න පාර කැපුවා. අඩි පහක් හයක් විතර. මේ කාණුව අනතුරුදායකයි. අවධානය දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -

හල්පෙ එක එක රජයවල් වලින් මාර්ග සංවර්ධනය කරනවා. මෙතන කාණුව කපලා දැන් ස්ලැබ් දාන්න කියනවා. දැලක් වගේ එක්ක දැම්මොත් හොඳයි. ප්‍රධාන පාරෙන් පල්ලමට එන ජලකඳ විශාලයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා -

ලැලි දාලා ආවරණය කරන්න අපහසුයි. පහල ඉඩමට වතුර යනවා. ස්ලැබ් එකෙන් වතුර නවත්වන්න අපහසු වෙයි. ඒ නිසා කාර්මික නිලධාරී එක්ක කතාකරලා සුදුසු දේ කරමු. කානුව අඩි එකහමාරක් පාත් කලොත් ඉඩමදි. පල්ලේ ගෙදරට වතුර යන්නේ නැති විධිහට හදමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

ස්ථාන කීපයකටම දැල් දැම්මාම හොඳයි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා-

කාර්මික නිලධාරි උපදෙස් අරන් කරමු. ප්‍රතිපාදන ලැබෙන ලෙස කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතාගේ යෝජනාව අනුව හල්පේ සමගි මාවත කාණුපද්ධතිය කොන්ක්‍රීට් ලැලි යොදා ආවරණය කිරිම සම්බන්ධයෙන් කාර්මික නිලධාරී උපදෙස්මත ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

**06-49.** ශාන්ත ජෝකිම් දෙමළ මහා විද්‍යාලයේ මැදින් යන මාර්ගය පාසැල් කාලයේ වැසීමට පියවර ගන්නා ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

පාසැල් සංවර්ධන කමිටුව තාවකාලිකව බෝඩ්එක අයින් කරනවළු. උපසභාපතිතුමා මටත් කතාකලා. සම්බන්ධීකරන කමිටුවේ මේ සම්බන්ධව කතාකරලා. මට එන්න බැරිඋනා. දේවින්ද මන්ත්‍රීතුමාටත් කතා කරලා. අපිට යන්න බැරි උනා. ඒ සම්බන්ධිකරනයේදි පාර වහන්න කිව්වාළු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

පාර වහන්න කිව්වාද?

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

පාරවහන්න කිව්වා. විකල්ප මාර්ගය භාවිතා කරන්න කිව්වා.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර්_මහතාගේ යෝජනාව අනුව_ශාන්ත ජෝකිම් දෙමළ මහා විද්‍යාලයේ මැදින් යන මාර්ගය පාසැල් කාලයේ වැසීමට පියවර ගන්නා ලෙස අදාළ අංශ දැනුවත් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

**06-50.** වතුවල කසළ කළමනාකරණය කිරිමට පියවරක් ගන්නා ලෙසට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

වතු වලට ටැක්ටර් යන්නේ නෑ. පුළුවන්නම් කසළ කටයුතු වල යොදවන්න. නැත්නම් වලක් හරි කපලා ක්‍රමවේදයක් සකසන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

වතු නිවාසවලට ටැක්ටර් යන්නේ නෑ. ප්‍රධාන මාර්ගයේ ස්ථාන කීපයක සම්පූර්ණයෙන්ම කසල දමලා. යුධ හමුදා කඳවුර පිටුපස කුණු පුරවලා. සභාවට ටැක්ටරය අරින්න පුළුවන්ද?

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

අපි කසළ කළමනාකරන සැළැස්ම අනුව කසළ වෙන් කරවලා ගන්නේ. දිරාපත්වන හා නොවන ලෙස. දිරාපත්වන කසළ ඒ ස්ථාන වලම පෝර බවට පත්කරවන්න දිරිමත් කරවනවා. කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙන අදාලතැනක දමන්න. දිරාපත් නොවන කසළ මහජන සෞඛ්‍ය පරීක්ෂකට කතා කරලා දින දාගෙන වාහන යවනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

වාහනය එන දිනය දැනුම්දුන්නොත් අපිට පුළුවන් ඒ අවට දැනුවත් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

වතු ආශ්‍රිත කසළ කතා කරනකොට දිද්දෙනිය හෙමින්පෝඩ් වගේ ස්ථාවලත් ඒ තත්වයමයි තියෙන්නේ. අපිට ටැක්ටරය අරින්න නීතිය අනුව ගැටළුවක් නම් ඒ වතු සමාගමෙන් කසළ බද්ධක් වගේ අරන් දිද්දෙනියේ LOLC ඒ වගේ ආයතන වලින් බද්දක් අරන් කරන්න පුළුවන්ද? සමාගමෙන් කසළ බද්ද දෙයි. වටප්පිටිය කඩ මණ්ඩියට ටැක්ටරය එනවා. කසළ තෝරන්න කියලා ඒ ක්‍රමවේදය එතන දන්නේ නෑ. උප කාර්යාලයෙන් කියලා සඳුදා අඟහරුවාදා දිරණ කසළ සිකුරාදා නොදිරණ කසළ. ඒ මිනිස්සු මේක දන්නේ නෑ. පත්‍රිකාවක් හදලා දෙන්න. මම හරි බෙදන්නම්. ටැක්ටරේ එන දින

සටහනක් දළ ලෙස හෝ වේලාවත් දෙන්න. ටැක්ටරේ එනවා. ආපහු හරවගෙන යනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා</u>

ටැක්ටර් තුනයි තියෙන්නේ. හදලා තමා යවන්න වෙන්නේ. කාර්මික කමිටුව ඊයේ තීරණය කළා හදවන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා</u>

දැන් පොහොරබාව ජේසිබි යන්ත්‍රය හදවන්න දාලා. මාසෙකට වැඩියි. බන්ධනාගරෙට කසළ ටැක්ටරය ඇරියාම ඒකෙන් තවත් කසළ දාලා පොහොරබාවට අරිනවා. මේ හදන වාහනත් හරිම ඉක්මනට කැඩෙනවා. ස්ටීරියල් අනිත් පැත්තට සවිකරනවා. ජනතා බදු මුදලෙන් මේ ලෙස වැරදි ලෙස මුදල් වැයවෙන්නේ. දැන දැන මේ ලෙස මුදල් විශාල මුදලක් මාසිකව වැය කරනවා. මේ තත්වය සුදුසු නෑ. ඩෙක්මා එකට අසීමිතව මුදල් ගෙවිම් කලත් ඒවා කිසිම ප්‍රමිතියක් වගකීමක් නෑ. නැවත නැවත කැඩිකැඩී හදනවා විතරයි. ඇයි බැරි වෙනස් කරන්න. අනික ගියවරත් කතා කලා. බන්ධනාගාරයේ පොහොර ව්‍යාපෘතියට වැය කල මුදල්. ඒ වාර්තා විතරක් ලබාදුන්නාට මදි. විගනනයට ඉදිරිපත්කරන්න. ඒ තොරතුරු එක්ක පළාත් සභාවට ඇරියාට වැඩක් නෑ. අල්ලස් දූෂණ එකට, අපරාධ විමර්ශන එකට, දාන්න. මගේ නම යොදන්න. මමයි මේක පැමිණිලි කරන්නේ. සතියක් තුල දාලා. මටත් කොපියක් දෙන්න. මේවා ක්‍රියාත්මක විය යුතුයි. අපිට දැනුම් දුන්නා නීතිඥ ගාස්තුව ගෙවන්න කියලා අධිහාරයක් ලෙස. නමුත් මෙතන සාධාරණයක් තියෙනවාද කියන එක මට සැකයක්. අපි වැරදි නම් ටික ටික හරි මම ගෙවනවා. නමුත් මෙතන අසාධාරනයක් තියෙනවා. මේ ස්ථානයේ සේවය කළ ඇතැම් නිලධාරින් රත්නපුර ප්‍රාදේශිය සභාවට ගිහින් සේවකයෙකුට පහරදීලා. ඒ වගේම මෙහේ එක්නැලිගොඩ ගොවි සංවිධානයෙන් ඒ පුද්ගලයාම රු. 40000.00 ක් ඉල්ලලා. ඒ කිසි දේකට ක්‍රියාමාර්ග නෑ. කසළ පෝර පොහොරබාවේ හදන්න. අමාත්‍යංශ වලට කතා කරලා බන්ධනාගාරේ ව්‍යාපෘතියට යන මාර්ගය අපිට අරගන්න. වතුවල කසළ ගන්නවානම් කි.මී ගානට අයකරන්න ඒ වතු අධිකාරීන්ගෙන්. ඒ සමාගම්වලින්. දිද්දෙනියට වගේ ටැක්ටරයක් අරින එක පහසු නෑ.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා-</u>

කසළ අංගනයේ තියෙන ජේසිබී එක අළුත්වැඩියාවකදි ඒ වර්ගයේ රෙපෙයාර් කිරීම අසීරු කටයුත්තක්. අමතර කොටස් මේවාට වෙන ආයතන වල ඒවාට කොටස් නෑ. ඒ නිසා මේ කටයුත්තෙදි විකල්ප වලට යන්න වෙනවා. අතින් කසළ වෙන්කරලා ගන්න තැනට යන්න වෙනවා. තවදුරටත් ක්‍රියාවලින් වැඩිදියුණු කරමු. මහජන සෞඛ්‍ය පරීක්ෂකවත් උපදෙස් අරගෙන මේ වතු වලත් කසළ වර්ගීකරනය කරලා ඒ අනුවයි කසළ කළමණාකරනය කරගන්න වෙන්නේ. ඒ උපදෙස් අනුව කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර්_මහතාගේ යෝජනාව අනුව වතුවල කසළ කළමනාකරණය සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

**06- 51.** වත්තකඩේ උතුරු ගලුකාගම මාර්ගය අසල පිහිටි පොදු ළිං වලට තාප්පයක් ඉදිකිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

ළිං හයක් විතර තියෙනවා. ඒකක් භාවිතා කරන්නේ නෑ. පවුල් අසූවක් විතර මේ ළිං භාවිතා කරනවා. ගාමන්ට් යන අය ඉන්නවා බොහොමයක් ඒ අය හවස මේ ළිං භාවිතා කරන්නේ. වටේට රබර් ෂීට් දාලා වහලා තිබුනා. දැන් නෑ. සභාව හරහා හැකිනම් මේ කටයුත්ත කරලා දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

මේ ළිං ටික උතුරු ගලුකාගම පාර අයිනේ තියෙන්නේ. අවුරුදු කීපයකට පෙර එක ළිදක් සංවර්ධනය කලා. මල්කැකුළ සභාපතිතුමාගේ කාලේ. පිටිපස්සේ බැම්ම අඩි 15 ක්වත් ගහන්න වෙයි. කාන්තාවන්ට නාන්න ගියාම ගැටළුයි. පාරේ යන අයට පේනවා. ප්‍රධාන පාරට මීටර් පහක් වගේ තියෙන්නේ. කාන්තාවන්ට දරුවන්ට ඒ අයට ප්‍රයෝජනවත් මේ බැම්ම ළිං මිදුලේ ඉඳන් අඩි 10-15 වගේ බැම් කැල්ලක් ගහලා දෙන්න.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා-

මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර්_මහතාගේ යෝජනාව අනුව_වත්තකඩේ උතුරු ගලුකාගම මාර්ගය අසල පිහිටි පොදු ළිං වලට තාප්පයක් ඉදිකිරිම සම්බන්ධයෙන් නීත්‍යානුකූලව ඉදිරි කටයුතු සිදුකිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා -

**06-52.** තුන්අඳහේන අධිකාරිය පන්සල මාර්ගය සංවර්ධනය වන ආකාරය පිලිබඳව සහ එම ක්‍රියාවලිය පිලිබඳව සභාව සතු වගකිම පිලිබඳව කරුණු දැනගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා -

මේ මාර්ගය 1993 ගැසට් උන එකක්. ප්‍රධාන ගම් සභා මාර්ගයක්. මේ රජය ඒ මාර්ගය සංවර්ධනයට දෙකෝටි පනස් ලක්ෂයක මුදල් වෙන් කරලා. මේ රජයට ස්තුතියි. දැනට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. සභාවක් ලෙස මම හිතුවා කාර්මික නිලධාරී අධීක්ෂනය කරයි කියලා. මම ඒ පිලිබඳව විමසුවා. මාර්ග සංවර්ධන අධිකාරියෙන්ළු වෙන්නේ. සභාවේ මාර්ග පිලිබඳව සභාවේ අධීක්ෂනයක් ඕනි. මේක කරනකොට මුලින් මුලදි බෝක්කු හතරක් දාලා කාපට් දානවා කිව්වා. ගමේ අය අරන් වැඩට. හාරලක්ෂ ගානක ලොරි රථ හයර් මගඇරිලා. විශාල මුදලක් පාරට දාලා හරියට නොකලොත් අපිට බනියි. අදාළ අංශ දැනුවත් කරන්න. සුනිල් සෙනෙවි ඇමතිතුමා ඇවිත් ස්ථානය පරික්ෂා කළා. මේ ක්‍රමවේදය වැරදියි කියලා ප්‍රකාශ කලාළු. කළුගඟේ ගිල්ම වැටෙන කොට කාපට් ගැලවෙන මාර්ගයක්. කීපවතාවක් හැදුවත් ගැලවිලා ගියා. මේ අඩුපාඩු දැනුම්දීලා ඇමතිතුමා. විශාල මුදලක් යොදවන්නේ. ගමේ රජයට හිතවත් අය දැනුවත් කලා. මේ පාරේ කාපට් එක ගැහුවට අඩි දෙක හමාරක් දාලා තියෙන්නේ. දෙපැත්ත තද නෑ. කෝලාස් ගහලා නෑ. ප්‍රධාන පාරෙන් ඇතුල් පාර විනාශ වෙලා බෝක්කුව ලඟින්. නඩත්තුවක් නැ. ඒබිසි දාලා අපරාදේ අඩියේ වලවල් හැදෙයි. දෝෂාරෝපණ ලැබෙයි. පරික්ෂන මට්ටමින් මාත් යනවා දැනුම් දුන්නානම්. ඇඹිලිපිටිය කොන්ත්‍රාත්කරුවන්ළු. තොරතුරු ලැබිලා තියෙන විධිහට නිසි ප්‍රමිතියකින් තොර අයළු. වැඩබලන්න ආව පුද්ගලයා දැන් මුදල් ප්‍රශ්නෙකට බන්ධනාගාරේ ගිහින්. මේ ගැටළුව නිසා තවදුරටත් ගල් අදින්න ආපු ලොරි වලට මුදල් දුන්නේ නැත්නම් ඒ අය සේවය කරන්නැළු. ඒ හින්දා නිහඬව හිටයොත් අපරාදේ කාණු නැතිව පාර හදයි. පාර කැඩිලා කුඹුරු වලට යයි. රජය මුදල් වෙන් කල එක ගැන සතුටු නමුත් සභාවෙන් නිසි අධීක්ෂනයක් ඕනි. ලක්ෂ 75 කින් කල හැකිව තිබුණා. සතියක් දෙකක් තියෙයි. මේ ගංවතුර එන මාර්ගයක්. පාරේ කාපට් ගහලා කානු හදනවා කියනවා. රජයේ ඇස්තමේන්තු වෙනස් කරලා හරි මේ පාර රැකගන්න. මේ පිලිබඳව අධීක්ෂනය කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

බොහොම සංවේදී කතාවක් කිව්වේ. අපේ ජනතාවගේ බදු මුදල් මේ සංවර්ධන කටයුතු වලට යොදවන්නේ. නමුත් මේලෙස නුසුදුසුයි. නොකල යුතු වැඩ. ගංවතුරට ගහගෙන යන පාරක් සෝදාපාළුවට ලක්වෙන පාරක් මේ විධිහට හදන එක පිලිබඳව අනාගත දරුවෝ ගැන දුකයි. වගකීම හරියට ඉටු කරන්න. ප්‍රධාන පෙලේ කියන කොන්ත්‍රාත්කරුවන්ගෙන් බලපෑම්ද? වතුරට යන වැඩ කරන්න එපා. හෙට කාපට් දාන්න දෙන්න එපා. බලය යොදවලා නවත්වන්න.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

මේ මාර්ගය සංවර්ධනය කරන්නේ ජනතාවගේ ඉල්ලීමට. ආර්ඩී එකෙන් කොන්ත්‍රාත් කරුවන් යෙදවූවේ. ක්‍රමවේදය අනුව. නොදන්නා ප්‍රකාශ කරන්න එපා. සුනිල් සෙනෙවි ඇමතිතුමා ආර්ඩීඑකට උපදෙස් දීලා නිසි ප්‍රමිතියෙන් මේ මාර්ගය හදන්න

කියලා. ආර්ඩීඑකේ ඉංජිනේරුවන්ගෙන් විමසුවා. තවදුරටත් ප්‍රමිති ගැටළු තියේනම් ඒ පිලිබඳව විමසන්නම්.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතාගේ යෝජනාව අනුව තුන්අඳහේන අධිකාරිය පන්සල මාර්ගය සංවර්ධනය වන ආකාරය පිලිබඳව සහ එම ක්‍රියාවලිය පිලිබඳව සභාව සතු වගකිම පිලිබඳව කරුණු ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා -</u>

**06- 53.** පසුගිය ආපදා තත්වය යටතේ ග්‍රාමීය මාර්ගවල ඇතිවූ සෝදාගෙන යාම් හා ජලය බැස්සවිම ට බෝක්කු (හියුම් පයිප්ප ) ලබාදිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩග්ලස් ප්‍රේමදාස මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා -</u>

පසුගිය ආපදා නිසා හැමතැනම ගංවතුර ආවා. මාර්ග රැසක් ජලයෙන් යට උනා. හැම මාර්ගයක්ම සොදාපාළු උනා. වෙන වෙන විකල්ප ක්‍රම දැම්මට ගංවතුරට විනාශ වෙනවා. හියුම් පයිප්ප නෑ. මේ සභාවෙන් ඒවා දුන්නොත් වැදගත්. වසර 10 කට විතර පෙර මේවා දුන්නා. විදිපහනුත් දුන්නා. දැන් ඊට වඩා වෙනස් ඒවා කරනවා. ග්‍රාමීය මාර්ගවල ඇතිවූ සෝදාගෙන යාම් හා ජලය බැස්සවිම ට බෝක්කු (හියුම් පයිප්ප ) ලබාදීම සිදුකිරිම වැදගත්. අඩි එක හමාරේ වගේ ඒවා. එසේ කටයුතු කිරීම මගින් මේ සෝදාපාළුව වලක්වා ගත හැකියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දේවින්ද කුමාර මහතා -</u>

අපිත් ඉල්ලුවා. යෝජනා දැම්මා. නමුත් ඒවා නොදුන්න නිසා මේ වන විට පාරේ යන්න බෑ. කාණු විනාශ වෙලා පාරත් යටවෙලා. රැකියාවට යන්න බෑ වතුරේ යටවෙලා. හියුම් පයිප්ප නැතිකම. මෝලකැලේ කැන්දලන්ද වගේ ඉස්සර ත්‍රි වීල් තිබුනේ නෑ. දොරකඩ කානුව තිබුනා. දැන් හැම නිවසේම යම් වාහනයක් තියෙනවා. නිවසට වාහනය ගන්න නම් පාර වහලා පස් දාන්න වෙනවා කානුවට. ඒ අය නිතරම ඉල්ලුවා. මේ බෝක්කු. නමුත් ලැබුනේ නෑ. රත්නපුර සභාවෙන් ඒ හියුම් පයිප්ප ගෙනල්ලා. ප්‍රින්ස් එක ලඟ ගොඩගහලා තියෙනවා. මගේ කොට්ඨාශයටත් දෙන්න. ඒවා. ඔබතුමා කාව හරි දාලා කරවන්න. මම ස්ථාන ටික පෙන්නන්නම්. හොඳ යෝජනාවක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා -

මගේ පලමු යෝජනාව ඕක. 2016 ගංවතුර ආපු වෙලේ ආපදා කළමණාකරන රේඛිය අමාත්‍යාංශයට දැනුම් දුන්නා. මේ පිලිබඳව දැනුවත් කරලා ගංවතුරෙන් හානි උන මාර්ග වලට මුදල් ගෙන්වාගෙන හියුම් පයිප්ප දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍ර කුමාර් මහතා -

මේ ගැටළුව මටත් තියෙනවා. මගේ කොට්ඨාශයටත් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -

හොඳ යෝජනාවක්. අපි විපක්ෂේ නිසා ආණ්ඩු පක්ෂෙන් හරි මේ හියුමුපයිප්ප යොදන්න. මුල් කාර්තුවේම දිම වැදගත්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -

මුල් කාලේ ගෙනාවා. ගමට මේක දීම පොඩි දෙයක් උනත් ඒක ලොකු සේවයක් වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

බලවින්නේ තියෙනවා. රාජ්‍ය ආයතන වලට ගන්න පුළුවන්.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

මේ සම්බන්ධව තොරතුරු අරන් ඉදිරි ක්‍රියාමාර්ග ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතාගේ යෝජනාව අනුව පසුගිය ආපදා තත්වය යටතේ ග්‍රාමීය මාර්ගවල ඇතිවූ සෝදාගෙන යාම් හා ජලය බැස්සවිම ට බෝක්කු (හියුම් පයිප්ප ) ලබාදිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර සේනාරත්න මහතා විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර සේනාරත්න මහතා-

06-54. පහළකුරුවිට ග්‍රාමසේවා වසමේ එනසාල්දොළ තණබිම මාර්ගයේ අතරමැද සමන්ත මයාගේ නිවස අසල සිට ඉදිරියට පාර කපා සාදාගැනීමට ද්‍රව්‍ය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -

එම යෝජනාව ස්ථිර කරමි.

මෙම අවස්ථාවෙදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර සේනාරත්න මහතා විසින් මෙම යෝජනාව , පහළකුරුවිට ග්‍රාමසේවා වසමේ එනසාල්දොළ තණබිම මාර්ගයේ අතරමැද සමන්ත මයාගේ නිවස අසල සිට ඉදිරියට පාර කපා සාදාගැනීමට ද්‍රව්‍ය ලබාදීමට නොව, පාර කපා සංවර්ධනය කිරිමට ලෙස සංශෝධනය කරන ලෙස යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය විසින් ස්ථිර කරන ලදී. ඒ සඳහා මහාසභා එකඟතාවය ලැබුණි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර සේනාරත්න මහතාගේ යෝජනාව අනුව පහළකුරුවිට ග්‍රාමසේවා වසමේ එනසාල්දොළ තණබිම මාර්ගයේ අතරමැද සමන්ත මයාගේ නිවස අසල සිට ඉදිරියට පාර කපා සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර සේනාරත්න මහතා-</u>

**06-55.** හිරිකැටිය පාර සෙරෙප්පුහදන නිවස සිට මතුගම මයාගේ නිවස දෙසට ඇති මාර්ගයේ මීටර් 75 ක් පමන සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ඉනෝකා මල්ලව ආරච්චි මිය -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර සේනාරත්න මහතාගේ යෝජනාව අනුව හිරිකැටිය පාර සෙරෙප්පුහදන නිවස සිට මතුගම මයාගේ නිවස දෙසට ඇති මාර්ගයේ මීටර් 75 ක් පමන සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා විසින් කරනු ලබන යෝජනා</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා-</u>

**06- 56.** කඳන්ගොඩ දකුණ වසමේ මැල්වත්තඹිවිටගම ඉහල හේනවත්ත මාර්ගය මිටර් 150 ක දුරක් කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. එම්. ජයසේකර මහතාගේ යෝජනාව අනුව කඳන්ගොඩ දකුණ වසමේ මැල්වත්තඹිවිටගම ඉහල හේනවත්ත මාර්ගය මිටර් 150 ක දුරක් කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා-</u>

**06- 57.** කඳන්ගොඩ දකුණ ග්‍රාමනිලධාරී වසමේ කඳන්ගොඩ පණුගලගාව ළිඳ ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා-

මේ ළිඳේ ගල් ගැලවෙනවා. කෙටි කාලයකින් ගල් ඇල්ලුවොත් ගොඩක් ප්‍රයෝජනවත්. අවුරුදු තිහ හතලිහක් පරණ ළිඳක්. පවුල් පනහක් විතර අය භාවිතා කරනවා. මේ ප්‍රෙද්ශයටම වැදගත් සේවයක් ලෙස සලකලා කරන්න.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

මේ සම්බන්ධව මුදල් ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ  අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය  ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  කේ. එම්. ජයසේකර මහතාගේ යෝජනාව අනුව කඳන්ගොඩ දකුණ ග්‍රාමනිලධාරී වසමේ කඳන්ගොඩ පණුගලගාව ළිඳ ප්‍රතිසංස්කරණය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා-

**06- 58.** කඳන්ගොඩ දකුණ ග්‍රාමනිලධාරි වසමේ එගොඩවලිකීන දෙල්ගහලියැද්දපාර කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ  අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය  ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  කේ. එම්. ජයසේකර මහතාගේ යෝජනාව අනුව කඳන්ගොඩ දකුණ ග්‍රාමනිලධාරි වසමේ එගොඩවලිකීන දෙල්ගහලියැද්දපාර කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රිණී කේ.කේ. දයාවතී මිය  විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රිණී කේ.කේ. දයාවතී මිය  -
**06- 59.** පැරඩයිස් ලේක් සයිඩ් ළමා ක්‍රිඩාංගනය සුද්ද පවිත්‍ර කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ. දයාවතී මිය -

මිට මාස හයකට පෙරත් මේ යෝජනාව දැම්මා. ඒක උනේ නැති නිසා ආයෙත් දැම්මා. ඒ හරියේ පිඹුරෙක් ඉන්නවා. ළමයි කැලේට දුවනවා බෝල ඇහිදින්න. නයි වගේ සතුතු ඉන්නවා. ඒ නිසා ළමයින්ට මේ තැන සෙල්ලම්කරන්න අනතුරුදායකයි. වෙන තැනකුත් නෑ. ළමයි පාරේ සෙල්ලම් කරනවා. ඒකත් අනතුරුදායකයි. දෙමව්පියන්ගෙන් බැණුම් අහනවා ඒ ළමයි. ඒ ළමයි පව්. මේ ක්‍රිඩාංගනය සභාවට පවරාගෙනද දන්නේ නෑ. **2017** ට පෙර එකක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

වැව ළග එක නේද? පොදු බිමේ. ඉඩම් කමිටුවට දාලාද?

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා-

මේ සම්බන්ධයෙන් තොරතුරු අරන් මැදිහත් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මියගේ යෝජනාව අනුව පැරඩයිස් ලේක් සයිඩ් ළමා ක්‍රිඩාංගනය සුද්ද පවිත්‍ර කිරිම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී විජේසිංහ මිය විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී විජේසිංහ මිය -

**06-60.** ගල්අමුණගම ප්‍රජාශාලාවෙන් උඩපාර මිටර් **100** පමන කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සශිකලා මධුභාෂිණී මිය -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී විජේසිංහ මිය -

මේක ගම් වාසීන්ගේ ඉල්ලීමක්. මේ කටයුත්ත සෂිකලා මන්ත්‍රිතුමිය හරහා හරි කරලා දෙන්න. මේක ගම්වාසින්ගේ අත්‍යාවශ්‍ය කටයුත්තක්.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී විජේසිංහ මියගේ යෝජනාව අනුව ගල්අමුණගම ප්‍රජාශාලාවෙන් උඩපාර මිටර් **100** පමන කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී විජේසිංහ මිය -

**06-61.** තැන්නපිටහේන මාර්ගයේ මිටර්100 පමන කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සශිකලා මධුභාෂිණී මිය -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මුදල් ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී විජේසිංහ මියගේ යෝජනාව අනුව තැන්නපිටහේන මාර්ගයේ මිටර්100 පමන කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මධුභාෂිණී මිය විසින් කරනු ලබන යෝජනා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මධුභාෂිණී මිය -

**06- 62.** ගෝණපිටිය සමුපාකාරය පිටුපස ඇති ළිඳ ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිරෝෂා ලියනගේ මිය -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මධුභාෂිණී මිය -

මේ ළිඳ පනහන් විතර පිරිසක් භාවිතා කරන පොදු ළිඳක්. අත්‍යාවශ්‍ය කටයුත්තක්.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මධුභාෂිණී මියගේ යෝජනාව අනුව ගෝණපිටිය සමුපාකාරය පිටුපස ඇති ළිඳ ප්‍රතිසංස්කරණය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මධුභාෂිණී මිය -

**06- 63.** පුවක් හේන පාතගම මාර්ගයේ ඇති බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරිම හා පැතිබැම්ම ඉදිකිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිරෝෂා ලියනගේ මිය -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මුදල් ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මධුභාෂිණී මියගේ යෝජනාව අනුව පුවක් හේන පාතගම මාර්ගයේ ඇති බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරිම හා පැතිබැම්ම ඉදිකිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් ඉදිරිපත්කරනු ලබන යෝජනා-

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 64.** කුරුවිට ප්‍රාදේශීය සභාවේ **2026** වර්ෂයට අදාල වාර්ෂික කාර්යසාධන සැලැස්ම සඳහා මහාසභා අනුමැතිය ලබාදිම සම්බන්ධව සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මෙම සැළැස්ම සියළු මන්ත්‍රීතුමන්ලා වෙත යොමු කර තියෙනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ **2026** වර්ෂයට අදාල වාර්ෂික කාර්යසාධන සැලැස්ම සඳහා මහාසභා අනුමැතිය ලබාදීම ට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 65.** කුරුවිට ප්‍රාදේශීය සභාව මගින් පරිහරණය කරනු ලබන දුම්රිය රක්ෂිත ඉඩම් සඳහා ගෙවිය යුතු රු. **2,765,656.24** ක බදු මුදල දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවීම් කිරිමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මේ සම්බන්ධව තොරතුරු සොයා බැළුවා. රාජ්‍ය ආයතනයක් මගින් අයකරන බද්දක්. අපිට මේ මුදල ගෙවීම නීතිමය අවශ්‍යතාවක්ද වෙනවා. මේ හිඟ බදු ගෙවීම ඉදිරි සමහර

නඩු කටයුතු වලදී අපිට ප්‍රයෝජනවත් වෙනවා. නැතිනම් අපි බදු ගෙවීම පැහැර හැරියා කිව හැකියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

නගරයේ මැද තියෙන ගොඩනැගිල්ල වෙනම බදු දීලා. අපි ඒ බදු ගිවිසුමෙන් ඉවත් වෙලාද? නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කල ගොඩනැගිල්ල. අපිව දැනුවත් නොකරයි දීලා තියෙන්නේ.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

2016 සිට ගෙවා නැති මේ බදු මුදල් ගෙවීම පැහැරහැරීමෙන් මේ බිම් හා ස්ථාන දුම්රිය දෙපාර්තමේන්තුවෙන් වෙනත් පාර්ශව වලට දෙන්න පුළුවන්. ඒ නිසා මේ මුදල ගෙවීම වැදගත් වෙනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාව මගින් පරිහරණය කරනු ලබන දුම්රිය රක්ෂිත ඉඩම් සඳහා ගෙවිය යුතු රු. 2,765,656.24 ක බදු මුදල දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවීම් කිරිමට මහාසභා අනුමැතිය ලබාදීම ට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 66.** කිරිඇල්ල පොදු ක්‍රිඩාපිටිය 2025.12.23 දින මැණුම්කටයුතු සිදුකර නිරවුල් කර ඇති අතර එම ක්‍රිඩා පිටියේ කම්බි කණු සිටුවා කම්බිගැසීමේ ඉදිරි කටයුතු සිදුකිරිමට මහාසභාවේ අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

සුදුසු ලෙස මායිම් නිරවුල් වන ලෙස කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කිරිඇල්ල පොදු ක්‍රිඩාපිටිය 2025.12.23 දින මැණුම්කටයුතු සිදුකර නිරවුල් කර ඇති අතර එම ක්‍රිඩා පිටියේ කම්බි කණු සිටුවා කම්බිගැසීමේ ඉදිරි කටයුතු සිදුකිරිම සඳහා මහාසභා අනුමැතිය ලබාදීම ට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-67.** කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2025.12.12 කාර්මික කමිටුවේ තීරණ අංක 01 අනුව කුරුවිට ප්‍රාදේශීය සභාව සතු මෝටර් බෝට්ටුව නිශ්කාර්යව පවතින බැවින් රත්නපුර

මහනගර සභාවේ ගරු නගරාධිපතිතුමාගේ ඉල්ලීම පරිදි එම බෝට්ටුව රත්නපුර මහ නගර සභාව වෙත ලබාදීම සම්බන්ධව සභා තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

2007 වසරේදි මෙම බෝට්ටුව වැලිගෙපල ප්‍රාදේශීය සභාව සතුව තිබූ එකක්. නමුත් 2007 ජූනි මාසයේදි මෙම ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයෙන් ලබා දී ඇති ඔරු අඟුල් නියමිත ප්‍රමිතියට නොමැති බවත් ඒවා නැවත දන්වන තෙක් භාවිතයට නොගත යුතු බවත් දන්වා ඇත. එසේම 2009 දි මෙම බෝට්ටුව නැවත දිස්ත්‍රික් ආපදා කළමණාකරණ ඒකකයට රැගෙන ඒමට උපදෙස් ලබාදි ඇත. පසුව එම බෝට්ටුව නැවතත් 2015.09.04 දින සබරගමුව පළාත් සභාවේ උපදෙස් මත මෙම ප්‍රාදේශීය සභාවට භාරගෙන ඇත. මෙම බෝට්ටුවේ එන්ජින් අංකය 1003673 වන අතර මාදිලිය EK15MHL වේ. එහෙත් 2025 ඔක්තෝම්බර් මස 20 දිනැති විගණනය අනුව එම බෝට්ටුව මෙම සභාව මගින් කිසිදු ප්‍රයෝජනයට නොගෙන පවතින බවත් ගංවතුර ආපදාවලදි ප්‍රයෝජනයට ගතහැකි ප්‍රාදේශීය සභාවක් වෙත එය ලබාදිම හෝ සිදුකර නොමැති බවත් දන්වා ඇත. ඒ අතර 2025.11.25 දිනැති ලිපිය මගින් රත්නපුර මහ නගර සභාවේ නගරාධිපතිතුමා විසින් හදිසි අවශ්‍යතාවකදී ප්‍රයෝජනයට ගැනීම සඳහා මෝටර් බෝට්ටුවක් ඉල්ලා ඇත. මේවන විට මෙකේ මෝටරය ගලවලා ගබඩාවේ තියෙනවා. බෝට්ටුව දිරණවා. නිශ්කාර්යයි. මේක ඵලදායි ලෙස භාවිතයට ගන්න බෑ. 2025.12.12 කාර්මික කමිටුවේ තීරණ අංක 01 අනුව කුරුවිට ප්‍රාදේශීය සභාව සතු මෝටර් බෝට්ටුව නිශ්කාර්යව පවතින බැවින් රත්නපුර මහනගර සභාවේ ගරු නගරාධිපතිතුමාගේ ඉල්ලීම පරිදි එම බෝට්ටුව රත්නපුර මහ නගර සභාව වෙත ලබාදීම සුදුසු බව නිර්දේශ කරලා.

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

නගර සභාවට දෙන එක හොඳයි. නගර සභාවේ පිට්ටනියේ පැත්තක තියෙනවා තණකොළ කපන මැෂිමක්. නිදැල්ලේ. රත්නපුර නගර සභාවට කියලා ඒක හුවමාරුවක් කරගන්න පුළුවන් නම් හොඳයි. සුහද මාරුවක් වගේ බලමු.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

ඒ සම්බන්ධව විමසීමක් කරමු. මේ බෝට්ටුව රත්නපුර මහ නගර සභාව වෙත ලබාදිමට කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2025.12.12 කාර්මික කමිටුවේ තීරණ අංක 01 අනුව කුරුවිට ප්‍රාදේශීය සභාව සතු මෝටර් බෝට්ටුව නිශ්කාර්යව පවතින බැවින් රත්නපුර මහනගර සභාවේ ගරු නගරාධිපතිතුමාගේ

ඉල්ලීම පරිදි එම බෝට්ටුව රත්නපුර මහ නගර සභාව වෙත ලබාදීම සම්බන්ධව මහාසභා අනුමැතිය ලබාදීම ට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 68.** කිරිඇල්ල වෙළඳ සංකීර්ණයේ තාවකාලික කඩ වෙනුවට ලබාදී ඇති අංක 4/5/6/7 දරණ කඩ කාමර සමග මෙතෙක් ගිවිසුම්ගතවී නොමැති බැවින් ඒ සඳහා බදු කුලී අයකිරිමට නොහැකිව් ඇති හෙයින් එම කඩ කාමර අතුරින් අංක 6 කඩකාමරය සඳහා හිමිකරු සමග ගිවිසුම් ගත වීමටත්, අංක 4,5 කඩ හිමිකරු මියගොස් ඇති නිසා ඔහුගේ උරුම කරුවන් හට එම කඩ ගිවිසුම්ගතවී ලබා දීමටත් අංක 7 කඩයේ හිමිකරු සොයාගත නොහැකි බැවින් ඒ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීමටත් යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අංක 4,5,6,7 කඩකාමර වල 2022.11.29 දින කී මණී මුදල් ගෙවා තිබුනත් ගිවිසුම් ගත වෙලා නෑ. ගිවිසුම්ගත වෙලා නැති නිසා මේ වන තෙක් කඩකුලී අයකිරිමක්ද කර නෑ. අංක 6 කඩකාමරය සඳහා හිමිකරු සමග ගිවිසුම් ගත වීමටත්,අංක 4,5 කඩ හිමිකරු මියගොස් ඇති නිසා අනන්‍යතාවය තහවුරු කරගෙන ඔහුගේ උරුමකරුවන්ට දිය හැකියි. අංක 7 සම්බන්ධව ගැටළු තියෙනවා. හිමිකරුවෙක් ඉදිරිපත් වෙන්නේ නෑ. නමුත්

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -</u>

මේක භුක්ති වින්දේ අසංක මන්ත්‍රීතුමා. කඩ හතරම. මේ කඩෙත් භුක්ති වින්දේ ඒ අය තමා. මම හිතන්නේ අසංක මහතාගේ පියා මුදල් ගෙවලා ගන්න ඇති. නම වෙනස් කරන්න බැරි වෙන්න ඇති.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

මාකට් එකේ පළමු ගැණුම්කරු. අසංක කියන්නේ පුතා. ඒ ව්‍යාපාර තුනට අනන්‍යතාවය තහවුරුයි. ඒවා ගිවිසුම් අත්සන් කරන්න. හඳුනන්නේ නැති කෙනෙක් කී මණී ගෙවලා 7 කාමරයට. ඒ මුදල රාජ සන්තක වෙනවා. පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය අරන් ඉදිරි කටයුතු කරන්න.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -</u>

අර අයම තමා මේකටත් ගෙවලා තියෙන්නේ. අසාධාරණයක් නොවන ලෙස කටයුතු කරන්න.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා -</u>

සභාවත් වරදක් කරලා. ඒ වගේ කිසිත් නොදන්නා නමකට මුදල් අරන්. අසංක තමා ඒ කඩ කලේ. අසංක කාගේ හරි නමකින් ඒ කඩේ අරන්. කිරිඇල්ලේ උප කාර්යාලයෙන් අසංක යතුර භාර අරන් නෑ. මේ වෙලාවේ 7 කඩය එතුමාට දෙන්න නීත්‍යානුකූල බලයක් අපිට නෑ. නම ලක්ෂ ගානක් භාර අරන් තියෙන්නේ අපේ වරද ද? අන්‍යතාවය නැතිව අරන් බෑ. මුදල්. ආයේ මේ වගේ වරදවල් වෙන්න තියන්න එපා. මිහිපිට නැති කෙනෙක් ගෙන් මුදල් අරන්. තක්සේරු කැඳවලා නව තක්සේරු කරුවෙක් සොයමු. අතුරු බදු දෙන්න කාටවත් බෑ. කඩ ගත්ත අය කඩ විකුණලා. ඒ අය අහනවා සභාව එක්ක එකඟතාවට ඇවිත් ඒ අයට පවරාගන්න බැරිද කියලා. ඒකට සුදුසු ක්‍රමවේදයක් හදලා අළුතෙන් ගත්ත අයට සභාව එක්ක ගිවිසුම්ගත වෙලා හැකි නම් කරන්න. කිරිඇල්ල වෙළඳ සංකීර්ණයේ මූණත නඩ තියෙනවා. අනිත් පැත්තට තියෙන කඩ ප්‍රයිමරිය පිටිපස්සට තියෙන්නේ. ඒ කාලෙත් අපි විරුද්ධ උනා. කඩවල මූණත පිලිකන්නට තියෙන්නේ. ඒ අය අහනවා ඉස්සර තිබුණ විධිහට හදාගන්න බැරිද කියලා. මාකට් එකේ කඩ 10 න් කරන්නේ දෙකක් විතරයි. 7 කඩ කාමරයට මුදල් ගත්ත එක ගැන කණගාටුයි. අර තුන දෙන්න. ඉතිරි කඩේ ගැන විස්තර අරන් නීත්‍යානුකූලව කළ හැකි යමක් කරන්න.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

4,5,6, කඩවලට අසංක මුදල් බැඳලා. දේශපාලනයට එන්න පෙර සිටම කළ කඩ. ඉල්ලීමක් කලත් දැන් මුදලුත් නෑ. කඩත් නෑ. 7 කඩ කාමරයට මුදල් බැන්දාම හැඳුනුම්පතවත් බැළුවේ නැද්ද? කුවිතාන්සියේ නමක් දානවා විතරද?

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

කුරුගම්මෝදර, දොඩම්පෙ ජගත් ගුණවර්ධන කියන නමට බැඳලා තියෙන්නේ.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

නම ලක්ෂ ගානක්. විශාල මුදලක්. අසංකගේ තාත්තා වෙන්න ඇතිළු බැඳලා ඇත්තේ. අපිට නීතිමය ප්‍රශ්නයක්ද ඒ කඩෙත් ඒ අයට දීම. ඒ මුදල බැන්දේ ඒ අයමයි කිව්වොත් ඒ අයට දෙන්න බැරිද?

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

තවත් අය ඉදිරිපත් උනොත්.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>

ලදු පිටපත ඇති ගෙවපු අය ළඟ.සත්‍යලෙස ගෙවපු පුද්ගලයා ලග ඒක ඇති. ඉදිරිපත් කලොත් මානුෂීයව බලන්න. අසංක එක්ක කතා කලාද?

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

එතුමා දන්නේ නැතිළු. අපි 4,5.6 කඩ නිදහස් කරමු. ගිවිසුම්ගත වෙමු. 7 කඩකාමර යට කී මනි ගෙවලා තියෙන හිමිකරු මෙතෙක් සොයාගන්න බැරි උන නිසා ඒ කඩේ නැවත වෙන්දේසි කරන්න ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබාගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කිරිඇල්ල වෙළඳ සංකීර්ණයේ තාවකාලික කඩ වෙනුවට ලබාදී ඇති කඩ කාමර අංක 4/5/6/7 දරණ කඩ කාමර සඳහා කී මනි ගෙවා තිබුනත් එම කඩ හිමියන් සමඟ මෙතෙක් ගිවිසුම්ගතවී නොමැති බැවින් අංක 4,5 කඩ සඳහා කී මනි ගෙවා ඇති අය මිය ගොස් ඇති බැවින් ඔහුගේ උරුම කරුවෙකු සමඟද අංක 06 කඩ කාමරය වෙනුවෙන් කී මනි ගෙවා ඇති අය සමඟද පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රෙල්ඛ අංක 1/2023 කොන්දේසි අනුව උපරිම වසර 30ක කාලයකට යටත්ව ගිවිසුගත හැකි බැවින් මෙම කඩ හිමියන් සමඟද අවුරුදු 30 ක කාලයක් සඳහා ගිවිසුම් ගත විමටත්

අංක 7 කඩයේ කීමනි ගෙවා ඇති හිමිකරු මෙතෙක් සොයාගත නොහැකි වි ඇති බැවින් එම කඩය නැවත වෙන්දේසි කිරිමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබාගැනිමටත් මහා සභාවේ අනුමැතිය ලබාදීම ට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

06-69. 2025.11.21 දිනැති ව කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති කඩ කාමර කමිටුවේ වාර්තාව සඳහා මහා සභා අනුමැතිය ලබාදිම සම්බන්ධව තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -

අංක 3 තීරණය Q/17 සම්බන්ධව ඒ යටතේ එතුමාට අපි තැනක් දුන්නා.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

අපි බදුකරුව කැඳෙව්වත් එදින ආවේ පුතා. ආයෙත් දිනයක් ගෙන කැඳවනවා. මේ පුද්ගලයාට වෙනත් තැනකින් කඩකාමරයක් දීලා. නමුත් දෙමහල් ගොඩනැගිල්ලක් ඒ ස්ථානයේ හදලා. යන්න කිව්වාට යන්නේ නෑ. පොලිසියෙදි යනවා කිව්වත් පස්සේ නඩුවක් දාලා.ඒ කඩය අපිට දිය යුතුයි. ඒවාට සාධාරන මුදලක් ගෙවිය යුතුයි. සභාවේ අයිතිය පිලිගත යුතුයි. මේ සම්බන්ධව ඉදිරි කටයුතු කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අයි.කේ. රන්ජන් මහතා -</u>**

**කිරිඇල්ල වෙළඳ සංකීර්ණයේ පොදු වැසිකිළිය පොදුවේ ජනතාවට දීම විමසුවොත් නම් ඒ අය කැමති වෙන එකක් නෑ. බාහිර පාර්ශව එනවට කැමති නෑ.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**ඒ අයට වෙනම ක්‍රමවේදයක් හදලා පරික්ෂා කරලා බලලා දෙමු. ඒ අය කිව්වා කීප දෙනයි භාවිතා කරන්නේ කියලා.**

**අංක 08 යටතේ වන නඩුව පිලිබඳව නීතිඥ මහතා හමුවී තොරතුරු අරන් ඉදිරි කමිටුවකදි තීරණයක් ගමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව 2025.11.21 දිනැති ව කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති කඩ කාමර කමිටුවේ වාර්තාව සඳහා මහා සභා අනුමැතිය ලබාදිම සම්බන්ධව ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**07. කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරීම -**

**<u>07 - 01.2025.12.05 දිනැති මුදල් කමිටු වාර්තාව.</u>**

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>**

වාර්තාවේ අංක 1 ගෙවීම සම්බන්ධව මාසය දක්වලා නෑ. අංක 2,3,4 ගෙවීම් නඩු සම්බන්ධව. මාස දෙකකට විශාල මුදලක් දරලා. අපිට අධිහාර උනේ මාසයට රු. 25000.00 ක් ගෙවලා. මමනම් අධිහාරේ ගෙව්වා.

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

ඒම ගෙවීම් සම්බන්ධව දින සඳහන්. මේ බිල් අපිට එවන්නේ නීතිඥවරු කීපයක් එකතු කරලා

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>**

අපි සාධාරණ ක්‍රමවේදයකට ගෙව්වා. මෙතරම් මුදලක් වැය නලේ නෑ. මේ අධිහාරය තීන්දුකල කෙනාට මේ මුදල් ගෙවන්න කියන්න. ඒ ගත්ත තීන්දුව අපරාදේ. මේ ගෙවන එකට මම විරුද්ධයි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u> -

චමින්ද මහතා පෙනී සිටින නඩුව මොකක්ද? මහාධිකරණයේ නඩුවක්. සුදුසුකම් අවශ්‍යයි.

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

අළුත් නඩුවක් මාර්ගයක් සම්බන්ධව. ඒ නඩුවට ගත්ත නීතිඥයා. මෙතුමා අළුත් කෙනෙක්. සුදුසුකම් ඇති අයෙක්. අපි පරණ ලෝයර්ස්ලාගෙනුත් අහනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී  මංගල ඩයස් මහතා -**

රු. 5000.00 කියන්නේ සාමාන්‍ය ගාස්තුවක්. චමින්ද  කෝන්පිටිය  කියලා නීතිඥ තුමෙක්. ගාමිණී රත්නායක මහත්තයාත් හොඳයි.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -**

එක එක ක්ෂේත්‍ර බැළුවා. තොරතුරු ඇහුවා. සමහර මිළ ගනන් එක සමානයි. කලින් හදාගත්ත නම එක්ක ගන්න වෙන්නේ.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

නීතිඥ ගාස්තු ගෙවා පසු විපරම් කරන්න. ප්‍රගතිය බලන්න නඩු වල. නැත්නම් වියදම් කළ මුදලත් අපතේ. නඩු පිලිබඳ විමසා බලන්න. නීතිඥයින් එක්ක කතා කරන්න. මේ නීතිඥ ගාස්තු ගෙවීමේදි නීත්‍යානුකූලව සොයාබලලා ගෙවීම් කරන්න.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී   අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා -**

තීරණ අංක 07. අයවැය පොත් අටක් බඳින්න රු. 30000.00ක්.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -**

ඒ පොත් අට කලර් ප්‍රින්ට් බයින්ඩිං. ඒ මුදල හරි. සේරටම කලර් ප්‍රින්ට් ගත්තේ නෑ. මිළ වැඩියි එහෙම ගන්නකොට.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී    එච්.වී.මහින්ද මහතා -**

නඩුවල වර්තමාන තත්වය පිලිබඳ වාර්තා තියේද? මේ ගෙවීම් කිරීමේදි ලිඛිත සාක්ෂි ඉදිරිපත්කිරීම පහසු දෙයක්. නීතිඥයින්ට විශාල මුදලක්  ගෙවන්න ඕනි නෑ.  සාක්ෂි ඉදිරිපත් කරනවා විතරයි. පොඩි දෙයක් කරන්නේ. අඩු ගාස්තු යටතේ කරන්න පුළුවන්.

**2025.12.05   දිනැති මුදල් කමිටු වාර්තාව පිලිබඳව මහා සභාවේ සළකා බලන ලදී.**

07-  02.  2025. 12.12 දිනැති කාර්මික කමිටු වාර්තාව.

2025. 12.12 දිනැති කාර්මික කමිටු වාර්තාව  පිලිබඳව මහා සභාවේ සළකා බලන ලදී.

07   -03. 2025.12.12   දිනැති පරිසර හා පහසුකම් කමිටු වාර්තාව.

2025.12.12  දිනැති පරිසර හා පහසුකම් කමිටු වාර්තාව  පිලිබඳව මහා සභාවේ සළකා බලන ලදි.

07- 04.  2025.12.11 දිනැති කාන්තා හා ළමා කටයුතු පිලිබඳ කමිටු වාර්තාව.

2025.12.11 දිනැති කාන්තා හා ළමා කටයුතු පිලිබඳ කමිටු වාර්තාව පිලිබඳව මහා සභාවේ සළකා බලන ලදී.

**08 .  ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කල ආදායම් පිලිබඳ ප්‍රගති වාර්තා-**

**08-01. 2025 නොවැම්බර් මස ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව**

**2025 නොවැම්බර් මස ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව** පිලිබඳ කමිටු වාර්තාව පිලිබඳව මහා සභාවේ සළකා බලන ලදී.

**08-03. 2025 නොවැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය.**

**2025 නොවැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය** පිලිබඳ කමිටු වාර්තාව පිලිබඳව මහා සභාවේ සළකා බලන ලදී.

**08- 04. 2025 නොවැම්බර් මස ඒකාබද්ධ වැය සාරාංශය.**

**2025 නොවැම්බර් මස ඒකාබද්ධ වැය සාරාංශය** පිලිබඳව මහා සභාවේ සළකා බලන ලදී.

**09.** සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිණි නයනා ජීවනී අතුකෝරළ මිය</u>**

12.31 ට ව්‍යාපෘති කරලා ඉවරයි. මහා සභා අනුමැතිය ගන්නකොට මාසයක් විතර පරක්කුයි. ඒ මුදල් නිදහස් කරන්න කියලා ඉල්ලනවා.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u> -

ගෙවීම් කමිටුව මගින් කිරිම මහා සභාවට පහසුවක්. නමුත් සමහර කර්මාන්ත පිලිබඳව අපි පොදු තීන්දුවක් ගමු කටයුතු කරමු සර්ව සාධාරනව සභාව දැනුවත් කරලා කරන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -</u>**

මාසයක් බලා ඉන්න බෑ ගෙවීම් කරන්න. මුදල්කමිටුව ආවරණ අනුමැතිය යටතේ ගෙවීම් කරන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

ප්‍රායෝගිකව ඒ මුදල හෝ දාන්න බැරිද සභාවට. ඒ ව්‍යාපෘතිය කරන තෙක්. කරන්න පෙරත් දමනවා. බැරිවෙලා හරි මුදල් කමිටුව නිර්දේශ කරන දේ මහා සභාව අනුමත නොකලොත්?ගෙවන්නේ කොහොමද? මහා සභාව බෑ කිව්වොත් කමිටුව භාරගත යුතුයි.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -</u>**

මුදල් කමිටුව ඒවා වගකීමෙන් කරන්නේ. හොඳට බලලා නිර්දේශ දෙන්නේ. කාර්මික නිලධාරි වාර්තා ආදි සියල්ල බලනවා. රැඳවුම් මුදල් මහා සභාවට එන්න ඕනි.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>**

සියළු වගකීම් එලෙස නෑ. එක් සාමාජිකයෙක් හෝ වරදක් පෙන්නලා දුන්නොත් පිලිගත යුතුයි.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -</u>**

එක එක විධිහට කමිටු කටයුතු කරන්න බෑ. වගකීම නිසි ලෙස ඉටුකරන්න ඕනි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

කමිටුවලට කටයුතු කිරීමේදී නීත්‍යානුකූලව මෙන්ම ප්‍රායෝගිකව තත්ව වලට මුහුණ දීමට සිදු වෙනවා. නිකම් මුදල් ගෙවනනේ නෑ. අධ්‍යයනය කරලා ක්‍රමවේදයක් ඇතිව කරමු. එක් අයෙක් විරුද්ධ උනොත් බෑ.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා -**

විශේෂ ඉල්ලීමක්. මන්ත්‍රීලාගේ යෝජනා ප්‍රජා කටයුතු පිලිබඳව ඒ ආයතන වලට යොමුකරද්දි පිටපතක් මන්ත්‍රීටත් යොමු කරන්න. උදාහරන රෝහළට විශේෂඥ වෛද්‍ය සේවාව ගැනීමේදි ඒ මන්ත්‍රීට පිටපතක් දාන්න. පොදු සුසානභූමි කටයුතු වලදි ඒ අනුව කටයුතු කරන්න. කිරිඇල්ල මැණලා පතලුත් කපලා. පත්තරේත් ගියා. ඒ ඒ කටයුතු වලට අදාලව තියෙන සියළු ආයතනත් දැනුවත් කරන්න.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -**

බෝපත් ඇල්ල රථගාල ටෙන්ඩර් කරලා දැනුවත් නැලු. ජනතාව. ප්‍රසම්පාදනයෙන් රු. 100 ක් වැඩිපුර දාලා. මේ ක්‍රමවේදය ප්‍රසිද්ද වෙලා නෑ. ඕනම දේකට සම්මතයක් තියෙනවා.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

ඒක පත්තරේ දාලා සභාවටත් දාලා නීත්‍යානුකූලව කලේ. අන්තිමට එක්කකෙනයි දැම්මේ.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -**

පොදු වැසිකිලිය ගත්ත කෙනා අහම්බෙන් දැකලා තියෙන්නේ. 87000.00 ක් පාඩු ලබලා.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

අවසන් තීන්දුව ගත හැකියි. අවම මුදලට වඩා රු. 100 ක් මුදලක් දාලා. අපිට හැගෙනෙවා නම් ඊට වඩා වැඩිය දෙන්න හැකිනම් ඒක තමා කල යුත්තේ.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

ප්‍රියන්ත කිව්වා මාස තුනකට ආදායම රුපියල් ලක්ෂ හතක් විතර කියලා. මේ මුදලට පාඩුයි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -**

මෙතන මතයක් තියෙනවා විපක්ෂෙ අය විරුද්ධයි කියලා. එහෙම කතාවක් ගිහින්. පාඩු නැත්නම් අපිට කමක් නෑ.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මංගල ඩයස් මහතා -**

පත්තරේ දාලා මාළු කඩේ ටෙන්ඩර් කලාට ගියේ නෑ. කොලේ අලවලා තිබුනට පස්සේ ප්‍රසිද්ධ උනා. ඇල්ල දැන්වීම් ගහන්න බැරිඋනා. ඒ නිසා මිනිස්සු දනනේ නෑ. ප්‍රසිද්ධියේ නෝටිස් ගහලා වට්ස්ඇප් දැම්මා නම් යයි. ලන්සු වැඩි වෙයි. උත්සාහා කල හැකියි. සභාපතිතුමා තීරණයක් ගන්න.

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**මෙදිනට නියමිත මහා සභාවේ කටයුතු අවසන් . ගරු සභාපතිතුමා විසින් සභාවේ සියළු කටයුතු සඳහා සහාය දුන් සියළු ගරු මන්ත්‍රී තුමන්ලාට හා ගරු උප සභාපති තුමාට , මාධ්‍ය හිතවතුන්ට, කාර්ය මණ්ඩලයට ස්තූතිය පළ කරන ලදි.**

**මහා සභා රැස්වීමේ කටයුතු ප.ව. 5. 40 ට පමණ අවසන් කරන ලදී.**

එම්.විකසිත පුෂ්පසූරිය ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට

පිටපත් : -

01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී